


# වාර්ෂික වාර්තාව - 2021

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

# පටුන


කෙටි යෙදුම් ලේඛනය ..... 1

**(01) ආයතනික පැතිකඩ ..... 2**

1.1 ආයතනික තොරතුරු ..... 2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, මූලික අගයන් සහ ප්‍රධාන අරමුණු ..... 3

1.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයින් පිළිබඳ තොරතුරු– 2021 ..... 5

1.4 ආයතනයේ සැකැස්ම හා කාර්යයන් ..... 6

1.5 ආයතනික ව්‍යුහය ..... 7

1.6 මණ්ඩලයේ ප්‍රධාන අංශ ..... 8

**(02) කළමනාකරණ සමාලෝචනය සභාපතිතුමන්ගේ සමාලෝචනය ..... 9**

**(03) කාර්ය සාධනය ..... 13**

3.1 කර්මාන්ත සංවර්ධනයට පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය - හම්බන්තොට ..... 14

3.2 වාත්තු කර්මාන්තය නවෝත්පාදනයන් වෙත යොමුවීම ..... 15

3.3 පන්නල කර්මාන්තපුරයේ II අදියරේ මෙහෙයුම් ඇරඹේ ..... 16

3.4 කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ..... 16

3.5 දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් ජාතික වැඩසටහන ..... 17

3.6 අනෙකුත් විශේෂ වැඩසටහන් / ව්‍යාපෘති ..... 18

3.7 භෞතික ප්‍රගතිය – 2021 ..... 19

3.8 වසර 2022 සඳහා අනාගත සැලසුම් ..... 20

**(04) මෙහෙයුම් සමාලෝචනය ..... 22**

4.1 ප්‍රාදේශීය සංවර්ධන අංශය ..... 23

4.2 පරිපාලන අංශය ..... 27

4.3 ඉංජිනේරු අංශය ..... 31

4.4 කාර්මික ජනපද අංශය ..... 38

4.5 තාක්ෂණික සේවා අංශය ..... 46

4.6 ක්‍රම සම්පාදන අංශය ..... 52

4.7 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය ..... 56

4.8 අලෙවි අංශය ..... 61

4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය ..... 66

4.10 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය ..... 71

**(05) මූල්‍ය සමාලෝචනය ..... 76**

5.1 විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ..... 78

5.2 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය ..... 79

5.3 හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය ..... 80

5.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය ..... 81

5.5 වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ..... 82

**(06) මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිගේ සමාලෝචනය ..... 109**

# කෙටි යෙදුම් ලේඛනය

| | | |
|---|---|---|
| AD | - | පරිපාලන අංශය |
| ADB | - | ආසියානු සංවර්ධන බැංකුව |
| ATRDC | - | යෝග්‍යතා තාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය |
| BPVB | - | ලංකා බොයිලර් සහ පීඩන යන්ත්‍ර මණ්ඩලය |
| BSC | - | පිත්තල භාණ්ඩ සේවා මධ්‍ය ස්ථානය |
| CDLPF | - | සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය |
| CECB | - | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය |
| CEDACS | - | ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශන සේවා මධ්‍යස්ථානය |
| CNC | - | පරිගණක සංඛ්‍යාත්මක පාලනය |
| CSC | - | පොදු සේවා මධ්‍යස්ථානය |
| CTB | - | ලංකා ගමනාගමන මණ්ඩලය |
| DS | - | ප්‍රාදේශීය ලේකම් |
| ED | - | ඉංජිනේරු අංශය |
| E-commerce | - | ඉලෙක්ට්‍රොනික වාණිජ්‍යය |
| EPC | - | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය |
| FD | - | මුදල් අංශය |
| GDP | - | දළ දේශීය නිෂ්පාදනය |
| HODs | - | අංශ ප්‍රධානීන් |
| HRD | - | මානව සම්පත් සංවර්ධනය |
| HRM | - | මානව සම්පත් කළමනාකරණය |
| ICT | - | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය |
| IDB | - | කාර්මික සංවර්ධන මණ්ඩලය |
| IED | - | කාර්මික ජනපද අංශය |
| ILO | - | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| ISO | - | ජත්‍යන්තර ප්‍රමිති සංවිධානය |
| IT | - | තොරතුරු තාක්ෂණය |
| JCEC | - | ආර්ථික සහයෝගිතා සඳහා ඉරාන ඒකාබද්ධ කොමිසම |
| JICA | - | ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය |
| KPIs | - | ප්‍රධාන කාර්ය සාධන දර්ශක |
| Ltd | - | සීමාසහිත |
| MD | - | අලෙවි අංශය |
| MFIF | - | මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරක උදුන |
| MOU | - | අවබෝධතා ගිවිසුම |
| MSMEs | - | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර |
| MT | | මෙට්‍රික් ටොන් |
| NAITA | - | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය |
| NBT | - | ජාතිය ගොඩනැගීමේ බදු |
| NMRA | - | ජාතික ඖෂධ නියාමන අධිකාරිය |
| NVQ | - | ජාතික වෘත්තීය සුදුසුකම් |
| OEM | - | මුල් උපකරණ නිෂ්පාදකයා |
| OG | - | දැනට ක්‍රියාත්මකව පවතින |
| PD | - | සැලසුම් අංශය |
| PPP | - | පුද්ගලික පොදු හවුල්කාරිත්වය |
| RDD | - | ප්‍රාදේශීය සංවර්ධන අංශය |
| RPDSC | - | රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය |
| R&D | - | පර්යේෂණ සහ සංවර්ධන |
| SCX | - | උපකොන්ත්‍රාත් හුවමාරුව |
| SDG | - | තිරසාර සංවර්ධන ඉලක්ක |
| SEM | - | සෙවුම් යන්ත්‍ර අලෙවිකරණය |
| SEO | - | සෙවුම් යන්ත්‍ර ප්‍රශස්තකරණය |
| SL | - | ශ්‍රී ලංකාව |
| SLS | - | ශ්‍රී ලංකා ප්‍රමිතිකරණය |
| SLSI | - | ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය |
| SMEs | - | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් |
| SMIs | - | කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් |
| SoP | - | උසස්වීම් යෝජනා ක්‍රමය |
| SoR | - | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය |
| TSD | - | තාක්ෂණික සේවා අංශය |
| UNIDO | - | එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය |
| UNOPS | - | ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලය |
| USAID | - | ජාත්‍යන්තර සංවර්ධනය සඳහා එක්සත් ජනපද නියෝජිතායතනය |
| Vat | - | එකතු කළ අගය මත බදු |
| We-Fi | - | කාන්තා ව්‍යවසායනයින්ගේ මූල්‍ය මුලපිරීම |
| WHO | - | ලෝක සෞඛ්‍ය සංවිධානය |


# (01) ආයතනික පැතිකඩ

## 1.1 ආයතනික තොරතුරු

| | | |
|---|---|---|
| ආයතනයේ නම | : | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය |
| ලිපිනය | : | නො. 165, ගාලුපාර, කටුබැද්ද, මොරටුව |
| ලියාපදිංචි කිරීම | : | 1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනත |
| නෛතික බැඳීම | : | ව්‍යවස්ථාපිත මණ්ඩලය |
| අමාත්‍යාංශය | : | කර්මාන්ත අමාත්‍යාංශය |
| දුරකථන අංකය | : | 0112605111 |
| ෆැක්ස් අංකය | : | 0112605111 |
| ඊමේල් | : | dg@idb.gov.lk |
| වෙබ් අඩවිය | : | www.idb.lk |

කාර්මික සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත අංශයේ නියැලී සිටින ආයතන ප්‍රවර්ධනය කිරීම සඳහා කර්මාන්තකරුවන්ට අවශ්‍ය මූල්‍ය, තාක්ෂණික හා පරිපාලනමය ආධාර සැපයීමට කටයුතු කරන අතරම රටේ කාර්මික අංශයේ සංවර්ධනය පිළිබඳ වගකීම පැවරී ඇති ප්‍රධාන ආයතනය වේ. මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රීලංකාවේ කර්මාන්ත ප්‍රවර්ධනය, සංවර්ධනය හා දිරිගැන්වීමයි. අප ආයතනය වර්තමානයේ රටේ ආර්ථිකයේ පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සියලුම ව්‍යාපාරවල නිසි සම්බන්ධීකරණය හා අන්තර් සම්බන්ධිත වර්ධනයට සහාය වීම සඳහා විවිධ සේවාවන් සපයයි. එපමණක් නොව ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝගී කරගැනීමේ අරමුණින් අන්තර්ජාතික වෙළඳ ක්ෂේත්‍රයේ දේශීය කාර්මික නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීමහා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන කාර්මික සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ඕනෑම ආයතනයකට අවශ්‍ය සේවාවන් හා පහසුකම් සැපයීම ද සිදු කරයි. පසුගිය වසර 50ක කාලය තුළ පැවති ආණ්ඩු වෙනස්වීම් සමඟ අමාත්‍යාංශ කිහිපයක් යටතේ ක්‍රියාත්මක වූ කාර්මික සංවර්ධන මණ්ඩලය වර්තමානයේදී කර්මාන්ත අමාත්‍යාංශයේ පරිපාලන විෂය පථය යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, මූලික අගයන් සහ ප්‍රධාන අරමුණු



**දැක්ම**

*ශ්‍රී ලංකාව පුරා ඇති සියලුම කර්මාන්ත සංවර්ධනය කිරීම*

**මෙහෙවර**

*සමස්ත ශ්‍රී ලංකාව පුරා ඇති කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායික, තාක්ෂණික සහ වාණිජමය පදනම සපයා දීම.*

**මූලික අගයන්**

- පාරිභෝගික සේවා:

"පාරිභෝගිකයා සතුටින් තබා ගැනීම"

- වගවීම සහ අඛණ්ඩතාව:

"ක්‍රියාවකට කැපවීම, වගකිව යුතු වීම සහ අවංකකම"

- ඉගෙනීම සහ සංවර්ධනය:

"විධා හොඳ කාර්ය සාධනයක් සඳහා සේවකයාගේ කුසලතා, දැනුම සහ නිපුණතාවය වැඩි දියුණු කිරීම"

- කණ්ඩායම් වැඩ:


"පොදු ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සාමූහික උත්සාහය"

## ප්‍රධාන අරමුණු

1969 අංක 36 දරණ කාර්මික සංවර්ධන පනතේ අර්ථ දක්වා ඇති මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිගැන්වීම, ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා සහාය වීම.
- රටේ ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සියලු කාර්මික ආයතනවල නිසි සම්බන්ධීකරණය හා අන්තර් සම්බන්ධිත වර්ධනයට සහාය වීම.
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් උපයෝගී කරගැනීම, කර්මාන්තවල භාවිතා වන තාක්ෂණික ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම සහ දේශීය කර්මාන්ත සඳහා සුදුසු තාක්ෂණය හා උපකරණ සංවර්ධනය කිරීම සහ අපද්‍රව්‍ය වඩා හොඳින් භාවිතා කිරීම සඳහා ක්‍රියාවලි සහ ක්‍රමවේදයන් සොයා ගැනීම යන අරමුණු පෙරදැරිව කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.
- දේශීය කාර්මික නිෂ්පාදන විදේශීය වෙළඳපොළට අපනයනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- කර්මාන්ත සංවර්ධනයට අවශ්‍ය හෝ හිතකර වන පරිදි ජාත්‍යන්තර වෙළඳාම සහ කලාපීය සහයෝගීතාව යන ක්ෂේත්‍රවල ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා සහාය වීම.
- ප්‍රාග්ධන, ණය, අලෙවිකරණ, කළමනාකරණ, තාක්ෂණික පහසුකම් සහ නීති උපදෙස් ලබාදීම ද ඇතුළුව ශ්‍රී ලංකාවේ ඇති කවර හෝ කාර්මික ආයතනයට හෝ ව්‍යාපාරයකට සම්බන්ධව හෝ ඊට අදාළව අවශ්‍ය වන සෑම ආකාරයකම සේවා සහ පහසුකම් සැපයීම.

**කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යයභාරය**



## 1.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයින් පිළිබඳ තොරතුරු– 2021

| # | නම | තනතුර | ආයතනය | කාලපරිච්ඡේදය | |
|---|---|---|---|---|---|
| | | | | පත්වීමේ දිනය | පත්වීමේ අවසන් දිනය |
| 01. | උපසේන දිසානායක මහතා | සභාපති | කාර්මික සංවර්ධන මණ්ඩලය | 01.01.2020 | 24.03.2022 |
| 02. | චතුර මොහොට්ටිගෙදර මහතා | මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික | මුදල් අමාත්‍යාශය | 27.01.2021 | 24.03.2022 |
| 03. | කේ.ජී.ආර්.ජී.ආර්. වික්‍රමවර්ධන මහතා | මණ්ඩලයෙහි නිලබලයෙන් පත්වන සාමාජික | ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව | 28.08.2020 | 24.03.2022 |
| 04. | ආලෝක එන්. වහලවත්ත මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 01.01.2020 | 24.03.2022 |
| 05. | ආචාර්ය සරත් බුද්ධදාස මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 01.01.2020 | 24.06.2021 |
| 06. | ඒ.ඒ.එන්. බුද්ධික විමලසිරි මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 01.01.2020 | 24.03.2022 |
| 07. | එම්.ආර්. විමල් ජයවර්ධන මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 01.01.2020 | 24.03.2022 |
| 08. | එච්.ආර්.පී. පීරිස් මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 01.01.2020 | 24.03.2022 |
| 09. | කේ. අතුල හපුතන්ත්‍රි මහතා | මණ්ඩලයෙහි සාමාජික | - | 15.12.2021 | 24.03.2022 |
| 10. | එන්. ජී. පන්ඩිතරත්න මහතා | මණ්ඩලයේ නිරීක්ෂක | කර්මාන්ත අමාත්‍යාශය | 22.01.2021 | 24.03.2022 |

## 1.4 ආයතනයේ සැකැස්ම හා කාර්යයන්

කළමනාකරණ පුහුණුව සහ උපදේශන සේවා

ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ සේවාවන්

කර්මාන්තකරුවන්, සේවාදායකයින් සහ කාර්මික සංවර්ධන මණ්ඩල කාර්ය මණ්ඩලය ආදීන් වෙත කාර්මික තොරතුරු බෙදා හැරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අනාගත ව්‍යවසායකයින් වර්තමානයේ වැදගත්කමක් උසුලන ව්‍යාපාරික ක්ෂේත්‍ර පිළිබඳව දැනුවත් කිරීම


## කාර්මික සංවර්ධන මණ්ඩලය කර්මාන්ත සඳහා සපයා දෙනු ලබන ප්‍රධාන සේවා සහ පහසුකම්

කර්මාන්ත ප්‍රවර්ධනය හා සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම

ලෝහ ඉවතලන කොටස් ප්‍රතිචක්‍රීකරණය කිරීමට සහ ලෝහ ආනයනය අඩු කිරීමට දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු පහසුකම් සංවර්ධනය කිරීම සහ තාක්ෂණික සේවා

අදාළ ආයතනවලින් අරමුදල් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ ඒ සඳහා අනුමැතිය ලබාගැනීම

## 1.5 ආයතනික ව්‍යුහය



## 1.6 මණ්ඩලයේ ප්‍රධාන අංශ :-

| # | අංශයේ නම | | අංශ ප්‍රධානියාගේ නම |
|---|---|---|---|
| 01 | පරිපාලන අංශය(AD) | - | චමින්ද රාමසුන්දර මහතා |
| 02 | ප්‍රාදේශීය සංවර්ධන අංශය(RDD) | - | ජේ.එච්. හේමචන්ද්‍ර මහතා |
| 03 | සැලසුම් අංශය(PD) | - | එම්.එල්. කෝලිත සිල්වා මහතා |
| 04 | අලෙවි අංශය(MD) | - | එච්.එම්.එස්. සමරකෝන් මහතා |
| 05 | කාර්මික ජනපද අංශය(IED) | - | ඩබ්.ඒ. ලාල් ප්‍රියන්ත මහතා |
| 06 | ඉංජිනේරු අංශය(ED) | - | ඩබ්.ඒ.පී. කපිල නිශාන්ත මහතා |
| 07 | ව්‍යවසායකත්ව සංවර්ධන හා උපදේශන සේවා මධ්‍යස්ථානය(CEDACS) | - | ටී.එම්. කුමාර මහතා<br>(නියෝජ්‍ය අධ්‍යක්ෂ) |
| 08 | තාක්ෂණ සේවා අංශය(TSD) | - | මොහාන් ගුණසිංහ මහතා |
| 09 | මූල්‍ය අංශය(FD) | - | උපුල් අබේසූරිය මහතා |
| 10 | සම්භාණ්ඩ නිෂ්පාදන හා පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය(CDLPF) | - | අමරනාත් විමලසිංහ මහතා |
| 11 | රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය(RPDSC) | - | ටී.එස්. ඩී. සිල්වා මහතා<br>(නියෝජ්‍ය අධ්‍යක්ෂ) |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සියලුම අංශ විසින් සිදු කරනු ලබන කාර්යයන් මෙහෙයුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ වර්ගීකරණය කර ඇත. මෙහෙයුම් අංශ වන්නේ සැලසුම්, පරිපාලන සහ මූල්‍ය අංශ වන අතරඅනෙකුත් අංශ මණ්ඩලයේ සංවර්ධන කටයුතු සිදු කරනු ලබයි. කාර්යයාල 25ක් සහිත දිස්ත්‍රික් කාර්යයාල ජාලය ප්‍රාදේශීය සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන අතර, කාර්මික ජනපද 16 කාර්මික ජනපද අංශය යටතේ ක්‍රියාත්මක වේ. දේශීය ව්‍යවසායකයින්ට නිෂ්පාදන හාක්‍රියාවලි සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම සහ දැනුම හුවමාරු කිරීම සම්බන්ධයෙන් ඉංජිනේරු සහ තාක්ෂණික සේවා අංශ මැදිහත්ව කටයුතු කරනු ලබයි.

# (02) කළමනාකරණ සමාලෝචනය



# සභාපතිතුමන්ගේ සමාලෝචනය



දශක පහකට ආසන්න කාලයක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSMEs) ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා පිහිටුවන ලද ප්‍රමුඛ රාජ්‍ය සංවිධානයක් වන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ, (IDB) 2021 මූල්‍ය වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තාව මඟින් ඔබ ආමන්ත්‍රණය කිරීමට ලැබීම මම මහත් ගෞරවයක් කොට සලකමි.

මෙම වසර තුළදී, අපට පෙර නොවූ විරූ අභියෝග රැසකට මුහුණ දීමට සිදු වූ නමුත්, එම සෑම අභියෝගයක්ම මහත් වූ ඉවසීමකින් ආදර්ශමත්ව හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට අපට හැකියාව ලැබිණි. පසුගිය කාලපරිච්ඡේදය තුළ විශේෂයෙන් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අප ආයතනයේ කාර්යයභාරයන් ඉටුකිරීමේදී විවිධ බාධකයන් පසු කිරීමට සිදුවූ අතර, එය මහත්වූ දුෂ්කර කාලසීමාවක් විය. සියලු බාධක මහඟරවාලමින් අමාත්‍යාංශයේ සහය හා මඟපෙන්වීම ඇතිව පාරිභෝගික සේවාවන් වල ගුණාත්මකභාවය ඉහළ නංවමින් රට නැවත යථාතත්වයට පරිවර්තනය කරගැනීම උදෙසා කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය සහය ලබා දීම වෙනුවෙන් අප ආයතනය බොහෝ වැඩසටහන් සහ ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී. තවද ව්‍යාපෘති සඳහා ලබා දී ඇති අමාත්‍යාංශ අරමුදල් භාවිතා කිරීමේදී උපායමාර්ගික පදනමින් විනයානුකූල පිරිවැය කළමනාකරණ ක්‍රමවේදයක් භාවිතා කරන ලද අතර ආයතනයේ අනාගත වර්ධනය සහ ලාභදායිත්වය සඳහා අරමුදල් උපයෝගී කරගන්නා පදනම පිළිබඳව ද අවධානය යොමු කරන ලදී.

ක්‍රියාකාරී සැලැස්ම හරහා භාවිතා කරන උපාය මාර්ග නවීකරණය කිරීම සහ යාවත්කාලීන කිරීම මගින් ආයතනයේ අංශ වල මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම කෙරෙහි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කටයුතු කොට තිබේ. මේ සියලු උත්සහයන් දියත් කරනු ලබන්නේ අපගේ වටිනා කර්මාන්තකරුවන්ගේ ජාලයට හැකි උපරිම සේවාවන් ලබාදීමට සහ සමස්තයක් ලෙස මුළු මහත් රටටම ශක්තිමත් ඉපැයීමක් ලබා ගැනීමේ උත්සාහයේ කොටසක් වශයෙනි. අපගේ මෙම මූල්‍ය වර්ෂය තුළ අත්කරගත් සාර්ථකත්වයන්ට ප්‍රධානව නිසි අධීක්ෂණයක් සහිතව වියදම් පාලනය කිරීම හේතු වූ අතර ඒ තුළින් සියලුම සේවා කාණ්ඩ වලට අනුකූල වන කාලීන පුහුණු වැඩසටහන් සැපයීම සහ ව්‍යවසායකයින් සඳහා සෘජු මූල්‍ය ආධාර සැපයීමෙන් නිසි පාරිභෝගික වටිනාකම් පිරිනැමීමට හැකි විය. වර්තමානය වන විට ලෝකය දේශපාලනිකව, සමාජීයව, තාක්ෂණිකව සහ ආර්ථිකව බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් වෙනස් වෙමින් පවතින බැවින් වරක් සලකා බැලූ සහ නිවැරදි යැයි සිතූ ව්‍යාපෘති පිළිබඳ තීරණ තවදුරටත් අනපේක්ෂිත ලෙස අභියෝගයට ලක් විය.

2021 වර්ෂය පුරාවට, රට තුළ පවතින සමස්ත කර්මාන්ත ජාලය ආවරණය කරමින් ශක්තිමත් කාර්මික සංස්කෘතියක් පවත්වාගෙන යාමට සහ ව්‍යාප්ත කිරීමට මණ්ඩලය මහත් වූ කැපවීමෙන් වෙහෙස මහන්සි වී වැඩ කටයුතු කළේය. විශේෂයෙන්ම, මණ්ඩලය සිය කාර්යයන් හි ඵලදායීතාව ඇගයීම සිදුකරනු ලබන්නේ නිත්‍ය ඇගයීම, ව්‍යාපෘති සංවර්ධනය, ක්‍රියාවලි සහ භාවිතයන් වැඩිදියුණු කිරීම ඇතුළු විවිධ ක්‍රමවේදයන් යොදා ගැනීම තුළින් ය. මීට අමතරව, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති අතුරින් මණ්ඩලය යටතේ පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම, නවීකරණය කිරීම සහ ආහාර රසායනාගාරයේ මෙන්ම ගම්මාන සංවර්ධන වැඩසටහනෙහි වැඩකටයුතු ද වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව සංවිධානය කරන ලදී. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය වත්මන් වසරේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා උපාය මාර්ගික සැලසුම් නව්‍යකරණය කරමින් මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර තවදුරටත් අනාගතයේදී ද අපේක්ෂිත පරිදි ආයතනික ප්‍රගතිය අත්කරගැනීම උදෙසා දිගු කාලීන සැලසුම් සකස් කරනු ලැබේ. අපගේ ප්‍රයත්නයන්

පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විග්‍රහයක් මෙම වාර්තාවේ මෙහෙයුම් සමාලෝචනය පරිච්ඡේදය ඔස්සේ විස්තරාත්මකව සඳහන් කර ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හට ඉහළම සේවාවක්, විනිවිදභාවයෙන් යුක්තව ගෞරවාන්විතව ලබාදීමට ස්ථාපිත කර ඇති අප ආයතනය කෙරෙහි ඔවුන් තබා ඇති විශ්වාසය අපි සැබවින්ම අගය කරන අතර ඉදිරියටත් ඔවුන් සමඟ දිගුකාලීන නොබිඳෙන සබඳතාවක් පවත්වා ගැනීමට බලාපොරොත්තු වෙමු.

අවසාන වශයෙන්, මණ්ඩලය වෙනුවෙන් කර්මාන්ත අමාත්‍ය ගරු විමල් වීරවංශ මහතාගේ අවංක කැපවීම, මගපෙන්වීම සහ අපගේ උත්සාහය බුද්ධිමත් යථාර්ථයක් බවට පත් කිරීමට අපට ලබා දුන් සහාය වෙනුවෙන් කෘතවේදීත්වය එලකරන අතර මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ මණ්ඩලයේ සමස්ත දැක්ම ළඟා කරගැනීම උදෙසා වෙහෙස මහන්සි වී කැපවීමෙන් සම්බන්ධ වුණු අපගේ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලීය කාර්ය මණ්ඩලය වෙත ස්තූති කිරීමට ද මම මෙම අවස්ථාව යොදා ගනිමි.

**උපසේන දිසානායක**
**සභාපති**

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය



කොවිඩ් 19 වසංගතයෙන් බොහෝ දුරට විනාශයට පත් වූ දේශීය කර්මාන්ත බොහොමයක් සඳහා 2021 වසර සැනසිලිදායක වසරක් වූ අතර, එබැවින් ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන වඩාත් හිතකර වන පරිදි ඔවුන්ගේ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා එය "ප්‍රතිරෝධී වසරක්" ලෙස සැලකිය හැකිය. දුෂ්කර හා අසීරු කාලවලදී දේශීය කර්මාන්ත රඳවා තබා ගැනීම පිළිබඳව ගරු කරන අතරම, වසංගත කාල පරිච්ඡේදය පුරාවටම ශ්‍රී ලාංකේය කර්මාන්ත සමඟ අත්වැල් බැඳගනිමින් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් ගන්නා ලද ප්‍රයත්නයන් සම්බන්ධයෙන් අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙමි. බොහෝ ආයතනවලට මෙන්ම, කාර්මික සංවර්ධන මණ්ඩලයටද අනපේක්ෂිත කර්මාන්ත අවශ්‍යතා සහ අභියෝග සමඟ සමපාත වෙමින් කර්මාන්ත වෙත සේවා සැපයීමේදී ආයතනික උපාය මාර්ග ප්‍රතිනිර්වචනය කිරීම තෝරා ගැනීමට සිදු විය.

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් මෝටර් රථ උපාංග කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා සිය මැදිහත්වීම වැඩි දියුණු කර ඇත. මෙම විශේෂිත කර්මාන්ත අංශයේ ඇති සුවිශාල විභවය සැලකිල්ලට ගනිමින්, මෙම වසරේ ජනවාරි මාසයේදී මෝටර් රථ කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් පටිපාටි සඳහා ජාතික අත්පොතක් ප්‍රකාශයට පත් කිරීමට අමාත්‍යාංශයට හැකි විය. ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අංශය ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය මෝටර් රථ උපාංග නිෂ්පාදකයින්ට සහ මෝටර් රථ එකලස් කිරීමේ සමාගම්වලට දේශීය නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම ඉහළ නැංවීමට සහ මුල් උපකරණ නිෂ්පාදක (OEM) ප්‍රමිතීන්ට සමගාමීව ඉහළ මට්ටමේ ප්‍රමිතීන් සහතික කිරීමට පූර්ණ සහාය ලබා දී ඇත. පන්නල කාර්මික ජනපදයේ දෙවන අදියර ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කෙරුණු අතර, එය අපනයනකරුවන්ට, විශේෂයෙන්ම ජාත්‍යන්තර ගුවන්තොටුපළට සමීප වීමේ සාපේක්ෂ වාසිය ලබා ගැනීමට මනා අවස්ථාවක් වනු ඇත.

ආනයන ආදේශක නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් තෝරාගත් භාණ්ඩ සඳහා රජය විසින් පනවා ඇති ආනයන සීමා කිරීම් සමඟින්, දේශීය භාණ්ඩවල අගය එකතු කිරීම් සහ තත්ත්ව වැඩිදියුණු කිරීම් දිරිගැන්වීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්යාල ජාලය සිය පුහුණු වැඩසටහන් සහ ප්‍රවර්ධන ව්‍යාපාර පෙළගස්වා ඇත. මෙම සංකල්පයට අනුකූලව, දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් තරඟකාරී දේශීය නිෂ්පාදන හඳුන්වාදීම සහ නිෂ්පාදනය කිරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය තාක්ෂණික සේවා වැඩසටහන් සිදු කරන ලදී. රබර් සහ සම්භාණ්ඩ නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථාන ඔවුන්ගේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම් සහ සේවාවන් අලුතින් ස්ථාපනය කර ඇති මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරණ උදුන සමඟ පෙළගස්වා ඇත. බොහෝ දේශීය ප්‍රමුඛතම ලෝහ වාත්තු නිෂ්පාදකයින්ට නායකත්වය ලබා දීම සඳහා ආදර්ශමත් වීමට ඉංජිනේරු වාත්තු අංශයට බලය ලබා දී ඇත. මෙය අනිවාර්යයෙන්ම දේශීය මෝටර් රථ උපාංග නිෂ්පාදකයින් ඇතුළු ලෝහ මත පදනම් වූ දේශීය නිෂ්පාදකයින් සඳහා මිණුම් සලකුණු සැකසීම සඳහා අනෙකුත් වැඩමුළු සහ අධි තාක්ෂණික පහසුකම් සමඟ අනුපූරක වූ ප්‍රධාන කර්මාන්ත අංශයක් වනු ඇත.

එසේම සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මහපෙන්වීම යටතේ අභියෝග රැසක් මධ්‍යයේ වුවද වසර සඳහා ධනාත්මක ආදායම් අගයක් වාර්තා කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය කටයුතු කර ඇත.
දූරදර්ශී නායකත්වය සහ ස්ථාවර කර්මාන්ත සංවාද වෙනුවෙන් කර්මාන්ත අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.
එසේම, ආයතනික කටයුතු සඳහා මගපෙන්වීම සහ පහසුකම් සැලසීම වෙනුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ කාර්ය මණ්ඩලයට මම ස්තුතිවන්ත වෙමි.

දේශීය කර්මාන්ත ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වීම සඳහා ලබා දුන් නායකත්වය සහ උපාය මාර්ගික මඟ පෙන්වීම පිළිබඳව කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂවරුන්ට ද මගේ කෘතඥතාව පළ කරමි. විනාශකාරී වසංගත ගැටළු හේතුවෙන් මුහුණ දුන් පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ වුවද ආයතනික මෙහෙයුම් වඩාත් සාර්ථක කර ගැනීමට කාර්මික සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම සහ කාර්ය මණ්ඩලය දක්වන ලද කැපවීම සහ උත්සාහයන් මම අතිශයින් අගය කරමි.

**ජී.එල්.යූ. රත්නමලල**
**අධ්‍යක්ෂ ජනරාල්**

# (03) කාර්ය සාධනය



## කාර්ය සාධනය – 2021

දැනට පවතින කොරෝනා වයිරස් රෝගී (COVID-19) වසංගතය හේතුවෙන් සාර්ව පරිසරයේ සහ වෙළඳපල හැසිරීමේ හදිසි වෙනස්කම් ඇති වී ඇති අතර, බොහෝ ව්‍යවසායන් COVID-19 වසංගතයෙන් පසු සිදුවන වෙනස්කම් වලට මුහුණ දීම සඳහා ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතීන් කඩිනමින් ප්‍රතිනිර්මාණය කරමින් පවතී.කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් COVID-19 හේතුවෙන් පුළුල් ව්‍යාපාරික බලපෑම් අත්විඳිමින් සිටී. ව්‍යවසායකයින් සහ ඔවුන්ගේ ව්‍යාපාර රටක ආර්ථිකයෙහි ප්‍රධාන එන්ජිමක් බඳු වේ.ඔවුන් ආර්ථික වර්ධනය සඳහා නව රැකියා සහ නවෝත්පාදන සඳහා අත්‍යවශ්‍ය මූලාශ්‍ර සපයයි.නැගී එන ආර්ථිකයන්හි විභව ව්‍යවසායකයින්ට තම අදහස් වෙළෙඳපොළට ගෙන ඒමට, නව රැකියා උත්පාදනය කිරීමට සහ දරිද්‍රතාවය අවම කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය සහාය වේ. තවද, දේශීය කර්මාන්ත විශේෂයෙන්ම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSMEs)සඳහා ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් උපාය මාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ප්‍රවර්ධනය, දිරිගැන්වීම සහ පහසුකම් සැලසීම මණ්ඩලයේ වගකීම වේ.ආර්ථිකයන් උත්තේජනය කිරීම සහ දහස් ගණනක ව්‍යවසායකයින්ගේ ජීවිත වැඩිදියුණු කරන නිෂ්පාදන සහ සේවා සැපයීම මඟින් පුළුල් සමාජ ප්‍රතිලාභ අත්කර දීමට ව්‍යවසායකයින් සමත් වේ.පවතින සම්පත් භාවිතා කරමින් මෙම නැගී එන අවස්ථා ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් IDB වසර පුරා උපාය මාර්ගිකව ඵලදායී ප්‍රතිපත්ති ක්‍රියාවට නංවා ඇත.

### 3.1 කර්මාන්ත සංවර්ධනයට පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය - හම්බන්තොට




*මූලාශ්‍රය : කාර්මිකසංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය*

කර්මාන්තකරුවන් වෙත පහසුකම් සැලසීමේ සුහුරු ක්‍රමවේදය (Smart One Stop Shop) අනුව ස්ථාපනය කළ පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් හම්බන්තොට වරාය පරිශ්‍රයේදී කර්මාන්ත අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත විය. මෙම අවස්ථාව සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් දයාරත්නායක මහතා, කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක මහතා ඇතුළු සම්භාවනීය අරාධිත අමුත්තන් රැසක් සහභාගි විය. මෑතකාලීනව කර්මාන්ත අංශයේ විශාල දියුණුවක් අත්කරගත් රටවල් වල පවතින එක් ස්ථානයක සිට කර්මාන්තකරුවන් වෙත පහසුකම් සැලසීමේ සුහුරු ක්‍රමවේදය (Smart One Stop Shop) සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. දකුණු පළාතේ දැනටමත් පවතින ගුවන් තොටුපොළ, වරාය සහ අධිවේගී මාර්ගපද්ධතිය ඇතුළු සංවර්ධිත යටිතල පහසුකම් ආශ්‍රිතව කර්මාන්ත කලාප කිහිපයක් මේ වන විට ස්ථාපනය කිරීමට කටයුතු කර ඇත. දිවයිනේ කර්මාන්ත කලාපවල ආයෝජනය සඳහා පැමිණෙන දෙස් විදෙස් ආයෝජකයන්ට කාර්යක්ෂමව අවශ්‍ය අනුමැතීන් ලබාදීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා හම්බන්තොට වරාය ආශ්‍රිතව, කර්මාන්ත අමාත්‍යාංශයේ

මෙහෙයවීම යටතේ එක් ස්ථානයක සිට පහසුකම් ලබාදීමේ සුහුරු ක්‍රමවේදය (Smart One Stop Shop) ස්ථාපනය කිරීම ආරම්භ කරන ලදී. මෙමඟින් කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුවට ඉමහත් පිටිවහලක් වන අතර එමඟින් දකුණු පළාතේ මෙන්ම රටේ සමස්ත කර්මාන්ත හා ආර්ථික දියුණුවට සක්‍රීයදායකත්වයක්ද ලබාදෙනු ලැබේ.

## 3.2 වාත්තු කර්මාන්තය නවෝත්පාදනයන් වෙත යොමුවීම




*මූලාශ්‍රය : කාර්මිකසංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය*

ඉංජිනේරු වාත්තු අංශයේ අළුතින් ස්ථාපනය කරන ලද Medium Frequency Induction Furnace විදුලි උණුකිරීම් උඳුන් වල නිළ වශයෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී CECB ආයතනයේද ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේද නොරොච්චෝල විදුලි බලාගාරයේද වාත්තු ඇණවුම් ඉටුකරලීම ආරම්භයක් ලෙස සිදු කරන ලදී. මෙම උණුකිරීම් සඳහා කි.ග්‍රෑ.300 හා කි.ග්‍රෑ. 500 ක ධාරිතාවෙන් යුත් විදුලි උණුකිරීම් පද්ධති දෙකක් High carbon steel, Maganese steel, stainless steel යන ලෝහයන් සඳහාද cast Iron හා Ductile cast Iron ලෝහයන් ද උණු කිරීමට භාවිතා කරන ලද අතර, එමඟින් රජයේ හා පෞද්ගලික ආයතනවල වාත්තු අවශ්‍යතාවයන් ඉටු කරලීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම ආනයනික වාත්තු භාණ්ඩ සීමා කර ගැනීමට හා දේශීය වාත්තුනිෂ්පාදන වැඩිකර ගැනීමටත් නිසි තාක්ෂණය වාත්තු කර්මාන්ත ක්ෂේත්‍රයට ලබා ගැනීමටත් අවස්ථාව උදා වී තිබේ.

## 3.3 පන්නල කර්මාන්තපුරයේ II අදියරේ මෙහෙයුම් ඇරඹීම




*මූලාශ්‍රය : කාර්මිකසංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය*

ගරු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති, උපදේශන දිසානායක, අධ්‍යක්ෂ ජනරාල් සහ මණ්ඩලයීය අනෙකුත් නිලධාරි මහතුන්ගේ සහභාගිත්වයෙන් පන්නල කාර්මික ජනපදයේ II අදියරේ ආරම්භ කරන පළමු කර්මාන්තය ලෙස අශෝක් මැෂිනරි (පුද්ගලික) සමාගමේ මුල්ගල් තැබීම සිදුකරන ලදි. මෙම බිම් කොටසේ වාත්තු ආශ්‍රිත (Metal crusher parts manufacturing products) නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජිත අතර, මේ සඳහා ආයෝජනය කරනු ලබන මුදල රුපියල් මිලියන 200ක් වේ. මෙම ව්‍යාපෘතිය ආනයන ආදේශිත කර්මාන්තයක් බැවින්, මෙමඟින් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් මිලියන 2.5ක විදේශ විනිමය ඉතිරිකර ගැනීමට හැකිවේ.

## 3.4 කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම



*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය*

කාර්මික සංවර්ධන මණ්ඩලය නවීන කුළුබඩු සැකසුම් කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කරදීම සඳහා උපදේශන සේවාවන් සැපයීම වෙනුවෙන් කුඩා වැවිලි බෝග වගා සංවර්ධන කර්මාන්ත හා ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුළුබඩු හා ඒ ආශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී .මිලියන 225 කට ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා අවශ්‍ය සියලුම තාක්ෂණික උපදේශන ලබාදීමට එහිදී කා.ම.ස. සභාපති උපසේන දිසානායක මහතා ගිවිසුම්ගත විය. කුළුබඩු හා ඒ අශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය වෙනුවෙන් එහි සභාපතිතුමිය කුමුදුනි ගුණසේකර මහත්මියද ගිවිසුම අත්සන් කරන ලදී. මෙම අවස්ථාව වර්ණවත් කරමින්, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැට් හා බුලත් ඇතුළු කුඩා වැවිලි බෝග වගා සංවර්ධන අශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් රොහාන් අභයරත්න, අතිරේක ලේකම් තිලකා ජයසුන්දර, අධ්‍යක්ෂ කරන් සිලුවටවල, කුළුබඩු හා ඒ අශ්‍රිත නිෂ්පාදන අලෙවි මණ්ඩලය වෙනුවෙන් ප්‍රධාන විධායක නිලධාරී මහේෂ් මහතා ද කාර්මික සංවර්ධන මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ ජෙනරාල් (ආවරණ) K.M.S.G. බණ්ඩාර මහතා, අධ්‍යක්ෂක ඉංජිනේරු කපිල නිශාන්ත මහතා ඇතුළු ඉංජිනේරු මහත්ම මහත්මීන් පිරිසක් සහභාගී වුහ.

## 3.5 දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් ජාතික වැඩසටහන



*මූලාශ්‍රය : කාර්මික සංවර්ධන මණ්ඩල මාධ්‍ය ඒකකය*

වත්මන් රජයේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ගරු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ සංකල්පයකට අනුව දැයට පුනරුදයක් කර්මාන්තයට ජීවයක් වැඩසටහන ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගරු සභාපතිතුමාගේ මඟපෙන්වීම හා උපදේශකත්වය යටතේ ප්‍රාදේශීය සංවර්ධන අංශයේ අධ්‍යක්ෂකතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වනුයේ කුඩා පරිමාණ ව්‍යවසාය සවිබල ගැන්වීම මඟින් එම ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන වල ගුණාත්මක බව වැඩිදියුණු කර ආර්ථික ශක්තිය ඉහළ නංවා නව රැකියා අවස්ථා ඇති කිරීමයි. මෙම වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ඇඟළුම් ක්ෂේත්‍රයේ කුඩා පරිමාණ ව්‍යවසායකයින් හට උපකරණ බෙදාදීම ගරු කර්මාන්ත අමාත්‍ය විමල් වීරවංශ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ගරු සභාපතිතුමාගේ සහ අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සහභාගීත්වයෙන් පාවහන් හා සම්භාණ්ඩ සංවර්ධන මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මෙහිදී ඇඟළුම් කර්මාන්තයට අවශ්‍ය යන්ත්‍රෝපකරණ 120 ක් පමණ ව්‍යවසායකයින් 19 දෙනෙකු සඳහා ලබාදෙන ලදි.

## 3.6 අනෙකුත් විශේෂ වැඩසටහන් / ව්‍යාපෘති


- UNIDO විසින් අරමුදල් සපයන උණ බම්බු පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය විවෘත කිරීම.
- ඉංජිනේරු වාත්තු අංශයේ ප්‍රේරක උදුන සවි කිරීම මඟින් තාක්ෂණිකව නවීකරණය කිරීම.
- දීර්ඝ කාලයක් ප්‍රමාද වී තිබූ පානළුව කර්මාන්තපුරයේ ඉඩම අත්පත් කර ගැනීම සිදු කිරීම.
- දේශීය සම් භාණ්ඩ නිෂ්පාදකයින්ට සහාය වීම සඳහා සම් භාණ්ඩ ප්‍රදර්ශනය දියත උයන පොළ ඇතුළුව දීප ව්‍යාප්තව පැවැත්විණි.
- කොවිඩ් 19 හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහය වීම සඳහා ගම්පහ, මහනුවර, කෑගල්ල, අනුරාධපුර, මාතර, ගාල්ල යන ස්ථානවල වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්විණි.
- දේශීය MSMEs සඳහා කර්මාන්ත නාමාවලිය සකස් කිරීමේ පළමු අදියර සම්පූර්ණ කරන ලදී.
- සුමට, කාර්යක්ෂම සහ විශ්වාසනීය මෙහෙයුම් සඳහා IDB හි ව්‍යවසාය සම්පත් සැලසුම් තොරතුරු පද්ධතිය ස්ථාපිත කරන ලදී.
- දේශීය ලෝහ කර්මාන්තවලට අබලි ලෝහ අපනයනය කිරීමේදී අධීක්ෂණය සහ අදාළ නිර්දේශ ලබා දීම සඳහා සහාය විය.
- කර්මාන්තකරුවන් සඳහා ණය පහසුකම් ලබාදීමට IDB මහජන බැංකුව සමඟ එක්ව කටයුතු කිරීම.
- ලෝහ අමුද්‍රව්‍ය සැපයීම මඟින් දේශීය ලෝහ මත පදනම් වූ නිෂ්පාදකයින් 250 දෙනෙකුට සහාය වීම.

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය, එහි ක්‍රියාකාරී අංශ සහ කලාපීය සැකසුම හරහා කාර්මික සංවර්ධනය සඳහා සේවා පැකේජයක් අඛණ්ඩව සැපයීමට කටයුතු කරන ලදී.එහිදී, නව ආයෝජන අවස්ථා හඳුනාගැනීම, ව්‍යාපෘති වාර්තා සහ ශක්‍යතා අධ්‍යයනයන් සැකසීම, කර්මාන්තපුරවල යටිතල පහසුකම් සැපයීම, සේවාලාභීන්ට සහය වීම, තාක්ෂණික හා තොරතුරු සේවා, තාක්ෂණික හුවමාරුව තුළින් ආයෝජන සහ කර්මාන්ත නිර්මාණය ප්‍රවර්ධනය කිරීම සඳහා විධිමත් වැඩසටහන් පැවැත්වීම, අලෙවිකරණඅවස්ථා හඳුනා ගැනීම සහ උප කොන්ත්‍රාත්තු කටයුතු සකස් කිරීම, රැකියා විරහිත උපාධිධාරීන්හට ව්‍යවසායකත්ව අවස්ථා ආරම්භ කිරීම ආදිය මණ්ඩලයට අයත්වන අනෙකුත් කාර්යයන් වේ.

## 3.7 භෞතික ප්‍රගතිය – 2021

**3.7.1 වගුව: දැනට ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය**

| අංකය | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| 01 | IDB හි කාර්මික ජනපද වල යටිතල පහසුකම් නැවත සක්‍රිය කිරීම සහ නවීකරණය කිරීම | 60 | 43.80 | 73 | 95 |
| 02 | ආහාර රසායනාගාරය | 15 | 14.02 | 93.05 | 85 |
| 03 | ගම්මාන සංවර්ධන වැඩසටහන | 08 | 1.50 | 19 | 60 |




2021 වර්ෂයේදී කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මෙරට ව්‍යාපාරික ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ආධාර සහ උපකාරක සේවාවන් ලබා දී ඇත. තවද, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) ප්‍රවර්ධනය කිරීම සහ දිරිගැන්වීම, ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් උපාය මාර්ග සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය බැඳී සිටී.මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විභව ව්‍යාපාර වෙනුවෙන් වෙළඳපල පුළුල් කිරීම සඳහා, IDB

අමාත්‍යාංශය හා ඒකාබද්ධව විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටකටයුතු කරනු ලබයි. ඉහත ප්‍රස්ථාරයට අනුව, "IDB හි කාර්මික ජනපදවල යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සහ

නවීකරණය කිරීමේ" ව්‍යාපෘතිය, වසරේ වෙන්කර ඇති වැඩිම පිරිවැයක් දැරූ දැනට පවතින ව්‍යාපෘතිය වන අතර වසර තුළ මෙම ව්‍යාපෘතිය සඳහා සැලකිය යුතු මුදලක් වැය කර ඇත.

තවද, දැනට ක්‍රියාත්මකවන"ප්‍රතීතනය ලත් ආහාර රසායනාගාරය" පිහිටුවීමේ ව්‍යාපෘතිය මඟින් 93.05%ක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇති අතර, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම සහ ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණු වේ.

**3.7.2 වගුව : IDB හි ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය**

| අංකය | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | නව කර්මාන්ත ඇති කිරීමට සහාය වීම | 199 |
| 02 | පවතින කර්මාන්ත දියුණු කිරීමට සහාය වීම | 325 |
| 03 | තාක්ෂණ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 75 |
| 04 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 80 |
| 05 | අමුද්‍රව්‍ය ලෙස ලෝහ ආශ්‍රිත කර්මාන්ත සඳහා ලෝහ අවශේෂ සැපයීම | 2377 මෙට්‍රික් ටොන් |
| 06 | රබර් නිෂ්පාදන කර්මාන්ත සඳහා රබර් සංයෝග සැපයීම | 37168 කි.ග්‍රෑ. |
| 07 | ආහාර රසායනාගාරය මගින් ආහාර පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම | 466 (ව්‍යවසායකයින්) |
| 08 | ලක්කම් අලෙවි මධ්‍යස්ථානය හරහා අලෙවි පහසුකම් ලබාදීම | 310 (ව්‍යවසායකයින්) |
| 09 | යන්ත්‍රෝපකරණ සැකසීම, තක්සේරු වාර්තා, CNC පහසුකම් ආදිය සඳහා ඉංජිනේරු සේවා සැපයීම. | 230 (ව්‍යවසායකයින්) |

## 3.8 වසර 2022 සඳහා අනාගත සැලසුම්

▶ **IDB** හි කාර්මික ජනපදවල යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සහ නවීකරණය කිරීම.

- මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම රු.මි. **65**

ගලිගමුව, නැගම්පහ, ඒකළ, පල්ලෙකැලේ, අච්චුවේලි, වවුනියා සහ පන්නල කාර්මික ජනපදයන්හි 2021 වර්ෂය තුළ සැලසුම් කරන ලද යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 90% ක් අවසන් කර ඇත. අච්චුවේලි කාර්මික ජනපදයේ දෙවන අදියරේ අභ්‍යන්තර මාර්ග සහ කාණුවල කොටසක් ඉදිකිරීම් කටයුතු සිදුකරන

ලදි. එමෙන්ම ඒකළ කාර්මික ජනපදයේ ජලය බැසයාමේ ප්‍රධාන කාණුව ඉදිකිරීමේ කටයුතු සිදුකරන ලදි. මෙම සංවර්ධන කටයුතු වලින් පසුව 2021 වර්ෂය තුළ නව කර්මාන්ත 9 ක් නිෂ්පාදන කටයුතු ආරම්භ කර තිබේ.

▶ ගම්මාන සංවර්ධන වැඩසටහන

- මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම රු.මි. **10**

▶ ආහාර රසායනාගාරය

ආහාර රසායනාගාරයේ රසායනික විද්‍යාගාරය (**Chemical Lab -** බිම් මහල) 2020 ජනවාරි විවෘත කර ආහාර නිෂ්පාදනය සඳහා (**SLS / ISO** ප්‍රමිතීන්, ලේබල් කිරීමේ අවශ්‍යතා අනුව පරීක්ෂා කිරීම, පෝෂණ සංයුතිය පරීක්ෂා කිරීම ආදිය) **SGS Lanka** ආයතනය සමඟ ජාත්‍යන්තරව පිළිගත් රසායනාගාර වාර්තා ලබාදීම. මෙම වසරේ ආහාර සාම්පල් 475ක් පමණ සඳහා තත්ව පරීක්ෂණ වාර්තා ලබා දී ඇති අතර මෙය පසුගිය වසරට සාපේක්ෂව දෙගුණයකට ආසන්නය. කර්මාන්ත 145ක් පමණ සඳහා සේවා සපයා තිබේ. මෙම පරීක්ෂණ වාර්තා දේශීය හා අපනයන වෙළෙඳපොළ සඳහා භාවිතා වේ.

▶ කාබනික සහතිකය ලබා ගැනීම සඳහා කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

කාබනික කෘෂිකර්මාන්තය රට තුළ ව්‍යාප්ත කිරීමේ රජයේ ක්‍රියාමාර්ගයට ,ශ්‍රී ලංකාවේ ආහාර සැකසුම්කරුවන් / හසුරුවන්නන් සහ වෙළඳුන් / අපනයනකරුවන් සඳහා කාබනික සහතිකය ලබා දීම සඳහා මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට **IDB** පියවර ගෙන තිබේ .මූල්‍ය ආධාර සහ තාක්ෂණික මගපෙන්වීම් ලබා දීමෙන් කාබනික සහතිකයලබා ගැනීම සඳහා කර්මාන්ත දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණුයි.

කාර්මික අංශය දිරිමත් කිරීම සහ බලගැන්වීම ඕනෑම රටකට දිගුකාලීනව ආර්ථික සාර්ථකත්වයක් අත්කර ගැනීමට අත්‍යවශ්‍ය සාධකයකි. 2021 වර්ෂයේදී, කාර්මික සංවර්ධන මණ්ඩලය මෙරට බොහෝ ව්‍යාපාරික ප්‍රජාව වෙත උපකාරක සේවා සැපයීමට සම්බන්ධ වී ඇත. දේශීය හා විදේශීය වෙළෙඳපොළ තුළ මෙරට නිෂ්පාදනවල තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, පිරිවැය අවම කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ සන්නාම වටිනාකම වැඩිදියුණු කිරීම වඩාත් වැදගත් වේ. ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා උපායමාර්ගිකව වැදගත් වන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (SMIs) දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කෙරෙහි මණ්ඩලය ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. ඉහත කරුණු අනුව, 2021 වසරේ අපගේ මූලික ප්‍රමුඛතාවය වූයේ, IDB හි ආයතනික සංස්කෘතිය තුළ අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ ගෙන ඒම සහ මෙම පුළුල් වගකීමට උරදීම සඳහා ආයතනය සකස් කිරීමට අවශ්‍ය මානව සම්පත් නවීකරණය කිරීම හා සංවිධාන ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම වේ.

# (04) මෙහෙයුම් සමාලෝචනය



## 4.1 ප්‍රාදේශීය සංවර්ධන අංශය

ප්‍රාදේශීය සංවර්ධන අංශය (RDD),ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය විසින් පවත්වනු ලබන සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාප්ති ක්‍රියාකාරකම් මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි. මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ කර්මාන්තකරුවන්ට සහ ව්‍යවසායකයින්ට දිවයිනේ විවිධ ප්‍රදේශවල තම ව්‍යාපාර ආරම්භ කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට සහාය වීමය. කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින මෙම ප්‍රාදේශීය සංවර්ධන අංශ මණ්ඩලයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වය සපයාදීම පිණිස මූලික ක්ෂේත්‍ර4ක් යටතේ ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික්ක 25හි කර්මාන්ත වල ආර්ථික තත්වය හඳුනා ගැනීම, නව කර්මාන්ත නිර්මාණය කිරීම, පවතින කර්මාන්ත ප්‍රවර්ධනය සහ සංවර්ධන කිරීම, ප්‍රාදේශීය සංවර්ධන අංශයේ කාර්යය මණ්ඩලයෙහි හා ප්‍රාදේශීය කාර්ය මණ්ඩලයෙහි හැකියා සංවර්ධනය කිරීම එම ක්‍රියාමාර්ග හතර වේ. එයට අමතරව ආර්ථික වාර්තා සකස් කිරීම, නව කර්මාන්ත ස්ථාපිත කිරීම, පවතින කර්මාන්ත සංවර්ධන කිරීම සහ අපනයනයට සුදානම් සමාගම් ලෙස සුලු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හඳුන්වාදීම සහ ප්‍රවර්ධනය කිරීම මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් වේ.


### 4.1.1: 2021 වසර තුළ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය

2021 වසර සඳහා වන ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම දිස්ත්‍රික් කාර්යාල විසිපහ (25) මඟින් ක්‍රියාත්මක කරන ලද අතර අනපේක්ෂිත අයුරින් ඇතිවූ COVID-19 වසංගත අභියෝගවලට මුහුණ දෙමින් දී ඇති ඉලක්ක බොහෝ දුරට සපුරා ගැනීමට මෙම අංශය සමත් විය.


ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන අංශයට අනුයුක්ත සියලුම නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව රු. මිලියන 9.88 ක ආදායමක් 2021 වර්ෂය තුළ ලබා ගැනීමට අවස්ථාව සැලසිණි.

4.1.1 වගුව :2021 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා අංශයේ සමස්ත ඉලක්ක හා ජයග්‍රහණ

| අංකය | ව්‍යාපෘතිය (KPI) | සමුච්චිත ජයග්‍රහණ (ජනවාරි - දෙසැම්බර්) | සමස්ත ප්‍රගතිය (ජනවාරි - දෙසැම්බර්) |
|---|---|---|---|
| 01 | නව ව්‍යාපාර ආරම්භයට සහය වීම | 190 | **44%** |
| 02 | පවතින කර්මාන්ත / ව්‍යාපාර වැඩිදියුණු කිරීම | 305 | |
| **එකතුව** | | **495** | |





## 4.1.2ප්‍රාදේශීය සංවර්ධන අංශයේ දිස්ත්‍රික් වශයෙන් ප්‍රගතිය



**4.1.3වගුව : වාර්ෂික ප්‍රගතිය සංසන්දනය කිරීම**

| # | 2019 | 2020 | 2021 |
|---|---|---|---|
| ඉලක්කගත ආදායම | 6.85 | 22.18 | 11.74 |
| සැබෑ ආදායම | 12.46 | 15.76 | 9.88 |




COVID-19 පැතිරීම ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩාල කර ඇති අතර කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගමනයට ද එමඟින් විශාල වශයෙන් බලපෑම් එල්ලවී තිබේ. සංවිධානයක් තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ගවල සඵලතාවය තක්සේරු කිරීමේදී ගෝලීය වශයෙන් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිමැවුම්වල විෂමතාව පිළිබඳව ද අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම වැදගත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් ප්‍රාදේශීය සංවර්ධන අංශය මඟින් දිවයිනේ සමස්ත දිස්ත්‍රික්ක **25**ම ආවරණය වන පරිදි සිය කලාපීය ජාලය හරහා කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අතිවිශිෂ්ට කාර්යභාරයක් ඉටු කරයි. මෙරට ආර්ථිකයේ වර්ධන රටාව මැනවින් හඳුනා ගනිමින් ඊට බලපාන සංවර්ධන ක්‍රියාවලීන් හරහා කර්මාන්ත සංවර්ධනය කළයුතු ආකාරය අවබෝධ කර ගනිමින් මෙම අංශය ඔවුන්ගේ සංවර්ධන ප්‍රතිපත්ති බොහොමයක් ක්‍රියාවට නංවා ඇත.කාර්මික ගම්මාන සංවර්ධනය, කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය ඇතුළුව ඉහත සඳහන් කර ඇති අනෙකුත් බොහෝ වැඩසටහන් ව්‍යවසායකත්ව ගම්මාන සංවර්ධනය කිරීම හා ග්‍රාමීය මට්ටමේ කාන්තා ව්‍යවසායකයින් ශක්තිමත් කිරීම සහ ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදීම කෙරෙහි අවධානය යොමු කර ඇත.නවීන ආර්ථිකය තුළ නිෂ්පාදන අංශයේ කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කෙරෙන බැවින් කාර්මීකරණ ක්‍රියාවලිය කෙරෙහි ප්‍රාදේශීය සංවර්ධන අංශය අවධානය යොමු කර ඇත. තවද ඉහත පෙන්වා ඇති රූප සටහනට අනුව, පෙර වර්ෂවලට සාපේක්ෂව, නවීන තාක්ෂණික ක්‍රම සහ නිෂ්පාදන ක්‍රියාවලීන් සමඟ ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවන් ඉහළ නැංවීම සඳහා නව සංවර්ධන වැඩසටහන් හඳුන්වාදීම කෙරෙහි ද අංශයේ විශේෂ අවධානය යොමු කර ඇත.

### 4.1.3 "ලක්කම්" වෙළෙඳ ප්‍රදර්ශනය

මෙරට වර්තමානයේ අප මුහුණ දී තිබෙන විවිධ අභියෝග හමුවේ, ශ්‍රී ලාංකේය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ දියුණුවට ආධාරකයක් වශයෙන් ලක්කම් වෙළඳ ප්‍රදර්ශනය දිස්ත්‍රික්ක 8 ක් ආවරණය කරමින් පවත්වනු ලැබීය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් හට මෙම වෙළෙඳ ප්‍රදර්ශන මඟින් ප්‍රතිලාභ රැසක් ලබාගැනීමට අවකාශය උදාවුණි.


| අංකය | දිස්ත්‍රික්කය | දිනය | ස්ථානය | වෙළඳ කුටි ගණන | නිෂ්පාදන (වෙළඳ භාණ්ඩ) |
|---|---|---|---|---|---|
| 1 | කෑගල්ල | 2021 මාර්තු 18,19,20 | නගර ශාලාව, කෑගල්ල | 40 | ආහාර පාන, ඇඳුම් පැළඳුම්, යන්ත්‍රෝපකරණ, සෙල්ලම් බඩු ආදිය |
| 2 | ගම්පහ | 2021 මාර්තු 25,26 & 27 | බස් පර්යන්තය, මීගමුව | 34 | ආහාර පාන, ඇඳුම් පැළඳුම්, යන්ත්‍රෝපකරණආදිය. |
| 3 | කළුතර | 2021 මාර්තු 24,25,26 | නගර ශාලාවකළුතර | 67 | ආහාර පාන, ඇඟලුම්, පාවහන්, මල් පැල, බෑග්, රෙදිපිළි, කුළුබඩු, මාළු පදනම් කරගත් නිෂ්පාදන, රසකැවිලි ආදිය. |
| 4 | කොළඹ | 2021 මාර්තු 29,30,31 | දියත උයන, බත්තරමුල්ල | 84 | ආහාර පාන, ඇඟලුම්, පාවහන්, මල් පැල, බෑග්, රෙදිපිළි, කුළුබඩු, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන, රසකැවිලි, බතික්, රසායනික ද්‍රව්‍ය, මැටි ආශ්‍රිත නිෂ්පාදන ආදිය. |
| 5 | අනුරාධපුර | 2021 මාර්තු 30,31 සහ අප්‍රේල් 01 | UC Fair අනුරාධපුර | 42 | ආහාර සහ පාන වර්ග, ඇඟලුම්, පාවහන්, මල් පැල, බෑග්, රෙදිපිළි, කුළුබඩු, රසකැවිලි, බතික්, ලුහු ඉංජිනේරු, සිමෙන්ති පදනම් වූ, රසායනික ද්‍රව්‍ය පාදක වූ නිෂ්පාදන ආදිය. |
| 6 | හම්බන්තොට | 2021 අප්‍රේල්05,06,07 | අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් ක්‍රීඩාංගනය | 47 | සියලු නිෂ්පාදන |
| 7 | මාතර | 2021 අප්‍රේල්10,11,12 | නූපේ ලන්දේසි වෙළඳ මධ්‍යස්ථානය | 40 | ඇඟලුම්, ක්ෂණික ආහාර, මාළු ආශ්‍රිත ආහාර, කිතුල් ආශ්‍රිත නිෂ්පාදන, සිමෙන්ති සහ තන්තු ආශ්‍රිත නිෂ්පාදන, ලෝහ ආශ්‍රිත නිෂ්පාදන, ආහාර සැකසුම් යන්ත්‍ර, කුළුබඩු සහ අනුක්‍රමික නිෂ්පාදන, විසිතුරු භාණ්ඩ |
| 8 | ගාල්ල | 2021 අප්‍රේල්6,7,8 | නගර ශාලාවපරිශ්‍රය, ගාල්ල | 42 | කිතුල් පැණි සහ හකුරු, දෑත් සනීපාරක්ෂක, අත් බෑග් සහ බෑග්, ස්වර්ණාභරණ, ගෘහ භාණ්ඩ, ඖසු ඖෂධ සහ නිෂ්පාදන, අත්යන්ත්‍ර සාරි, කුළුබඩු, අගය එකතු කළ අයිස්ක්‍රීම්, සම් පදනම් වූ සපත්තු සහ සෙරෙප්පු, මල් පැල ආදිය. |

## 4.2 පරිපාලන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් සියලුම අංශවල ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ මට්ටමක පවත්වා ගැනීම තහවුරු කිරීම පිණිස මණ්ඩලයේ සියලුම මානව සම්පත් කළමනාකරණය පරිපාලන අංශයට පැවරී ඇති ප්‍රධාන වගකීම වේ. තවද ආයතනයේ සියලුම ප්‍රසම්පාදන, ආරක්ෂක හා ප්‍රවාහන ක්‍රියාකාරකම් සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා මානව සම්පත් කළමනාකරණ අංශය වගකීමෙන් බැඳී සිටී. තවද කාර්යය මණ්ඩලය ශක්තිමත් කිරීම පිණිස බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සහ උසස්වීම් යෝජනා ක්‍රමය (SoP), කාර්ය සාධන ඇගයීම්සහ විශ්‍රාම ගැන්වීම් යනාදිය පරිපාලන අංශයට පැවරී ඇති තවත් කාර්යයන් කිහිපයකි. තවද ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ සේවකයින් අතර ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යය මෙම අංශය මඟින් සිදු කරනු ලබන අතර සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම තුළින් සේවකයන්ගේ නිපුණතා වැඩිදියුණු කිරීම සහ අභිප්‍රේරණය කිරීමට අවශ්‍ය වැඩසටහන් ගණනාවක් ද ක්‍රියාත්මක කරනු ලබයි.

### 4.2.1 සේවක මණ්ඩල කළමනාකරණය

| වර්ගීකරණය | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු / (අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 8 | 4 |
| තෘතීක මට්ටම | 252 | 160 | 92 |
| ද්විතීක මට්ටම | 184 | 154 | 30 |
| ප්‍රාථමික මට්ටම | 266 | 185 | 81 |
| **එකතුව** | **714** | **507** | **207** |




ආයතනයක ක්‍රියාකාරීත්වයට දැඩි ලෙස බලපෑම් ඇති කරනු ලබනමානව සම්පත් හිඟය යනු අවශ්‍ය ප්‍රමාණයට මානව සම්පත් ප්‍රමාණවත් නොවීමයි. මෙවන් තත්වයක් බොහෝ විට සේවකයන් විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉවත් කිරීම් හෝ සේවකයන් ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත් වීම් හේතුවෙන් ඇති විය හැකිය. ආයතනයේ ඵලදායිතා මට්ටම, කාර්යක්ෂමතාවය පහත වැටීම සහ කාර්යක්ෂම වූ පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණවත් නොවීම මානව සම්පත් හිඟයේ ප්‍රතිඵල කිහිපයකි. එබැවින් ආයතනයට හිමි සේවක

අවශ්‍යතාවය හඳුනාගෙන ඒ අනුව ප්‍රමාණවත් සේවක පිරිසක් යෙදවීමට කටයුතු කලයුතු අතර සේවක තෘප්තිය වැඩිදියුණු කරමින් දැනට සිටින සේවකයන් සේවයෙන් ඉවත්වීම අවම කිරීමට පියවර ගත යුතු වේ.

### 4.2.2 මානව සම්පත් සංවර්ධනය සඳහා පවත්වනු ලබන දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්

සේවකයින් සඳහා නිසි පුහුණු සහ සංවර්ධන සැසි සංවිධානය කිරීම ඉතා අත්‍යවශ්‍ය කාර්යයක් වන අතර එමඟින් මණ්ඩලයේ සේවකයන්ගේ පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කරගැනීමට හැකි වේ. වඩාත් සාර්ථක පුහුණු වැඩසටහන් මඟින් සේවකයින්ට නව කුසලතා ඇතිකර ගැනීමට, පවතින හැකියාවන් මුවහත් කරගැනීමට, වඩා හොඳ කාර්ය සාධනයක් අත්පත් කරගැනීමට සහඵලදායිතාව වැඩි කරගැනීම තුළින් වඩා හොඳ නායකයින් වීමට ද අවස්ථාව සැලසේ. සමස්ත ආයතනික ජයග්‍රහණ ළඟාකරගැනීමට සේවකයින් තම උපරිමයෙන් කැපවී ක්‍රියා කළයුතු බැවින්, නිතර වෙනස්වන කාලීන අවශ්‍යතාවයන්ට අනුවදෙස් විදෙස් පුහුණු වැඩසටහන් සඳහා සේවකයින් අනුයුක්ත කළ යුතු වේ.

### 4.2.2 වගුව : වසරේ පැවැත්වූ පුහුණු වැඩසටහන් පිළිබඳ විස්තර

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | මුළු ආයෝජනය (රු.000) | | ප්‍රතිදානය / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | |
| 01 | ජල විගණනය සහ ජල පිය සටහන් ඇගයීම | 1 | දින 3 | 32,500 | | හැකියාවන් වර්ධනය |
| 02 | ඉදිකිරීම් උපකරණවල විදුලි පද්ධති නඩත්තු කිරීම | 2 | දින 4 | 29,200 | | කුසලතා සංවර්ධනය |
| 03 | රසායනාගාර අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව සහ විසඳුම | 2 | දින 1 | 14,000 | | හැකියාවන් වර්ධනය |
| 04 | රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සහ භාවිතයන් | 2 | දින 1 | 30,000 | | හැකියාවන් වර්ධනය |
| 05 | විශ්ලේෂණාත්මක ක්‍රමය වලංගු කිරීම සහ සත්‍යාපනය පිළිබඳ වැඩමුළුව | 1 | දින 1 | 5,500 | | හැකියාවන් වර්ධනය |
| 06 | විදුලි සෝපාන සහ එස්කැලේටර් ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම | 1 | දින 2 | 12,000 | | කුසලතා සංවර්ධනය |
| 07 | OXY-ඇසිටිලීන් ගෑස් වෑල්ඩින් සහ අතින් ලෝහ චාප වෙල්ඩින් පිළිබඳ වැඩසටහන | 3 | දින 4 | 63,000 | | කුසලතා සංවර්ධනය |

| අංකය | වැඩසටහනේ නම | පුහුණු කාර්ය මණ්ඩල සංඛ්‍යාව | වැඩසටහනේ කාලසීමාව | මූලඅායෝජනය (රු.000) | | ප්‍රතිදානය / ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | |
| 08 | ISO 50001:2018 බලශක්ති කළමනාකරණ පද්ධතියේ උපදේශක සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | දින 5 | 65,000 | | කුසලතා සංවර්ධනය |
| 09 | ගොඩනැගිලි විදුලි පද්ධති සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව | 3 | දින 3 | 48,000 | | කුසලතා සංවර්ධනය |
| 10 | ශබ්ද මට්ටම මැනීම සහ පාලනය කිරීම | 2 | දින 1 | 5,000 | | හැකියාවන් වර්ධනය |
| 11 | අපජල පවිත්‍රාගාර | 2 | දින 4 | 24,000 | | හැකියාවන් වර්ධනය |
| 12 | අපද්‍රව්‍ය ජල කළමනාකරණය | 1 | දින 1 | 5,000 | | හැකියාවන් වර්ධනය |
| 13 | නව EPO දැනුවත් කිරීමේ වැඩසටහන | 10 | දින 3 | 36,580 | | හැකියාවන් වර්ධනය |
| 14 | ඉංජිනේරුවන් සඳහා ආයතනික මූල්‍ය කළමණාකරණයේ මූලික කරුණු | 3 | දින 4 | 65,000 | | හැකියාවන් වර්ධනය |
| 15 | ව්‍යාපාර පරිපාලන (MBA) | 1 | අවු. 2 | 217,500 | | හැකියාවන් වර්ධනය |
| 16 | දේශීය පාර්ශවකරුවන් සඳහා IOMC මෙවලම් කට්ටලය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | දින 8 | අන්තර් ජාලය මඟින් | | හැකියාවන් වර්ධනය |
| 17 | ව්‍යාපෘති යෝජනා සකස් කිරීම | 100 | දින 2 | 30,000 | | හැකියාවන් වර්ධනය |
| 18 | ඉන්දුනීසියාවේ කාර්මික සංවර්ධනය පිළිබඳ 2 වන කලාපීය සමුළුව | 1 | 8 – 14 නොවැම්බර් 2021 | | 450,660 | හැකියාවන් වර්ධනය |
| 19 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මූල්‍ය හා ආර්ථික කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 2 – 15 නොවැම්බර් 2021 | | අන්තර් ජාලය මඟින් | හැකියාවන් වර්ධනය |
| 20 | කාර්මික උද්‍යාන ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 24 – 7 නොවැම්බර් 2021 | | අන්තර් ජාලය මඟින් | හැකියාවන් වර්ධනය |
| 21 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඊ-වාණිජ්‍යය සහ සිල්ලර කර්මාන්තයේ සම්බන්ධීකරණ සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | 1 | 7 – 20 දෙසැම්බර් 2021 | | අන්තර් ජාලය මඟින් | හැකියාවන් වර්ධනය |

මණ්ඩලයේ සේවකයන්ගේ පුද්ගලික හා වෘත්තීය නිපුණතාවය වැඩිදියුණු කරගැනීම සඳහා ඔවුන් දිරිමත් කරමින්, පොළඹවමින් හා ඒ සඳහා පහසුකම් සලසමින්, ළඟාවිය යුතු ඉලක්ක වෙත ළඟා වීම සඳහා ඔවුන් අභිප්‍රේරණය කිරීම පුහුණු වැඩසටහන් හි ප්‍රධාන පරමාර්ථය වේ. තවද කළමනාකරණ මට්ටමට අයත් කාණ්ඩවල සේවකයන්ගේ නායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම, අනෙකුත් කාණ්ඩ වලට අයත් සේවකයින්ගේ නිපුණතා අපේක්ෂිත මට්ටමට දියුණුකරලීම, ආයතනයේ සේවකයින්ගේ කාර්ය සාධන මට්ටම් නංවාලමින් කුසලතා වැඩි දියුණු කිරීම සහ සේවක ධාරිතාව වර්ධනය කිරීමේ අරමුණින් IDB නව වැඩසටහන් කිහිපයක් 2021 වර්ෂයට අදාලව ක්‍රියාත්මක කර ඇත. වඩාත් සාර්ථක වූ පුහුණු වැඩසටහන්

මඟින් සේවකයින්ට නව කුසලතා ලබා ගැනීමට, පවතින හැකියාවන් මුවහත් කරගැනීමට, වඩා හොඳ කාර්ය සාධනයක් අත්කරගැනීමට සහඵලදායිතාව වැඩි කිරීමට ඉඩ සලසයි. අලුතින් බඳවා ගන්නා ලද සේවකයින් සඳහා පුහුණුව විශේෂයෙන් වැදගත් වන බැවින්, එය ආයතනය තුළ සිටින ජ්‍යේෂ්ඨ නිලධාරියෙකු මාර්ගයෙන් සිදු කළ හැකි අතර, මෙමඟින් ආයතනයේ ඕනෑම නිපුණතා හිඩැසක් ආවරණය කර ගත හැකි අතරම අඩු පිරිවැයකින් නව සේවකයින් වේගයෙන් අනුයුක්ත කරගත හැකි වේ. සේවකයින් සේවයේ නියුක්තව සිටියදී ඇතිවන අඩුපාඩු හා දුර්වලතා පුහුණු සැසි හරහා මඟහරවා ගත හැකි අතර, නිපුණතා සංවර්ධන වැඩසටහන් මඟින් සියලුම සේවකයින් සමාන කුසලතා සහ දැනුම ඇති සම මට්ටමකට ගෙන එන අතර එමඟින් සේවකයින් කිහිප දෙනෙකු මත දැඩි ලෙස රඳා පවතින තත්වයන් මඟහරවා ආයතනය තුළ ඇති කුසලතා හිඩැස් හෝ දුර්වල සම්බන්ධතා අවම කිරීමට හැකි වේ. සියලු කරුණු පිළිබඳ සැලකීමේදී ආයතනයක් විසින් සංවිධානය කරනු ලබන පුහුණු සැසි සිත්ගන්නාසුළු හා කර්මාන්තයට විශේෂිත වූ විට, එය ආයතනයේ කාර්ය සාධනය වැඩි කරගැනීමටත් තෘප්තිමත් සේවක පිරිසක් ඇතිවීමටත් හේතු වේ.

### 4.2.3 කාර්ය සාධනය

**4.2.3 වගුව:2021 දී අංශයේ කාර්ය සාධන විශේෂතා**

| | ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|---|
| **1** | **බඳවා ගැනීම්** | |
| (i) | කාර්යය මණ්ඩල බඳවා ගැනීම් | 65 |
| (ii) | ඉල්ලා අස්වීම් | 13 |
| (iii) | විශ්‍රාම ගැනීම් | 13 |
| (iv) | තනතුරෙහි නිවාඩු ගොස් ඇති පිරිස | 04 |
| **2** | **පුහුණු වැඩසටහන්** | |
| (i) | දේශීය | 17 |
| (ii) | විදේශීය | 04 |
| **3** | **ආයතනික දීමනා** | |
| (i) | පුද්ගලයන් 16 දෙනෙකු සඳහා පාරිතෝෂික ගෙවීම් | රු. 14,839,905.00 |
| **4** | **සේවක සුභසාධනය** | |
| (i) | බයිසිකල් ණය | - |
| (ii) | ආපදා ණය - පුද්ගලයන් 72 | රු. 14,358,124.53 |
| **5** | **ආරක්ෂක කළමනාකරණය** | |
| (i) | ආරක්ෂක පිරිවැය | රු. 25,280,224.37 |
| **6** | **බැහැර කිරීම** | |
| (i) | භාණ්ඩ සමීක්ෂණ පවත්වන ලදී | 01 |
| **7** | **තැපැල් හා විදුලි සංදේශ ගාස්තු** | |
| (i) | තැපැල් ගාස්තු | රු. 600,000.00 |
| (ii) | විදුලි සංදේශ ගාස්තු | රු. 5,397,623.66 |

## 4.3 ඉංජිනේරු අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු අංශය මෙරට තිරසර කර්මාන්ත සංවර්ධනයක් උදෙසා මණ්ඩලයෙහි දැක්ම ක්‍රියාත්මක කිරීමට දායක වන ප්‍රමුඛතම අංශය ලෙස ක්‍රියාත්මක වෙයි. එමෙන්ම මෙම අංශය කර්මාන්තකරුවන්ට තිබෙන සීමිත සම්පත් ප්‍රශස්ත ආකාරයෙන් උපයෝජනය කර ගනිමින් තම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස තාක්ෂණික සහ මෙහෙයුම් ධාරිතාව වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය සහය ලබාදේ. එයට අමතරව ලෝහ සහ ලෝහ නොවන නිෂ්පාදන / උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම, කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා, ඇගයීම් වාර්තා, සහ ලෝහ අබලි ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම පිණිස දේශීය ලෝහ කර්මාන්ත සඳහා වාත්තු වැඩපොළ පහසුකම් වැඩිදියුණු කිරීම මෙම අංශය විසින් සපයා දෙනු ලබන අනෙකුත් සේවාවන් කිහිපයක් වේ. තවද, සේවා අපේක්ෂකයින්ගේ ඉල්ලීමට අනුකූලව ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන්ගෙන් යුතු වෘත්තීය ඉංජිනේරු විසඳුම් සහ සේවා සැපයීම සඳහා ඉංජිනේරු අංශය බැඳී සිටී. ශ්‍රී ලංකාවේ තිරසාර කාර්මික සහ ආර්ථික වර්ධනයක් ලබා ගැනීම උදෙසා ගොඩනඟා ඇති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි දැක්ම, මෙහෙවර සහ ඉලක්ක සමඟ සමගාමීව ඉංජිනේරු අංශයේ උපාය මාර්ග සහ අරමුණු නිර්වචනය කර තිබේ.

### 4.3.1 ඉංජිනේරු අංශයේ ඉලක්ක

- කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවල තාක්ෂණික ක්ෂේත්‍රයේ, නිපුණතාවන් හි පවතින පරතරය හඳුනාගෙන ඒවා සපුරාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- අගය එකතු කළ භාණ්ඩ හා සේවා සැපයීම මගින් ඉංජිනේරු අංශයේ ආදායම/මුදල් ප්‍රවාහය වැඩි කිරීම.
- පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලීන් හඳුවාදීම තුළින් නව සැලසුම්, කෘෂිකාර්මික උපකරණ සහ යන්ත්‍රෝපකරණ ආනයනයන් සීමා කිරීම හා එම භාණ්ඩ මෙරට නිපදවා ගැනීමට කටයුතු කිරීම.

*වාත්තු තාක්ෂණය පිළිබඳ කණ්ඩායම් පුහුණු වැඩසටහන*



*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල වෙබ් අඩවිය*

### 4.3.2 ඉංජිනේරු අංශයේ ව්‍යුහය

| අංකය | ඒකකය | පිහිටීම | කාර්යයන් |
|---|---|---|---|
| 01 | වැඩපොළ | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • කර්මාන්තකරුවන්ට අවශ්‍ය ඉංජිනේරු වැඩමුළු සේවා සැපයීම.<br>▸ යන්ත්‍රෝපකරණ පිරිසැකසුම් කිරීම, එකලස් කිරීම,ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ලියවන පට්ටල්, යන්ත්‍රෝපකරණ නැමීම්, වෙල්ඩින්, තාප පිරියම් කිරීමේ සහ එකලස් කිරීමේ පහසුකම් සැලසීම.<br>▸ ප්ලාස්ටික් අච්චු සහ රබර් අච්චු නිෂ්පාදනය කිරීම.<br>▸ කුඩා හා ක්ෂුද්‍ර පරිමාණ කර්මාන්ත සඳහා මෙවලම් සහ උපකරණ නිෂ්පාදනය කිරීම.<br>▸ යන්ත්‍ර සැකසීම, ස්ථාපනය කිරීම පිළිබඳ උපදේශනය.<br>• ආයතනයේ අභ්‍යන්තර අංශ සඳහා අවශ්‍ය සේවා සැපයීම. |
| 02 | ඉංජිනේරු කාර්යාලය | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • යන්ත්‍ර තක්සේරු කිරීම සහ වාර්තා නිකුත් කිරීම.<br>• නිෂ්පාදන සහතික නිකුත් කිරීම.<br>• කර්මාන්ත ශක්‍යතා වාර්තා සකස් කිරීම.<br>• ආධුනිකයන්, උපාධි අපේක්ෂකයින්, නිපුණ/අර්ධ නිපුණ ව්‍යවසායකයින් සහ NAITA අභ්‍යාසලාභීන් සඳහා පුහුණුවීම් ලබා දීම.<br>• ඉංජිනේරු අංශයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂේත්‍ර පරීක්ෂා සිදුකිරීම සහ අමාත්‍යාංශයට සහ රේගුව වෙත නිර්දේශ ලිපි නිකුත් කිරීම.<br>• ව්‍යාපෘති සැකසීම සහ ඇගයීම.<br>• යන්ත්‍රෝපකරණ සැලසුම් සකස් කිරීම.<br>• නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳ තාක්ෂණික දැනුම් ලබා දීම. |
| 03 | පරිගණක සංඛ්‍යාත්මක පාලන | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • Computer Numerical Control (CNC) "hass machine" ආශ්‍රිත සේවා.<br>▸ කර්මාන්ත සඳහා පට්ටල සේවා<br>• ඩයි සහ අච්චු සැකසීමේ සේවා.<br>• ත්‍රිමාණ මුද්‍රණය ඇතුළු උසස් තාක්ෂණික පුහුණු අවස්ථා හඳුන්වාදීමෙන් ව්‍යවසායකයින් සවිබල ගැන්වීම. |
| 04 | වාත්තු වැඩපොළ | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | ශ්‍රී ලංකාවේ යකඩ සහ යකඩ අඩංගු නොවන ලෝහ නිෂ්පාදිත නිෂ්පාදනය කිරීම සඳහා වාත්තු තාක්ෂණය දේශීය කර්මාන්ත වෙත ලබාදීම. කර්මාන්තකරුවන් සඳහා පහත සඳහන් වාත්තු කටයුතු සිදු කරනු ලැබේ.<br>▸ ඇලුමිනියම්, තඹ, පිත්තල සහ ලෝකඩ අයිතම වාත්තු කිරීම.<br>▸ ලෝහ ද්‍රව්‍ය සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම සහ තහවුරු කිරීම.<br>• ලෝහ විද්‍යා රසායනාගාරය:<br>ශ්‍රී ලංකාවේ ලෝහ පාදක නිෂ්පාදනවල අපේක්ෂිත ගුණාත්මකභාවය ළඟා කර ගැනීම සඳහා කර්මාන්ත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් ලෝහවල සංයුතිය, ව්‍යුහය සහ ගුණාංග හඳුනාගැනීම සහ සංවර්ධනය කිරීම සිදුකළ හැකිය. |

| | | | |
|---|---|---|---|
| 05 | සිවිල් ඉංජිනේරු ඒකකය | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • ආයතනික අරමුණු සපුරාලීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම.<br>• කාර්මික ජනපද වල කර්මාන්ත යටිතල පහසුකම් සංවර්ධන අවශ්‍යතා හඳුනාගෙන ආර්ථිකයට වඩා හොඳ ප්‍රතිඵලයක් ලබා දීම සඳහා අදාළ බිම් කොටස් හිමියන් සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව ඒ වෙනුවෙන් කටයුතු කිරීම.<br>• ගෝලීය ආර්ථික අවස්ථාවන් ශ්‍රී ලංකාව වෙත උකහා ගැනීම සඳහා නැගී එන කර්මාන්ත සැලසුම් කිරීම හා ගොඩනැගීම වෙනුවෙන් ව්‍යාපෘති සකස් කිරීම. |
| 06 | විදුලි ඉංජිනේරු ඒකකය | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • කර්මාන්ත සංවර්ධන පහසුකම් සැපයිය හැකි විදුලි ඉංජිනේරු වෘත්තිකයන් සිටින කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ප්‍රධාන ආයතනයකි.<br>▸ සියලුම අභ්‍යන්තර හා බාහිර කටයුතු සඳහා විදුලිබලය ලබාදීම හා නඩත්තු කිරීම.<br>▸ ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ කර්මාන්ත අමාත්‍යාංශය වැනි ආයතන සඳහා අවශ්‍ය සේවා සැපයීම. |
| 07 | යෝග්‍යතාක්ෂණ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (ATRDC) | පන්නල | • කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා අවැසි යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අවශ්‍යතාවන් හා වුවමනාවන් හඳුනා ගැනීමේ හැකියාව හා ශක්‍යතාව මෙම මධ්‍යස්ථානය සතුව පවතින අතර දේශීය ගොවීන් සඳහා ප්‍රශස්ත පිරිවැයකින් ඒවා සැලසුම් කිරීම හා පිරිසැකසුම් කිරීම සිදුකරනු ලබයි.<br>• යන්ත්‍ර සූත්‍ර, උපකරණ, පිරියත සහ වෙනත් නිෂ්පාදන පහසුකම් තක්සේරු කිරීම.<br>• කර්මාන්ත සඳහා තත්ත්ව වාර්තා සහ තක්සේරු වාර්තා සකස් කරනු ලබයි.<br>• ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සැලසුම් කිරීම, පිරිසැකසුම් කිරීම, එකලස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම මධ්‍යස්ථානය විසින් මෙහෙයවනු ලබන තවත් ක්‍රියාකාරකම් කිහිපයක් වේ. |
| 08 | පොදු සේවා මධ්‍යස්ථානය (CSC) | මාතර | • ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා උපකරණ හා යන්ත්‍ර සූත්‍ර පිරිසැකසුම් කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ලියවන පට්ටල්, මෙහෙයුම්, යන්ත්‍රෝපකරණනැමීම්, වෙල්ඩින් සහ එකලස් කිරීමේ පහසුකම් සැලසීම. |
| 09 | විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය (EPC) | පැලියගොඩ | • දේශීය කර්මාන්තවලට ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීම සඳහා ලෝහාලේප තාක්ෂණය සහ සේවාවන් මෙම මධ්‍යස්ථානය මඟින් සපයනු ලබයි. |
| 10 | පිත්තල භාණ්ඩ සේවා මධ්‍යස්ථානය | පමුණුව, පිළිමතලාව | • තරඟකාරී ගෝලීය වෙළෙඳපොළට සරිලන පරිදි ශ්‍රී ලංකාව තුළ අඩු වියදමින් හා උසස් තත්ත්වයෙන් යුතු පිත්තල නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා සුදුසු තාක්ෂණය සහ දැනුම ලබා දීමෙන් පිත්තල කර්මාන්තයේ නියැලී සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නගා සිටුවීම. |

| | | | |
|---|---|---|---|
| 11 | සැලසුම් හා සංවර්ධන ඒකකය | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • කර්මාන්තවල තිරසාර ආර්ථික වර්ධනය උදෙසා කර්මාන්ත අවශ්‍යතා හඳුනා ගැනීම සහ උපකරණ, යන්ත්‍ර සූත්‍ර, පිරියත සහ නිෂ්පාදන පහසුකම් සැලසුම් කිරීම. |
| | තක්සේරු සහ ලෝහ පදනම් කරගත් කර්මාන්ත දත්ත විශ්ලේෂණ ඒකකය | ප්‍රධාන කාර්යයාලය - කටුබැද්ද | • ශ්‍රී ලංකාවේ පිරියත, උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ නිෂ්පාදන පහසුකම් ඇගයීම, තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තා සකස් කිරීම.<br>• දේශීය කර්මාන්තවල ලෝහ හා ලෝහ නොවන නිෂ්පාදන/භාණ්ඩ නිෂ්පාදනයේ නිෂ්පාදන සාධක (ශ්‍රමය, තාක්ෂණය සහ අමුද්‍රව්‍ය) අනුපාත අධ්‍යයනය කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත රැස්කිරීම සහ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා වෙනත් රටවල් සමඟ ඒවා සංසන්දනය කිරීම. |

*ඉංජිනේරු අංශයේ පවතින ප්‍රධාන යන්ත්‍රසූත්‍ර*



HAAS VF-4-1 CNCමිලින් යන්ත්‍රය



HAAS ST-10 CNC පට්ටල යන්ත්‍රය

*මූලාශ්‍රය: කාර්මික සංවර්ධන මණ්ඩල වෙබ් අඩවිය*


### *4.3.1 වගුව : ඉංජිනේරු අංශයේ ප්‍රගතිය - 2021*

| අංකය | ක්‍රියාකාරකම | කාර්ය සාධන දර්ශකය | භෞතික ප්‍රගතිය සමුච්චිත | සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.) |
|---|---|---|---|---|
| **1** | **නව ව්‍යාපාර ඇති කිරීම** | | | |
| 1.1 | නව නිෂ්පාදන වාණිජකරණය කිරීමට පහසුකම් සැලසීම (ඉංජිනේරු සැලසුම්කරණය සහ පහසුකම් සැපයීම) | සේවා සපයන ලද නිෂ්පාදන/කර්මාන්ත ගණන | 2 | 358,144 |
| **2** | **පවතින කර්මාන්ත / ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම** | | | |
| 2.1 | ව්‍යාපෘති ශක්‍යතා වාර්තා, තක්සේරු වාර්තා, වෙළඳපල අලෙවිකරණ සැලසුම් සකස් කිරීම | වාර්තා ලබා දී ඇති කර්මාන්තකරුවන් සංඛ්‍යාව | 43 | 2,309,140 |
| 2.2 | කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය (අච්චු) සැපයීම | සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 128 | 366,751 |
| 2.3 | කර්මාන්ත සඳහා වැඩමුළු පැවැත්වීම | සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 70 | 7,340,897 |
| 2.4 | වාත්තු සේවා සැපයීම | සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 113 | 5,733,983 |
| 2.5 | තඹ, නිකල් ක්‍රෝමියම් සහ දෘඪ ක්‍රෝමියම් ආශ්‍රිත විද්‍යුත් ආලේපන සේවා සැපයීම | සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 127 | 1,212,910 |
| 2.6 | යන්ත්‍රෝපකරණ සහ උපකරණ නිෂ්පාදනය සහ සැපයීම | සපයා ඇති යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව | 12 | 5,839,804 |
| 2.7 | විදුලි සේවා | ලබා දී ඇති සේවා ගණන | 1 | 15,000 |
| 2.8 | CNC යන්ත්‍රෝපකරණ සේවාලබා දීම | යන්ත්‍රෝපකරණ සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 7 | 762,344 |
| **3** | **විශේෂිත සේවා** | | | |
| 3.1 | දකුණු පළාතේ කාර්මික සංවර්ධනය සඳහා පහසුකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම | ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා ගණන | - | 3,184,200 |
| 3.2 | ලෝහ විද්‍යාගාරයක් පිහිටුවීම (කාර්මික යෙදුම්) | සේවා සපයනු ලැබූ කර්මාන්ත ගණන | 5 | 870,088 |
| **එකතුව** | | | | **27,993,261** |

### *4.3.2 වගුව : වාර්ෂික ආදායම සංසන්දනය කිරීම*

| වර්ෂය | ආදායම (රු.) |
|---|---|
| 2019 | 22,769,521 |
| 2020 | 21,806,327 |
| 2021 | 27,993,261 |

**4.3.1 ප්‍රස්ථාරය : අංශයේ වාර්ෂික ආදායමෙහි ප්‍රගතිය**




IDB හි ඉංජිනේරු අංශය, කර්මාන්තකරුවන්ගේ තාක්ෂණික අවශ්‍යතාවන් හඳුනාගෙන, ඔවුන් වෙත ප්‍රශස්ත සේවාවක් ලබාදීම සඳහා පවතින සීමිත සම්පත් තිරසාර ලෙස යොදාගනිමින් නිසි සහය හා මඟ පෙන්වීම ලබාදෙනු ලැබේ. ඉංජිනේරු අංශයේ ප්‍රගතිය සලකා බැලීමේදී 2021 වර්ෂය තවත් ප්‍රතිලාභදායක වසරක් වූ අතර පසුගිය වසරවලට සාපේක්ෂව ඉහළ ආදායම් ඉලක්කයක් සාර්ථක ලෙස ලබාගැනීමට සමත් වී ඇත. ඉංජිනේරු අංශය විසින් ළඟාකර ගෙන ඇති තාක්ෂණික දියුණුව මෙම ආදායම් ප්‍රමාණයන් ඉහළයාමට හේතු වී ඇති අතර එමඟින් ආයතනයේ නිෂ්පාදන ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අවස්ථාව සැලසිණි. මෙම කාලපරිච්ඡේදයේ ඇති වූ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන්, බොහෝ ආයතනවල මෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ද සේවා සුරක්ෂිතතාවය පිළිබඳ අභියෝගයක් පැවති නමුත් ආයතනය විසින් අවශ්‍ය ආරක්ෂණ ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හේතුවෙන් මෙහෙයුම් කටයුතු කිසිදු බාධාවකින් තොරව පවත්වා ගැනීමට හැකි විය. තවද ඉංජිනේරු අංශය තුළ දැනට සුදුසුකම් ලත් ශ්‍රම බලකායේ හිඟයක් පවතින අතර, වර්තමානයේ බොහෝ ආයතන නවීන ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නිෂ්පාදන ඵලදායීතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැවීමට කටයුතු කරන බැවින් පුහුණු ශ්‍රමිකයන්ගේ හිඟයක් කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඇතිවෙමින් පවතී. කාර්මිකකරණයේ වර්ධනයන් තුළින් නවීන තාක්ෂණය කර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වාදීමත් සමඟ බොහෝ කර්මාන්ත තුළ නිෂ්පාදනය සහ ඵලදායීතාව වැඩිදියුණු කිරීමත් ඒ තුළින් සමස්තයක් වශයෙන් දෛනික නිමැවුම් පරිමාණය වැඩි කිරීමත්, පිරිවැය සීමාකර ගැනීමටත් ලාභ ආන්තිකය වෙත බලපෑම් කිරීම හා වෙළඳපල පුළුල් කරගැනීමත් තුළින් දේශීය ආර්ථිකය සවිබල ගැන්විය හැකිය. ඉහත ප්‍රස්ථාරය සලකා බැලීමේදී, 2021 වර්ෂයේ ඉංජිනේරු අංශයේ වාත්තු ඒකකයේ නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන අතර මෙම ඒකකය, දේශීය කර්මාන්ත අමුද්‍රව්‍ය වශයෙන් යොදා ගන්නා මූලික ලෝහ නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ අබලි ලෝහ ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණය හඳුන්වා දී ඇති ප්‍රධානතම ඒකකය වශයෙන් කටයුතු කරනු ලබයි. මෙම සමස්ත ක්‍රියාවලියත් සමඟ ඉංජිනේරු අංශයේ බලාපොරොත්තුව වන්නේ ලෝහ ආනයනය සීමා කිරීම තුළින් ගෝලීය වෙළෙඳපොළ සමඟ තරඟ කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ මිල තරඟකාරී ලෝහ නිෂ්පාදන නිපදවීමත් අබලි ලෝහ ආශ්‍රිත නිෂ්පාදන අපනයනය වැඩි කිරීමත්ය.

### 4.3.4 ඉංජිනේරු අංශය මඟින් ක්‍රියාත්මක නව ව්‍යාපෘතීන්

(1) මධ්‍යම සංඛ්‍යාත ප්‍රේරක උදුන (MFIF) ආශ්‍රිත සේවා

- කර්මාන්ත ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබාදීම.
- ශ්‍රී ලංකාවේ වාත්තු පුහුණුව ලබා දෙන එකම ආයතනය ලෙස තාක්ෂණික පුහුණු සහ උපදේශන සේවා සැපයීම.
- වාත්තු ආශ්‍රිත නිෂ්පාදන කිරීමේදී නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා නවීන යෙදුම් හඳුන්වා දීමත් දේශීය නිෂ්පාදකයින්ගේ හැකියාවන් වැඩිදියුණු කරගැනීමට ඔවුන්ට අවශ්‍ය සහාය ලබාදීම.

(2) ශ්‍රී ලංකාවේ වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (BPVB)

- බොයිලේරු නිෂ්පාදනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සහ ඊට අදාලව ස්වාධීන පරීක්ෂණ සහතිකයක් නිකුත් කිරීම සඳහා නියාමන ආයතනයක් පිහිටුවීම.
- ජාත්‍යන්තරව පිළිගත් බොයිලේරු නිෂ්පාදන ප්‍රමිතීන් මගින් නියම කර ඇති ආරක්ෂිත මට්ටම් වලට අනුකූල වීම.
- දේශීය බොයිලේරු නිෂ්පාදන කර්මාන්තකරුවන් ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදෙමින් ඔවුන්ගේ නිෂ්පාදන කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.
- වාෂ්ප ජනක යන්ත්‍ර සහ පීඩන ග්‍රාහක පර්යේෂණ මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

(3) ශ්‍රී ලංකාවේ තාක්ෂණික ව්‍යවසායකයින් දිරිගැන්වීම

- ශ්‍රී ලංකාවේ නිපදවන දැනට හඳුන්වාදී ඇති ප්‍රථම විදුලි මෝටර් බයිසිකලයේ වැඩකටයුතු සම්පූර්ණ කිරීම.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ප්‍රථම විදුලි ත්‍රිරෝද රථය සහ විදුලි බලයෙන් ක්‍රියාත්මක වන පැඩල් බයිසිකලය ලියාපදිංචිය සම්පූර්ණ කිරීම.

(4) ශ්‍රී ලාංකීය වෙළඳපොල සඳහා අඩු වියදම් කෘත්‍රිම උපකරණ නිපදවීම

- ආකෘති සැලසුම් කිරීම, පරීක්ෂා කර සායනික අධ්‍යයන සිදු කිරීම සහ එම ආකෘති IDB ඉංජිනේරු කණ්ඩායමේ සහාය ඇතිව NMRA අනුමැතිය සඳහා යොමු කිරීම.
- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට scoliosis ප්‍රතිකාර ක්‍රමය සඳහා අස්ථි බිඳීම් සුව කිරීමට සහ කොඳු ඇට පෙළ සඳහා බාහිරින් සවිකරන මූලාකෘති සැකසීම.
- වෛද්‍ය ක්ෂේත්‍රයේ තාක්ෂණික ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම.

(5) ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම සමඟ එක්ව නව නිෂ්පාදන සංවර්ධනයට සහාය වීම.

(6) මෝටර් රථ අංශය සඳහා පෞද්ගලික පොදු හවුල්කාරිත්ව (PPP) ආකෘතිය හඳුන්වාදීම.

(7) ඇඹිලිපිටියේ පිහිටුවනු ලැබූ කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම.

(8) පෞද්ගලික පොදු හවුල්කාරිත්වය (PPP) ස්ථාපිත කිරීම තුළින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අනුයුක්ත පන්නල කාර්යයාලය මඟින් පවත්වන වැඩමුළුවල කාර්යක්ෂමතාවය ඉහළ නංවාලීම.

## 4.4 කාර්මික ජනපද අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ කාර්මික ජනපද අංශය පිහිටුවීමත් සමඟ මණ්ඩලයකර්මාන්තකරුවන්ගේ (රාජ්‍ය / පෞද්ගලික අංශ) කර්මාන්ත ආරම්භ කිරීම සඳහා සහ ප්‍රතිසංස්කරණය සඳහා සුදුසු ඉඩම් කට්ටි නිර්දේශ කිරීමත් සාදා නිම කළ ගොඩනැගිලි සපයා දෙමින් කර්මාන්ත සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන තිබේ. තවදුරටත් නව කර්මාන්ත පිහිටුවීමට පෞද්ගලික අංශයත් දිරිමත් කිරීම සඳහා පවතින කාර්මික ජනපද වල යටිතල පහසුකම් නංවාලීමට කටයුතු කරනු ලැබේ. කාර්මික සංවර්ධන පනතේ 33(2) (අ) වගන්තිය මඟින් කාර්මික ජනපද පිහිටුවීමට, නඩත්තු කිරීමට සහ පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලයවෙත බලය ලබාදී ඇත. ඒ අනුව, කාර්මික ජනපද අංශයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා ඔවුන්ගේ නව නිෂ්පාදන කර්මාන්ත පිහිටුවීමට අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව සැලසීම සඳහා ඉඩම්, කර්මාන්තශාලා, ගොඩනැගිලි ඇතුළු දේපළ දීර්ඝ බදු පදනම මත ලබාදීමයි.

**කාර්මික ජනපද අංශයේ අනෙකුත් සංවර්ධන වැඩසටහන්**

- 1967 සිට සංවර්ධනය කරන ලද සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 305ක් පමණ වේ. එය ඉඩම් කට්ටි 733 කට බෙදා කර්මාන්තකරුවන් 376 ක් සඳහා වෙන් කර ඇත. කර්මාන්තකරුවන්ට බෙදා දී ඇති සංවර්ධිත බිම් කොටස් වලින් 268ක් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කර ඇති අතර රැකියා අවස්ථා 8322ක් උත්පාදනය කර තිබේ.තවදුරටත් කර්මාන්ත ඒකක 49 ක් ඔවුන්ගේ කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරවල පවතී.කුඩා කාර්මික ජනපද ආශ්‍රිතව දැනට ක්‍රියාත්මක නොවන නේවාසික කටයුතු සඳහා භාවිත කරනු ලැබූ කර්මාන්ත ඒකක 59ක් අහෝසි කිරීමට පියවර ගෙන ඇත.

- කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල පිළිවෙලින් පිහිටි පන්නල සහ ලුණුවිල යන කාර්මික ජනපද 1980දී පිහිටුවන ලදී. තවද, 2020 වසරේ, II වන අදියර යටතේ පන්නල කාර්මික ජනපදයේ අක්කර 6.5ක සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත.

- වසර 30 ක් පුරා මෙරට පැවති සිවිල් යුද්ධය හේතුවෙන් යාපනය දිස්ත්‍රික්කයේ අච්චුවේලි කාර්මික ජනපදය සම්පූර්ණයෙන්ම විනාශ වූ නිසා ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි උපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ අච්චුවේලි කාර්මික ජනපදය නැවත ඉදිකර ප්‍රතිස්ථාපනය කිරීම සඳහා 2013 සහ 2014 වර්ෂවලදී ඉන්දියානු රජය විසින් සහ ශ්‍රී ලංකා රජය විසින් පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 220 ක සහ රුපියල් මිලියන 50 ක මූල්‍ය දායකත්වයක් ලබාදෙන ලදී. ඒ අනුව අච්චුවේලි කාර්මික ජනපදය ප්‍රතිසංස්කරණය කර 2014 වර්ෂයේදී කර්මාන්ත කිහිපයක් ආරම්භ කරමින් නැවත වරක් කාර්මික ජනපදයක් ලෙස ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී.

- මීට අමතරව කර්මාන්ත අමාත්‍යාංශ මඟින් 2018/2019 සංවර්ධන වැඩසටහෙන් II අදියර ආරම්භ කර, අච්චුවේලි කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධනයට රු. මිලියන 100ක් වෙන් කරන ලද අතර ඉන් 95%ක සංවර්ධන කටයුතු අවසන් කර ඇත.

- 2021 වර්ෂයේදී මධ්‍යම පළාතේ පිහිටා ඇති ‘පොත්තපිටියෙහි’ නව කර්මාන්තපුරයක් පිහිටුවීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය කටයුතු කරමින් සිටී.

**4.4.1 වගුව : පලාත් අනුව රට පුරා ව්‍යාප්තව පවතින කාර්මික ජනපද පිළිබඳ විස්තර**

| කාර්මික ජනපද | පලාත |
|---|---|
| ඒකල , හොරණ , වවුලුගල සහ පානළුව | බස්නාහිර පලාත |
| පල්ලෙකැලේ , කළුදැවල සහ කොටගල | මධ්‍යම පලාත |
| පන්නල සහ ලුණුවිල | වයඹ පලාත |
| ගලිගමුව සහ පුස්සැල්ල | සබරගමුව පලාත |
| බද්දෙගම සහ බෙල්අත්ත | දකුණු පලාත |
| නෑගම්පහ සහ මිහින්තලේ | උතුරු මැද පලාත |
| පූන්තොට්ටම් සහ අච්චුවේලි | උතුරු පලාත |
| බුත්තල | ඌව පලාත |

**4.4.1 කාර්මික ජනපද හරහා කර්මාන්තකරුවන්ට ලබාදෙනු ලබන සේවා**

(01) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් සංවර්ධිත බිම් කොටස් සහ ගොඩනැඟිලි පිළිවෙළින් වසර 30 සහ වසර 20 ක දීර්ඝ කාලීන පදනමින් තම ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ආයෝජකයින්ට, ඇගයීම් කමිටුවේ අනුමැතියට යටත්ව බදු දෙනු ලබන අතර මූලික ආයෝජනය අඩු බැවින් ඔවුන් බිම් කොටස් ලබාගැනීමට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

(02) යටිතල පහසුකම් ලබා දීම.

- තෙකලා විදුලිය සහ අභ්‍යන්තරව විදුලිය බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- ජල සැපයුම, ජලය ගබඩා කිරීම සහ බෙදා හැරීමේ පද්ධතියක් පැවතීම.
- සන්නිවේදන සේවාවක් ලෙස ටෙලිකොම් පහසුකම් ලබාදීම.
- ප්‍රවාහන පහසුකම් සහ අභ්‍යන්තර මාර්ග සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ලබා ගත හැකි වීම.

(03) අනෙකුත් ආධාරක සේවා පහසුකම් පැවතීම.

කාර්මික ජනපද වල මූලික යටිතල පහසුකම් හැරුණු විට, ව්‍යාපාරික ගණුදෙනු සඳහා පහසුකම් සැලසෙන තැපැල් කාර්යාල, ආපනශාලා, පොලිස් මුරපොල ආදිය පිහිටා තිබීම.

(04) අපජලය හා කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිය (කාණු, මෑන්හෝල්, පොම්පාගාර ආදිය).

(05) IDB කාර්මික ජනපද සඳහා අඛණ්ඩව ආරක්ෂණ සේවා සපයයි.

(06) කර්මාන්තකරුවන්ට බදු දී ඇති දේපල පිළිබඳ කල්බදු අයිතිය බැංකු සමඟ තබා ගනිමින් ණය පහසුකම් සැලසීම.

(07) කාර්මික ජනපදයන්හි පරිපාලන හා නඩත්තු අවශ්‍යතා සඳහා අඛණ්ඩව මැදිහත් වීම.

(08) සියලුම කාර්මික ජනපද ආශ්‍රිතව පරිසර හිතකාමීව නඩත්තු කටයුතු පවත්වාගෙන යාම පිළිබඳ අවශ්‍ය අධීක්ෂණය සහ මෙහෙයවීම ලබා දීම.

(09) රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත වටිනාකම් අනුව මාසික පදනමින් බදු දී ඇති කාර්මික ජනපදවල ඉඩම් කට්ටි/ගොඩනැගිලි සඳහා කර්මාන්තකරුවන්ගෙන් මාසික කුලිය ලබා ගැනීමට කටයුතු කිරීම.

- කොන්දේසි කඩ කරන කර්මාන්තකරුවන්ට එරෙහිව පියවර ගැනීම.

- අනෙකුත් IDB අංශ විසින් සංවිධානය කරනු ලබන වාර්ෂික ප්‍රදර්ශන, තරඟ සහ වැඩමුළු සඳහා කර්මාන්තකරුවන් සහභාගි කර ගැනීම.

- නව කාර්මික ජනපද පිහිටුවීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම සහ අත්පත් කර ගැනීම.

### 4.4.2 කාර්මික ජනපද ඒකක සඳහා කර්මාන්තකරුවන් තෝරා ගැනීම

2021 වසර තුළදී ව්‍යාපාරික ශක්‍යතාව සැලකිල්ලට ගනිමින් හඳුනාගත් කර්මාන්තකරුවන් අතුරින් දැනට පදිංචිව සිටින කර්මාන්තකරුවන්ගෙන් සහ නව ඉඩම් කට්ටි, ඉදිකරන ලද ගොඩනැගිලි ආදිය ලබා ගැනීමට බලාපොරොත්තු වන නව ආයෝජකයින්ගෙන් ලැබුණු අයැදුම්පත් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන ලදී.

*4.4.2 වගුව : 2021 වර්ෂය තුළ පිහිටුවන ලද කර්මාන්ත*

| කාර්මික ජනපදය | ඉඩම් කට්ටි / ගොඩනැගිලි වෙන් කරදීම් | අලුතින් ආරම්භ කරන ලද කර්මාන්ත | |
|---|---|---|---|
| | | කර්මාන්ත | රැකියා සංඛ්‍යාව |
| අච්චුවේලි | 2 | 1 | 30 |
| කොටගල | 4 | 1 | 16 |
| ඒකල | 1 | 1 | 23 |
| වවුලුගල | - | 1 | 9 |
| පල්ලෙකැලේ | - | 1 | 34 |
| ගලිගමුව | - | - | - |
| පූන්තොට්ටම් | 2 | 1 | 10 |
| පානළුව | - | 1 | 12 |
| කළුදැවල | 3 | 1 | 19 |
| හොරණ | - | 1 | 18 |
| පන්නල | 1 | | |
| බුත්තල | 1 | | |
| **එකතුව** | **14** | **09** | **172** |

### 4.4.2 කාර්මික ජනපද අංශයේ 2021 වර්ෂයට අදාල ප්‍රගතිය

නව කොරෝනා වෛරස් රෝගය (COVID-19) වර්තමානය වන විට ලොව පුරා සැලකිය යුතු ලෙස ව්‍යාප්ත වී ඇත. ඒබැවින් 2019-2021 කාලපරිච්ඡේදය තුළ වසරේ සංචාරක සීමා පැනවීම් සහ නිවසේ සිට වැඩ කිරීමේ කාලසීමාවන් හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/අපනයන හා කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රබල බිඳවැටීමක් දක්නට ලැබුණි. නමුත් සමාජයේ ජීවන රටාව වෙනස් වීමත් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට නවෝත්පාදන තුළින් මෙරට ඇඟලුම්, කෘෂිකාර්මික නිෂ්පාදන සහ පිසූ ආහාර ද්‍රව්‍ය සැපයීමට වැඩි වැඩියෙන් අවස්ථාව උදා වී ඇත. සමස්තයක් ලෙස කොවිඩ් වයිරසය පැතිරීම සංවර්ධන අවධියේ පසු වන කර්මාන්තකරුවන්ට මුහුණ දීමට සිදු වූ විශාල අභියෝගයක් වේ.

➢ **කල්බදු ගිවිසුම් අත්සන් කිරීම**


කාර්මික සංවර්ධන මණ්ඩලය සමඟ ගිවිසුම් කඩ කිරීමකින් තොරව තම ව්‍යාපාර කටයුතු සිදු කළ කර්මාන්තකරුවන් සමඟ ඉඩම් සහ ඉදිකර නිම කරන ලද ගොඩනැඟිලි සඳහා පිළිවෙලින් වසර 30ක සහ 20ක කාල පරිච්ඡේද සඳහා වන කල්බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ඒ අනුව, 2021 වර්ෂයේ දී කර්මාන්තකරුවන් සමඟ කල්බදු ගිවිසුම් 21ක් අත්සන් කර එමඟින් රු. 487,168ක මුදලක් අයකර ගැනීමට හැකි විය.

➢ **බදු කුලී ආදායම එකතු කිරීම**

බදු දී ඇති ඉඩම් සහ ගොඩනැගිලි සඳහා 2021 වර්ෂය තුළ එකතු කරන ලද මාසික/වාර්ෂික බදුකුලිය, ජල ගාස්තු සහ හිඟ මුදල් ආදායම රු.මිලියන 77කි. එකතු කිරීම් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන චක්‍රීය අරමුදල, බදු ගැනුම්කරුවන්ගෙන් වසර තුනක ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස අයකර ගනු ලැබේ. එබැවින් 2021 වර්ෂය අවසානයේදී චක්‍රීය අරමුදලේ සමුච්චිත අගය රු.මිලියන 9.5 කි.

| **4.4.3 වගුව : 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රගති සමාලෝචනය** | | | |
|---|---|---|---|
| **අංකය** | **ක්‍රියාකාරකම්** | **කාර්ය සාධන දර්ශකය** | **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.)** |
| 1 | කාර්මික ජනපද හරහා ආදායම් උත්පාදනය | බදු කුලී ආදායම | 40,976,812 |
| | | ජල ගාස්තු | 3,121,831 |
| | | බදු ගිවිසුම් අත්සන් කිරීම | 487,168 |
| | | ඉඩම් අගය කිරීමේ ගාස්තු (මාරු කිරීම) | 1,950,000 |
| 2 | ණය එකතු කිරීම සහ චක්‍රීය අරමුදල් පිහිටුවීම | හිඟ මුදල් සහ අනෙකුත් අයකිරීම් | 30,471,985 |
| | | IEs නඩත්තු කිරීම සඳහා චක්‍රීය අරමුදල ස්ථාපිත කිරීම | 9,550,037 |
| **එකතුව** | | | **86,557,834** |

**4.4.1 ප්‍රස්ථාරය : කාර්මික ජනපද අංශයේ වර්ෂය අවසානයට ප්‍රගතිය**




කාර්මික ජනපද අංශය විසින් දැනට පවතින යටිතල පහසුකම් නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා, රේඛීය අමාත්‍යාංශය හරහා රජයේ භාණ්ඩාගාරයෙන් කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 41 කට ආසන්න මුදලක් වැය කර ඇත. අව්වුවේලි කාර්මික ජනපදයේ අක්කර 16 ක භූමි ප්‍රමාණයක් තවදුරටත් සංවර්ධනය කරමින් පවතින අතර මීට ප්‍රධාන වශයෙන් රජයට අයත් ඉදිකිරීම් සංවිධාන දායක වී ඇති අතර මෙම ව්‍යාපෘති බොහොමයක් 2015 වසරේ සිට ක්‍රියාත්මක වේ.


එහි විස්තර පහත පරිදි වේ.

**4.4.1 වගුව : 2021.12.31 දිනට IDB කාර්මික ජනපදවල යටිතල පහසුකම් නවීකරණය සහ වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගති වාර්තාව**

| අයවැය වෙන් කිරීම 2021 | | කාර්මික ජනපදයේ නම | ක්‍රියාකාරකම | ඇස්තමේන්තුගත පිරිවැය (රු.) | මූල්‍ය හා භෞතික ප්‍රගතිය 31.12.2021 | |
|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය |
| මිලියන 60 | **ක්‍රියාත්මක වෙමින් පවත්නා ව්‍යාපෘති - 2020** | | | | | |
| | 1 | පුස්සැල්ල | අභ්‍යන්තර කාණු ඉදිකිරීම | 202,846.83 | 202,846.83 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් වී ඇත. |
| | **නව ව්‍යාපෘති - 2021** | | | | | |
| | 1 | ඒකල | ජල මෝටර් පොම්ප 02 ක් ස්ථාපිත කිරීම, ජල නල එලීම. රැහැන්ගත කිරීම, ප්‍රධාන පුවරු සහ අදාළ උපාංග සවි කිරීම. | 1,511,730.00 | 302,346.00 | රු.1,209,384 ශේෂය, 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකරගනු ලැබේ. |
| | | | පරිපාලන ගොඩනැගිල්ල, නිල නිවාස, පොලිස් තැපැල් සහ තැපැල් කාර්යාල ගොඩනැගිල්ල යනාදිය අලුත්වැඩියා කිරීම. | 8,279,766.03 | 7,742,224.34 | ඉදිකිරීම්වලින් 95% ක් අවසන් වී ඇත. ශේෂය 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකර ගනු ලැබේ. |
| | | | නව කාණු ඉදිකිරීම | 8,654,215.04 | 8,075,417.04 | ඉදිකිරීම්වලින් 95% ක් අවසන් වී ඇත. ශේෂය 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකර ගනු ලැබේ. |
| | 2 | පල්ලෙකැලේ | ජල මෝටර් පොම්ප සහ ජල නල එළීම, රැහැන් ඇදීම, ප්‍රධාන පුවරු සහ අදාළ උපාංග සවි කිරීම. | 479,050.00 | 95,810.00 | රු.383,240.00 ශේෂ ගෙවීම 2022 අයවැය ප්‍රතිපාදනයෙන් සිදු කරගනු ලැබේ. |
| | | | කාර්යාලීය වැසිකිළිය ඉදිකිරීම | 708,373.51 | 648,214.80 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් වී ඇත. |
| | 3 | අච්චුවේලි(දෙවන අදියර) | අභ්‍යන්තර මාර්ග සහ කාණු පද්ධතිය ඉදිකිරීම (දෙවන අදියර) | 17,789,621.65 | 17,789,621.65 | ඉදිකිරීම්වලින් 95% ක් අවසන් වී ඇත. ශේෂය 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකර ගනු ලැබේ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | 4 | පන්නල | බෝක්කු ඉදිකිරීම සහ කාණු අලුත්වැඩියා කිරීම (පළමු අදියර) | 1,436,292.00 | 1,221,090.00 | ඉදිකිරීම්වලින් 85% ක් අවසන් වී ඇත. ශේෂය 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකර ගනු ලැබේ. |
| | 5 | නැගම්පහ | දැනට පවතින කාර්මික ජනපදයන්හි ඉඩම් එළි පෙහෙළි කිරීම, සමතලා කිරීම සහ සීමා නිර්ණය කිරීම | 434,500.00 | 434,500.00 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් කර ඇත. |
| | | | | 315,000.00 | 299,250.00 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් කර ඇත. |
| | | | ආරක්ෂක මුරපොළ, කාර්යාලය සහ නානකාමරය ඉදිකිරීම | 1,631,417.60 | 1,547,884.41 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් කර ඇත. |
| | 6 | ගලිගමුව | නව ජල මෝටර් පොම්පයක් ස්ථාපනය කිරීම, ළිඳ, පොම්පාගාරය සහ ආරක්ෂක කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම. | 44,800.00 | 44,800.00 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් කර ඇත. |
| | 7 | පූන්තොට්ටම් | වැටක් ඉදිකිරීම සහ පවතින ජල ටැංකිය අලුත්වැඩියා කිරීම. | 2,340,360.00 | 2,044,147.77 | ඉදිකිරීම්වලින් 85% ක් අවසන් වී ඇත. ශේෂය 2022 අයවැය ප්‍රතිපාදනයෙන් අයකර ගනු ලැබේ. |
| | 8 | පානළුව | ජල ටැංකි ව්‍යූහය, කාර්යාලීය ගොඩනැගිල්ල, මෝටර් කාමරය සහ ආරක්ෂක මුරපොළ අලුත්වැඩියා කිරීම. | 2,776,177.80 | 2,451,404.79 | ඉදිකිරීම් සහ ගෙවීම් අවසන් කර ඇත. |
| | | | ජල පහසුකම් ලබා ගැනීම සඳහා නල පද්ධතියක් සැකසීම. | | | |
| | | | **එකතුව** | **46,604,150.46** | **41,749,130.62** | |

**4.4.1 රූපය : මෙරට කාර්මික ජනපදවල පිහිටීම**




*** කාර්මික ජනපද 18ක් අතරින් දැනට 16 ක් ක්‍රමවත්ව ක්‍රියාත්මක වන අතර බෙලිඅත්ත සහ බද්දේගම යන*

## 4.5 තාක්ෂණික සේවා අංශය

තාක්ෂණික සේවා අංශය නැගී එන කර්මාන්තකරුවන් මෙන්ම දැනට පවතින කර්මාන්ත සඳහා ඒවා පුළුල් කිරීම, නවීකරණය කිරීම, විවිධාංගීකරණය කිරීම, ගුණාත්මකතාවය සහ ඵලදායීත්වය ඉහළ නැංවීම සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහාය සපයා දීමට බැඳී සිටින අංශයකි. එයට අමතරව මෙම අංශය ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාවයට අනුව ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල් සහ කෙඳි, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන අංශ පදනම් කර ගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම, උපදේශක සේවා සපයා දීම සහ මාර්ගෝපදේශනය සපයා දීම සිදු කරයි. තාක්ෂණ සේවා සපයා දීමේදී හැකි උපරිම කාර්යක්ෂම, ඵලදායී සහ නවෝත්පාදන ක්‍රම වලින් අර්ථවත් තොරතුරු ලබා ගැනීම, සංවිධානය කිරීම, සංරක්ෂණය කිරීම, පවත්වාගෙන යාම සහ එම තොරතුරු මගින් නැගී එන කර්මාන්තකරුවන්ට සහාය දීම මෙහි ප්‍රධාන අරමුණු වේ.

### 4.5.1 2021 වර්ෂයේදී මෙම අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් පහත පරිදි වේ.

**(1) නව නිෂ්පාදන වාණිජකරණය කිරීමේදී කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම.**
**(උසස් තාක්ෂණික උපදේශන සේවා)**

නැගී එන ආහාර නිෂ්පාදන කර්මාන්තයක් වන තලාව ප්‍රදේශයේ ලක්මී අපනයන (පුද්.සමාගම), සිය නිෂ්පාදන පරාසය පුළුල් කිරීමට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි සහාය ඉල්ලා ඇත. ඒ අනුව, මෙම අංශය සඳහා වන ශ්‍රමිකයන් වෙනුවෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, ගොරකා පේස්ට් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ අභ්‍යන්තර පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී.

**(2) තාක්ෂණික පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන පැවැත්වීම.**

තාක්ෂණික සේවා අංශය තුළ සහ ඉන් පිටත ආහාර, රසායනික ද්‍රව්‍ය, තෙල්, තන්තුසහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන උප අංශ යටතේ තාක්ෂණ හුවමාරු වැඩමුළු **28**ක්පවත්වන ලද අතර, සමස්ත පුද්ගලයන් **668** දෙනෙකු පුහුණුවීම් සඳහා සහභාගී විය. මෙම වැඩමුළු තුළින් රු. **2,223,600/-** ක ආදායමක් උපයා ගැනීමට හැකි විය.

**(3) උණ බම්බු නිෂ්පාදන සංවර්ධන සහ පුහුණු මධ්‍යස්ථානය**

- මෑතකදී ස්ථාපිත උණ බම්බු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය විසින් නිෂ්පාදිත මුළුතැන්ගෙට අවශ්‍ය උණ බම්බු උපකරණ සහ කාර්යාල උපාංග පෙළක් සංවර්ධනය කර ඇති අතර ඒවා මණ්ඩලයෙහි "ලක්කම්" අලෙවි මධ්‍යස්ථානය හරහා අලෙවි කිරීම සඳහා කටයුතු කර ඇත. මෑතකදී උණ බම්බු ආශ්‍රිතව හඳුන්වා දුන් නිෂ්පාදන අතර කැපීමේ පුවරු, පෑන් රඳවනයන් සහ තේ කෝප්ප කට්ටල අඩංගු විය.
- දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි "උණ ගස සංරක්ෂණය කිරීමේ තාක්ෂණය" පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩමුළුවක්, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයින් **29** දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි "උණ බම්බු හස්ත කර්මාන් තතාක්ෂණය" පිළිබඳ තාක්ෂණ හුවමාරු වැඩමුළුවක්, දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුද්ගලයින් **31** දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

### 4.5.2 අනෙකුත් විශේෂිත ව්‍යාපෘති

#### (1) ශ්‍රී ලංකාවේ හඳුන්කුරු කර්මාන්ත සංවර්ධනය

"මහවැලි ගඟේ ඉහළ ජල පෝෂක ප්‍රදේශය තුළ උණ බම්බු පිළිබඳ ජී.පී.එස්. සම්පත් සමීක්ෂණය"

හඳුන්කුරු නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දේශීයව පවතින නමුත් ශ්‍රී ලංකාව හඳුන්කුරු නිෂ්පාදනය සඳහා භාවිත කරන උණ බම්බු ආනයනය කිරීම සඳහා වාර්ෂිකව විශාල විදේශ විනිමයක් වැය කරනු ලැබේ.එබැවින් හඳුන්කුරු නිෂ්පාදනය සඳහා අවශ්‍ය ප්‍රමාණයේ උණ බම්බු දේශීයව නිෂ්පාදනය කිරීමට පහසුකම් සැලසීම සඳහා අදාළ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සාමාජිකයන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් කර්මාන්ත අමාත්‍යාංශය කේන්ද්‍ර කර ගනිමින් පිහිටුවා ඇත. මෙම ව්‍යාපෘතියේ තිරසාර බව සහතික කිරීම සඳහා ප්‍රථමයෙන් ශ්‍රී ලංකාවේ දැනට පවතින උණ බම්බු සම්පත් හඳුනා ගැනීම ඉතා වැදගත් වන බැවින්, ශ්‍රී ලංකාවේ වැඩිම උණ ගස් හෙක්ටයාර් ප්‍රමාණයක් ඇති මහවැලි ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින උණ ගස් තක්සේරු කිරීම සඳහා "**ජී.පී.එස්.** සම්පත් සමීක්ෂණ" සිදු කිරීමට කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූ විද්‍යා අංශයෙන් උපදෙස් ලබාගෙන ඇත.

#### (2) ශ්‍රී ලංකාවේ උණ බම්බු නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය සඳහා වන ව්‍යාපෘති යෝජනාව

සමස්ත ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ හඳුන්කුරු නිෂ්පාදන කර්මාන්ත අංශය දියුණු කිරීම සහ දේශීය හඳුන්කුරු නිෂ්පාදන කර්මාන්තයෙන් උණ කුරු සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා 2023 වන විට ශ්‍රී ලංකාව තුළ උණ කුරු නිෂ්පාදන කර්මාන්ත 16 ක් පිහිටුවීමට සහාය දැක්වීමයි.

### 4.5.3 අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම්

#### (1) තාක්ෂණික වාර්තා සකස් කිරීම

පහත සඳහන් අංශ ආවරණය වන පරිදි කර්මාන්තකරුවන් විසින් කරන ලද ඉල්ලීම් කිහිපයක් සලකා බලා පහත නම් සඳහන් තාක්ෂණික වාර්තා අටක් (08) ක් සකස් කරන ලදී.

- කාබනික පොහොර, පොල් මද මිශ්‍රණයන්, වර්ජින් පොල්තෙල්, පොල් වතුර ඇසුරුම් කිරීම, සත්ව ආහාර, තක්කාලි සෝස්, සම්පීඩිත සිමෙන්ති සෙවිලි උළු සහ විජලනය කරන ලද එළවළු.

#### (2) ව්‍යාපෘති යෝජනා සකස් කිරීම

- **කාබනික සහතික ලබා ගැනීම සඳහා මූල්‍ය ප්‍රදාන ක්‍රමයක් ස්ථාපිත කිරීම පිළිබඳ ව්‍යාපෘති යෝජනාව.**

සමස්ත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ 2022 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ආහාර සැකසුම්කරුවන්, හසුරුවන්නන්/වෙළෙඳුන් සහ අපනයනකරුවන් 25 දෙනෙකුට කාබනික සහතික ලබා ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීමයි.

#### (3) නිෂ්පාදන සංවර්ධන කටයුතු

කෝමාරිකා සාරයෙන් නිෂ්පාදිත ආලේපන සැකසීම, මාබල් සබන්, ඖෂධීය ජෑම් සහ ලුණු ද්‍රාවණයේ ගිල්වන ලද ඉන්නල (බෝතල් කරන ලද) පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

### (4) දැත් සනීපාරක්ෂක විකිණීමෙන් ලද ආදායම


**TSD** විසින් **WHO** මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කරන ලද දියර දැත් සනීපාරක්ෂක විකිණීමෙන් උපයාගත් ආදායම රු. **1,445,500/-**කි. මෙහි ප්‍රධාන ගැනුම්කරු වූයේ පරන්තන් කෙමිකල් (පුද්ගලික) සමාගමයි.

### (5) කර්මාන්ත අංශයේ සංවර්ධන රැස්වීම්වලට සහභාගී වීම

කර්මාන්ත සංවර්ධනය සඳහා ජාතික කාර්මික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අරමුණින් හඳුනාගත් ප්‍රමුඛතා අංශ කිහිපයක් සඳහා 2021 දී කර්මාන්ත අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද අංශ සංවර්ධන රැස්වීම් කිහිපයකට (කුළු බඩු සැකසුම් අංශය, රූපලාවන්‍ය කර්මාන්ත අංශය සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන අංශය) තාක්ෂණික සේවා අංශයේනිලධාරීන් පිරිසක් සහභාගී විය.

4.5.1වගුව :2021වර්ෂයේ ආදායම් සාරාංශය


| අංකය | ක්‍රියාකාරකම | ආදායම (රු.) |
|---|---|---|
| 01 | නව නිෂ්පාදන වාණිජකරණය කිරීමේදී කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම. | 35,650.00 |
| 02 | තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් / වැඩමුළු / ආදර්ශන පැවැත්වීම. | 2,223,600.00 |
| 03 | තාක්ෂණික වාර්තා සකස් කිරීම | 15,000.00 |
| 04 | අත් සනීපාරක්ෂක විකිණීම. | 1,445,500.00 |
| 05 | උණ බම්බු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය - තාක්ෂණ හුවමාරු පුහුණු වැඩසටහන් පැවැත්වීම. | 69,000.00 |
| | **එකතුව** | **3,788,750.00** |




**4.5.1 ප්‍රස්තාරය : අංශයේ ආදායම් වර්ගීකරණය**

*4.5.2 වගුව : ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම*

| වර්ෂය | ආදායම (රු.) |
|---|---|
| **2019** | 18,607,832 |
| **2020** | 8,107,910 |
| **2021** | 3,788,750 |





තාක්ෂණික සේවා අංශයෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු වී ඇත්තේ ව්‍යවසායකයින්ට අවශ්‍ය සහය ලබාදීම සඳහා භෞතික තොරතුරු/සම්පත් සපයා දීමත්, ඒවාසංවිධානය කිරීම, සංරක්ෂණය කිරීම, නඩත්තු කිරීම සහ හැකි උපරිම කාර්යක්ෂම, ඵලදායී හා නව්‍ය ක්‍රමවලින් ඔවුන් වෙත සම්ප්‍රේෂණය කිරීමත් ය. තවද ඔවුන් කර්මාන්තකරුවන් සඳහා වෘත්තීය, විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව සිදු කිරීම වෙනුවෙන් විශේෂීකරණය වී ඇත. මෙම ක්‍රියාකාරකම් සඳහා ඉහළ විශේෂඥ දැනුමක් සහ පුහුණුවක් අවශ්‍ය වන අතර විවිධ කර්මාන්තවල නිරතව සිටින සේවාදායකයින්ට මෙන්ම ගෘහාශ්‍රිත කර්මාන්ත සඳහා උපකාරී වන පුහුණු වැඩසටහන්, උපදේශන සේවා, ව්‍යවසායකයින්ගේ අවශ්‍යතාව අනුව ආහාර, රසායනික, තෙල් සහ තන්තු, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරිගණක තාක්ෂණය යන අංශ මත පදනම් වූ මාර්ගෝපදේශ සේවාවන් සැපයීම සඳහා බැඳී සිටී. 2021 වර්ෂයේදී පැවති කොරොනා වයිරස් රෝගය (COVID-19) හමුවේලෝකයේ ආර්ථික සංවර්ධනයට පෙර නොවූ විරූ සහ අනපේක්ෂිත බලපෑම් රැසක් ඇති කළ අතර ලොව පුරා පාරිභෝගිකයින් සහව්‍යාපාරිකප්‍රජාවන් හට දැඩි සමාජීය සහ ආර්ථිකමය දුෂ්කරතා ඇති කිරීමට හේතු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තාක්ෂණික සේවා අංශයේ ද නියමිත පුහුණු වැඩසටහන් අපේක්ෂිත පරිදි පැවැත්වීමේ නොහැකියාව නිසා පසුගිය අනුප්‍රාප්තික වර්ෂවලට සාපේක්ෂව අංශයේ සැබෑ ආදායම / ප්‍රගතිය අඩුවීමක් 2021 වර්ෂයේ දක්නට ලැබිණි. ලොව බොහෝ රටවල් වසර කිහිපයක් පුරා මෙහි බලපෑම අත්විඳිමින් සිටින අතර වර්තමානය වන විට සියලුම ව්‍යාපාර අංශ / කර්මාන්ත මීට අනුවර්තනය වීම තුළින් ව්‍යාපාරික අවස්ථා හඳුනා ගනිමින් නව්‍යකරණයන් වෙත යොමු වීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටී.

### 4.5.4 කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ආහාර රසායනාගාරය

රසායනාගාර මෙහෙයුම් කටයුතු සිදු කර ඇත්තේ ආහාර රසායනාගාරයේ (පහළ මහලේ) රසායනික රසායනාගාර අංශයේ ය. 2021 වර්ෂයේදී ආහාර සාම්පල 475ක් පමණ විශ්ලේෂණය කර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 145කට ආසන්න සංඛ්‍යාවක් සඳහා මෙම රසායනාගාරයෙන් සේවා සපයා දී තිබේ.පළමු මහලේ (ක්ෂුද්‍රජීව විද්‍යාගාරය) සහ 2 වැනි මහලේ (රසායනික රසායනාගාරය) රසායනාගාර යටිතල පහසුකම් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙම ආහාර රසායනාගාරයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ඇතුළු කර්මාන්ත සඳහා රසායනාගාර පරීක්ෂණ සේවා සැපයීමයි. මෙම අංශය ස්ථාපිත කිරීම මඟින් පහත සඳහන් ප්‍රතිලාභ අපේක්ෂා කෙරේ.

- රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුළින් ව්‍යවසායන් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම.
- දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා ආහාර නිෂ්පාදනවල ගුණාත්මක බව නංවාලීම.
- කාර්මික සංවර්ධන මණ්ඩලයේ සේවාවන් ශක්තිමත් කිරීම.
- පාරිභෝගිකයින් සඳහා ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහතික කිරීම.




*රූප සටහන 4.5.1: රසායනික රසායනාගාරය (බිම් මහල) හාක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය (1 වන මහල)*

තවද මෙම අංශය මඟින් රසායනාගාර පරීක්ෂණ (සීනි/ලුණු/මේදය),SLS සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදන ප්‍රමිතීන්, කුළු බඩු, කිරි නිෂ්පාදන, පළතුරු ආශ්‍රිත නිෂ්පාදන, එළවළු ආශ්‍රිත නිෂ්පාදන, රසකැවිලි, මස් සහ මාළු වැනි ආහාර ද්‍රව්‍ය සඳහා පෝෂණ විශ්ලේෂණය වැනි පහසුකම් සපයනු ලැබේ.

### 4.5.5 බාහිර සම්පත් අංශය

**(1) දේශීය හා විදේශීය නියෝජිතායතන සමඟ සහයෝගීව කටයුතු කිරීම.**

ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, **ADB, USAID SL, JICA,** චීන තානාපති කාර්යාලය, ආර්ථික සහයෝගිතා සඳහා ඉරාන ඒකාබද්ධ කොමිසම **(JCEC)** වැනි දේශීය හා විදේශීය ආයතන සමඟ බාහිර සම්පත් ඒකකය පහත සඳහන් කටයුතු ආරම්භ කර ඇත.

(අ) ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී ඇසුරුම් අංශයේ ධාරිතාව සංවර්ධනය, ජාතික කාර්මික උද්‍යානය, කෘෂි ආහාර සහ මත්ස්‍ය සැකසුම් කලාපය පිහිටුවීම, ශ්‍රී ලංකාව තුළ අර්ධ සන්නායක නිෂ්පාදන කර්මාන්ත පිහිටුවීම, උසස් කාර්මික පුහුණු ආයතනය පිහිටුවීමට අදාල ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.

(ආ) ADB හි We-Fi වැඩසටහන සඳහා රාජ්‍ය ආයතනවල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරය තක්සේරු කිරීම.

ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකත්වය නංවාලීමට අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය, (කාන්තා ව්‍යවසායකයින්ගේ මූල්‍ය මුලපිරීම) Women Entrepreneurs Finance Initiative (We-Fi) මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය ක්‍රියාකාරී ආයතනයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ශ්‍රී ලංකා කාර්යාලය විසින් හඳුනාගෙන ඇති අතර දැනට මෙරට කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා කාන්තා ව්‍යවසායකයින්ගේ මූල්‍ය මුලපිරීම (We-Fi) මඟින් මූල්‍ය ප්‍රදාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් පවතී. මෙහි ප්‍රථම පියවර වශයෙන් 2019-2021 වර්ෂයන්ට අදාලව මණ්ඩලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරය තක්සේරු කිරීමක් සිදු කරන ලදී. මෙය සහභාගීත්ව ක්‍රියාවලියක් හරහා ඇගයීම සිදු කරන ලද අතර අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා සහ කණ්ඩායම් සාකච්ඡා වලින් ලබාගත් තක්සේරු වාර්තාව මත පදනම්ව කාන්තා ව්‍යවසායන් සමඟ මණ්ඩලයෙහි කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලද අතර ඒවා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත ද යොමු කරන ලදී.

## 4.6 ක්‍රම සම්පාදන අංශය

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආයතනික ක්‍රමෝපායික සැලැස්ම සැලසුම් කිරීම, සම්පාදනය, අධීක්ෂණය, භෞතික සහ මූල්‍ය ඉලක්කවලට අනුව එක් එක් අංශයන් විසින් ක්‍රියාත්මක සැලසුම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් වේ. එමෙන්ම, රේඛීය අමාත්‍යාංශයේ අවශ්‍යතාවයන්ට අනුව, කාර්යසාධන ඇගයීම්වලට අදාළ තොරතුරු කාලීන වශයෙන් සපයා දීම සඳහා ද මෙම අංශය මැදිහත් වේ.

<u>වර්ෂය තුළදී නිම කරන ලද කාර්යයන්</u>

ව්‍යාපාර අදහසක් හෝ ආකෘතියක් සාර්ථක කර ගැනීමට නම් එම ව්‍යාපෘති ආයතනික අරමුණු සහ අභිමතාර්ථවලට අනුකූල වන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා එම ආයෝජනවල පිරිවැය සහ අනෙකුත් සම්බන්ධතා සලකා බැලීම සහ විශ්ලේෂණය කිරීම අත්‍යාවශ්‍ය වේ. ඉදිරියේ ඇති විය හැකි ගැටළු සහගත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ව්‍යාපෘති යෝජනා සහ සංකල්ප පත්‍රිකා සකස් කිරීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සැලසුම් අංශයට පැවරී ඇති කාර්යයක් වේ.

**4.6.1 කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීම, කර්මාන්තය ආශ්‍රිත සංඛ්‍යාලේඛන යාවත්කාලීන කිරීම සහ ආයතනයේ එක් එක් අංශ සංවර්ධන කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට සහාය වීම.**

කාර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව සමීක්ෂණයක් පැවැත්වීමේ මූලික අදියර වශයෙන්, සැලසුම් අංශය විසින් IDBහි ප්‍රාදේශීය කාර්යයාලවල සහාය ඇතිව දිස්ත්‍රික් මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ තොරතුරු රැස් කර දත්ත ගබඩාවක් සකස් කරන ලදී.අධ්‍යයනයෙන් ආවරණය වන මුළු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංඛ්‍යාව 9000ක් වූ අතර ඒවා විශ්ලේෂණය කර දිස්ත්‍රික් සහ අංශ අනුව (අංශ 20 ලෙස තීරණ ගැනීමේ පහසුව සඳහා) වර්ගීකරණය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් ඇතුළත් සාකච්ඡා පත්‍රිකාවක් සැකසීමට අපේක්ෂා කෙරේ.

4.6.1 වගුව : කර්මාන්ත පිළිබඳ ආංශික වර්ගීකරණය

| අංකය | කර්මාන්ත ක්ෂේත්‍රයන් හි නම් |
|---|---|
| 01 | ඇසුරුම්කරණය සහ කඩදාසි ආශ්‍රිත කර්මාන්ත |
| 02 | සැකසූ ආහාර සහ සහල් ආශ්‍රිත කර්මාන්ත |
| 03 | කුළුබඩු ආශ්‍රිත කර්මාන්ත |
| 04 | කොහු හා තන්තු ආශ්‍රිත කර්මාන්ත |
| 05 | අගය එකතු කළ තේ සහ බීම ආශ්‍රිත කර්මාන්ත |
| 06 | පාවහන්, සම්, සම් නිෂ්පාදන සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 07 | රබර්, ප්ලාස්ටික් සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 08 | ලෝහ, ඩයි සහ අච්චු යන්ත්‍රෝපකරණ මෙවලම් සහ අනුබද්ධ කර්මාන්ත |
| 09 | දැව, දැව ආශ්‍රිත කර්මාන්ත සහ ගෘහ භාණ්ඩ කර්මාන්ත |
| 10 | වාහන එකලස් කිරීම සහ වාහන ආශ්‍රිත කර්මාන්ත |
| 11 | විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 12 | ඖෂධ, දේශීය ඖෂධ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 13 | කළුගල්, උළු, මැටි භාණ්ඩ, පිඟන් මැටි සහ ගොඩනැගිලි ආශ්‍රිත කර්මාන්ත |
| 14 | බෝට්ටු, උපාංග සහ ධීවර ආම්පන්න ආශ්‍රිත කර්මාන්ත |
| 15 | තීන්ත, රසායනික ද්‍රව්‍ය, මුද්‍රණ ද්‍රව්‍ය සහ ආශ්‍රිත කර්මාන්ත |
| 16 | රූපලාවණ්‍ය හා ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 17 | මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත |
| 18 | කිරි සහ කිරි ආශ්‍රිත කර්මාන්ත |
| 19 | ඛනිජ සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |
| 20 | ඇඟලුම්, රෙදිපිළි සහ ඒ ආශ්‍රිත කර්මාන්ත |

දැනට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින බැවින්, ක්‍රම සම්පාදන අංශය විසින් මෙය පුලුල්ව විග්‍රහ වන දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ව්‍යාපෘති යෝජනාවක් ද ඉදිරිපත් කර ඇත. මෙමඟින්, නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාරයක් පුළුල් කිරීමට කැමති ව්‍යවසායකයින්ට / ආයෝජකයින්ට අවශ්‍ය සැපයුම්කරුවන්, ගැනුම්කරුවන්, අපනයනකරුවන් හෝ සේවා සපයන්නන් ගවේෂණය කළ හැකි අතර අවශ්‍ය වූ විට විවිධ කර්මාන්ත අංශයන් පිළිබඳ දළ විශ්ලේෂණයන් ලබා ගැනීමට කර්මාන්තවලට පහසුකම් සපයන අතර කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින ප්‍රවණතා පිළිබඳව තීරණය කිරීමට ද හැකි වේ.

කර්මාන්ත ක්ෂේත්‍රයට උපකාර වන පහත ක්‍රියාකාරකම් සඳහා ද සැලසුම් අංශය වගකීම දරයි.

**4.6.2 පවතින නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනය කිරීම පිළිබඳ අමාත්‍යාංශ මුදල් ලබාගැනීමට ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම.**

2021 වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා පහත දැක්වේ.

**(1) කාබනික සහතිකය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ආහාර සැකසුම්කරුවන් / හසුරුවන්නන් / වෙළෙඳුන් සහ අපනයනකරුවන් හට මූල්‍යමය සහය ලබාදීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම.**

මෙම ව්‍යාපෘති යෝජනාව තාක්ෂණික සේවා අංශය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත වන අතර සමස්ත ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආහාර සැකසුම්කරුවන්, වෙළෙඳුන්/අපනයනකරුවන් 25 දෙනෙකුට 2022 දී කාබනික සහතිකය ලබා ගැනීම සඳහා මූල්‍ය ආධාර සැපයීමයි.

**(2) උසස් කාර්මික පුහුණු ආයතනය**

කාර්මික නිපුණතා සඳහා වන පුහුණුව අත්‍යවශ්‍ය වන බැවින් නිෂ්පාදන කර්මාන්තවල ශ්‍රම බලකායට අවශ්‍ය කුසලතා සහ දැනුම වර්ධනය කිරීම සඳහා මෙය සංවිධානය කර ඇත. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් කාර්මික සංස්කෘතියක් ඇති කිරීම, කර්මාන්ත පදනම් කරගත් කුසලතා සහ දැනුම වර්ධනය කිරීම, උසස් තාක්ෂණික ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම, නිෂ්පාදන හා සේවාවල ශ්‍රම ඵලදායිතාව ඉහළ නැංවීම, නව්‍ය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අධි තාක්ෂණික කර්මාන්ත ශ්‍රී ලංකාව තුළ ඇති කිරීමයි.

**(3) ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී ඇසුරුම් අංශයේ ධාරිතාව සංවර්ධනය**

ඇසුරුම්කරණය නිෂ්පාදන ක්‍රියාවලියක සැපයුම්දාමයේ වැදගත්ම කොටසක් වන අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ කර්මාන්ත සහ අදාළ රාජ්‍ය ආයතන සඳහා පරිසර හිතකාමී ඇසුරුම්කරණ පිළිවෙත් වෙත අනුවර්තනය වීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දෙමින් කර්මාන්ත සවිබල ගැන්වීමයි.

**(4) දේශීය හඳුන්කුරු නිෂ්පාදන කර්මාන්තය සඳහා අවශ්‍ය වන උණකුරු සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා දිවයිනේ හඳුන්කුරු සහ උණකුරු නිෂ්පාදන කර්මාන්ත අංශයන් සංවර්ධනය කිරීම.**

සමස්ත ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ හඳුන්කුරු නිෂ්පාදන කර්මාන්තය දියුණු කිරීම සහ දේශීය හඳුන්කුරු නිෂ්පාදන කර්මාන්තයේ ඉල්ලුම සපුරාලීම සඳහා 2023 වන විට උණ බම්බු නිෂ්පාදන කර්මාන්ත 16 ක් පිහිටුවීම සහ/හෝ ඒ සඳහා සහාය දැක්වීමයි.

**(5)ශ්‍රී ලංකාවේ මෝටර් රථ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය**

දේශීය වෙළෙඳපොළ තුළ වාහන සඳහා ඇති විය හැකි ඉල්ලුම සපුරාලීම සඳහා මෝටර් රථ කර්මාන්ත අංශයේ සංවර්ධනය වෙනුවෙන් මැදිහත් වීමට කර්මාන්ත අමාත්‍යාංශය ප්‍රමුඛත්වය ලබා දී ඇත. ව්‍යාපෘතියේ අනෙකුත් අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ මෝටර් රථ අංශයේ කර්මාන්ත දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා සහාය වීමයි.

**(6)ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරපිළිබඳ තොරතුරු රැස් රැස්කිරීම, දත්ත ගබඩාවක් සැකසීම හා කළමනාකරණය කිරීම.**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථ වන්නේ කර්මාන්ත පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ජාතික මට්ටමින් කර්මාන්ත ක්ෂේත්‍රයේ සමීක්ෂණයක් දියත් කිරීම මගින් විවිධකර්මාන්ත අංශවල වර්තමාන තත්ත්වය සමාලෝචනය කිරීමට සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට භාවිතා කළ හැකි පුළුල් යාවත්කාලීන දත්ත ගබඩාවක් සකස් කිරීමයි.

**(7) නව ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කිරීමේ වැඩසටහනක් හරහා ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය.**

මෙහි ප්‍රධාන අරමුණු වන්නේ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාවගේ ජීවන තත්ත්වය නහා සිටුවීම, ඛනිජ සහ කෘෂිකාර්මික සම්පත් වැනි දේශීය අමුද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම, ගම් මට්ටමින් රට පුරා සාර්ථක ව්‍යවසායකයින් බිහි කිරීම, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීමත්ය.

**(8) මහනුවර දිස්ත්‍රික්කයේ නව කර්මාන්තපුරයක් පිහිටුවීම හරහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වැඩි ආයෝජන අවස්ථා ලබා දීමේ ව්‍යාපෘතිය.**

පෞද්ගලික අංශයේ ආයෝජකයින් නිෂ්පාදන කර්මාන්ත සඳහා ආයෝජනය කිරීමට දිරිමත් කිරීමේ අරමුණින්, මහනුවර, පොත්තපිටිය, කිරිමැටියාවත්ත ප්‍රදේශයේ නව කර්මාන්තපුරයක් පිහිටුවීමට මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර ඇත. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයවිසින් ප්‍රවර්ධනය කරන ලද පොත්තපිටිය කර්මාන්තපුර ව්‍යාපෘතිය මඟින් කර්මාන්තකරුවන්ට නව කර්මාන්ත ඒකක පිහිටුවීමට අවශ්‍ය මූලික පහසුකම්, කර්මාන්තශාලා, නවාතැන් පහසුකම් සහිත ඉඩම් කට්ටි සංවර්ධනය කිරීම සහමනාව සැලසුම් කර ව්‍යුහගත කාර්මික සංවර්ධනයක් සහතික කිරීමටත් අපේක්ෂා කරයි.

**(9) නවීන තාක්ෂණය ලබා දීම තුළින් පාවහන් සහ සම් ආශ්‍රිත කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම.**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පිහිටුවා ඇති පාවහන් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන මධ්‍යස්ථානය (CDLP&F) මඟින්පාවහන් සහ සම් භාණ්ඩ නිෂ්පාදන අංශයට ඉහළ නිමැවුමක් අත්කර ගැනීමට සුදුසු නවීන තාක්ෂණය සහ උසස් කුසලතා හඳුන්වාදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණයි.

**(10) ජාතික කාර්මික උද්‍යානය (කාර්මික පහසුකම් මධ්‍යස්ථානය)**

මෙම ව්‍යාපෘතියේ යෝජිත ප්‍රදේශය ප්‍රධාන කාර්මික උපාය මාර්ගික ස්ථානයක් වන අතර ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ඉංජිනේරු වැඩපොළ-IDB, රත්මලාන දුම්රිය වැඩපොළ, මොරටුව කාර්මික ගෘහභාණ්ඩ නගරය, මොරටුව විශ්වවිද්‍යාලය, රත්මලාන ගුවන්තොටුපළ සහ කාර්මික විද්‍යාල මෙම පරිශ්‍රයට සමීපව පිහිටා ඇත. සේවා සපයන්නන් උපාය මාර්ගික ආකාරයකින් ස්ථානගත කර ඇති අතර මෙය සැලසුම් කර ඇත්තේ කිසිදු භේදයකින් තොරව සියලුම කර්මාන්ත සාර්ථකත්වය කරා ගෙන යාමට පෙළඹවීමක් ලබා දෙන ආකාරයටය.

**(11) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ, රබර් නිෂ්පාදන සංවර්ධනය සහ සේවා මධ්‍යස්ථානයේ (RPD&SC) නිෂ්පාදන අංශය වැඩිදියුණු කිරීම.**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානයේ (RPD&SC) රබර් සංයෝග සැකසීමට අවශ්‍ය පහසුකම් ඉහළ නැංවීම තුළින් වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව දේශීය රබර් ආශ්‍රිත නිමැවුම් ඉහළ නැංවීමට පහසුකම් සැලසීමයි.

මීට අමතරව උපාය මාර්ගික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම්, ප්‍රසම්පාදන හා අයවැය සැලසුම් සකස් කිරීමේ සමස්ත වගකීම සැලසුම් අංශය සතු වේ.තවද අනෙකුත් ක්‍රියාකාරී අංශ මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරුන්ගේ සහ අමාත්‍යාංශයේ තොරතුරු සඳහා වරින් වර ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම ද සිදු කරන අතර ඊට සමගාමීව සැලසුම් අංශයේ අනෙකුත් ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

### 4.6.3 ඉදිරි වර්ෂය සඳහා ආයතනික අයවැය සහ සමස්ත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රාග්ධන අයවැය සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සකස් කිරීමට කටයුතු කිරීම.

ඉදිකිරීම්, ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සහ සංවර්ධන කටයුතු වැනි ප්‍රාග්ධන ආයෝජන සඳහා අරමුදල් වෙන් කිරීමට ප්‍රාග්ධන අයවැය සකස් කරන අතර, සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීමට අවශ්‍ය මෙහෙයුම් සහ නඩත්තු වියදම් සම්බන්ධයෙන් පුනරාවර්තන අයවැය සකස් කරනු ලබයි.

### 4.6.4 ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයසඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.

යම් කාල සීමාවක් තුළ ප්‍රසම්පාදනය කිරීමට අපේක්ෂා කරන සෑම අංශයකම අවශ්‍යතා ලැයිස්තුගත කරනු ලබන වාර්ෂික ලේඛනය ප්‍රසම්පාදන සැලැස්ම වේ. ප්‍රසම්පාදන ලේඛනය, තොරතුරු මත පදනම්ව සකස් කරනු ලබන අතර, එමඟින් කොන්ත්‍රාත් ප්‍රදානය දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සෑම පියවරක්ම සිදු කිරීම සහ අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය, මූල්‍ය ප්‍රභවයන් සහ ප්‍රසම්පාදන ක්‍රමවේදය ස්ථාපිත කරනු ලබයි.

### 4.6.5 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

නිශ්චිත කාල සීමාවක් තුළ සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාකාරකම් ඇතුළුව සෑම අංශයකින්ම මාසිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. කාල සීමාව මාසිකව හෝ වාර්ෂිකව වන අතර නව කර්මාන්ත ආරම්භ කිරීමට සහාය වීම, ක්ෂුද්‍ර කර්මාන්ත පිහිටුවීම, පවත්නා කර්මාන්ත සංවර්ධනය කිරීම, අපනයනය අරමුණු කරගත් කර්මාන්ත ඇති කිරීමට සහාය වීම, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයනු ලබන විශේෂිත සේවාවන් (අභ්‍යන්තර) සහ විශේෂ සේවා (බාහිර) ලෙස එක් එක් අංශයේ කාර්යයන් හෝ ක්‍රියාකාරකම් අරමුණු හයක් යටතේ වර්ගීකරණය කර ඇත.

### 4.6.6 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගනිමින් මාසික, කාර්තුමය සහ වාර්ෂික ප්‍රගති වාර්තා සකස් කිරීම.

එක් එක් අංශය විසින් සපයනු ලබන ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ විස්තර මත පදනම්ව, ඔවුන් විසින් අත්පත් කරගත් ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මාසිකව, කාර්තුමය වශයෙන් සහ වාර්ෂිකව අධීක්ෂණය කර ඇගයීමට ලක් කෙරේ. මණ්ඩලයේ සමස්ත ක්‍රියාකාරකම්වල විකාශනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම සඳහා මණ්ඩලයේ සමස්ත ප්‍රගතිය මූල්‍යමය හා භෞතික වශයෙන් තක්සේරු කෙරේ.

### 4.6.7 මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කිරීම.

ව්‍යාපෘතිවල වැඩ කටයුතු වල ප්‍රගතිය අධීක්ෂණය කිරීමට සහ සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් අංශයන් වලින් සැපයූ දායකත්වය ඇගයීම සඳහා අධ්‍යක්ෂ ප්‍රධානින්ගේ සහභාගීත්වයෙන් යුතුව මාසිකව හා වාර්ෂිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කරනු ලැබේ.

### 4.6.8 වාර්ෂික වාර්තාව සකස් කිරීම

සෑම මුදල් වර්ෂයක් අවසානයේම, ආයතනික ඉතිහාසය පිළිබඳ තොරතුරු සැපයීමට සහ මණ්ඩලයේ සෑම අංශයකම භෞතික ප්‍රගතිය සාරාංශ කිරීමට වාර්ෂික වාර්තාවක් සකස් කරනු ලැබේ. කළමනාකරණ සමාලෝචනය, ආංශීය ප්‍රගතිය, මූල්‍ය කාර්ය සාධනය සහ පසුගිය වර්ෂය තුළ ළඟා කරගත් අනෙකුත් ප්‍රධාන ජයග්‍රහණ ඇතුළු අංශ කිහිපයකින් වාර්ෂික වාර්තාව සමන්විත වේ. පසුගිය වසරේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමේ අරමුණින් අවුරුදුපතා වාර්ෂික වාර්තා සකස්කරනු ලැබේ.

## 4.7 ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය

ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපදේශක සේවා මධ්‍යස්ථානය යනු දැනට තිබෙන කර්මාන්ත පුළුල් කිරීම සඳහා නව කළමනාකරණ ක්‍රමෝපාය හඳුන්වාදීම මඟින් නව ව්‍යවසායකත්ව පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ස්ථාපිත කර ඇති විශේෂ පුහුණු අංශයක් වේ. ව්‍යවසායකත්වය රටෙහි ආර්ථික සංවර්ධනය සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රබල කාර්යභාරයක් ඉටු කරයි. මෙම මධ්‍යස්ථානය මඟින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ සේවා අවශ්‍යතා ඉටුකිරීම සඳහා අවශ්‍ය ව්‍යවසායකත්ව කළමනාකරණ කුසලතා ශක්තිමත් කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව සංවර්ධනය සහ කළමනාකරණ උපදේශන සේවා සැපයීමට නිරතුරුවම කටයුතු කරයි. දේශීය කර්මාන්තකරුවන් වෙත තාක්ෂණික දැනුම සහ ව්‍යාපාර අත්දැකීම් සපයා දීම, තොරතුරු සහ තොරතුරු තාක්ෂණික අවබෝධය ලබාදීම මෙම අංශය මඟින් සපයා දෙනු ලබන අනෙකුත් සේවාවලින් කිහිපයක් වේ.

### 4.7.1 2021 වර්ෂය තුළ සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති

**(1) තොරතුරු තාක්ෂණ ඒකකය සඳහා නව ඩිජිටල් අලෙවිකරණ පහසුකම් මධ්‍යස්ථානයක් වැඩිදියුණු කර පවත්වාගෙන යාම.**



*රූපය 4.7.1*
*මූලාශ්‍රය: IDB පුවත් පත්‍රිකා*

වර්තමාන දේශීය හා ගෝලීය ප්‍රවණතා සලකා බැලීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් කළ හැකි වැදගත්ම අංශයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය සැලකිය හැකිය. කාලයාගේ ඇවෑමෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය බලවත් කාර්මික අංශයක් බවට පත්ව ඇත. ව්‍යවසායකයින් සමඟ වැඩ කරමින් දශක පහක් පුරා ඔවුන්ගේ සංවර්ධනයට දායක වෙමින් IDB හඳුනාගෙන ඇත්තේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අතර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කෙරෙහි යම් ආකාරයක ප්‍රතිරෝධයක් ආරම්භයේ සිටම වර්ධනය වෙමින් පවතින බවයි. එබැවින් CEDACS හි තොරතුරු තාක්ෂණ ඒකකය ලෙස, ඩිජිටල් අලෙවිකරණය, IoT තාක්ෂණය, ජංගම දුරකථන පිළිබඳ තාක්ෂණය, ඊ-වාණිජ්‍යය යනාදී සංකල්ප සඳහා ව්‍යවසායකයින් නිරාවරණය කිරීම වෙනුවෙන් පිහිටුවන ලද නවීන ඩිජිටල් අලෙවිකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත. මෙම මධ්‍යස්ථානය හරහා, IDB සහ අනෙකුත් ජාතික මට්ටමේ අධ්‍යයන සහ වෘත්තීය ආයතන අතර අවබෝධයක් වර්ධනය කර ගැනීම සඳහා ව්‍යවසායකයින්ට ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ ඔවුන්ගේ දැනුම සහ කුසලතා මට්ටම් ඉහළ නැංවීමට පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. අඩු ආදායම්ලාභී සේවාදායකයින්ට සහ අඩු ආදායම්ලාභී කණ්ඩායම්වලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පුහුණු සේවා සැපයීම, විශේෂයෙන්ම කාන්තාවන් සවිබල ගැන්වීම සහ වැඩි දියුණු කළ මූල්‍ය හැකියාවක් සමඟ ආත්ම විශ්වාසයක් සහිත සමාජයේ ස්ථීර පෞරුෂයන් ගොඩනැගීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණු වේ.

**(2) බතික් ඇඳුම් පිළිබඳ පුහුණු පාඨමාලාව**



*4.7.2 රූපසටහන : IDB පුවත් පත්‍රිකා*

**(3) වැලිඔය, සම්පත්නුවර හිදී පවත්වන ලද ඉලෙක්ට්‍රොනික උපකරණ අළුත්වැඩියා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන**



*4.7.3 රූපසටහන : IDB පුවත් පත්‍රිකා*

**(4) මහවැලි සංවර්ධන අධිකාරියේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ඩිජිටල් අලෙවිකරණය සහ පුද්ගලකුසලතා සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන**




*4.7.4 රූපසටහන: IDB පුවත් පත්‍රිකා*


දෙහිඅත්තකණ්ඩිය, මහවැලි 'සී' කලාපයේ සිසුන්, සා/පෙළ සහ උ/පෙළ හැර ගිය සිසුන් සහ අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා ඩිජිටල් අලෙවිකරණය, ඊ-වාණිජ්‍යය සහ පුද්ගල නිපුණතා සංවර්ධනය පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් ව්‍යවසායකත්ව සංවර්ධන අංශයේ තොරතුරු තාක්ෂණ ඒකකය මඟින් පවත්වන ලදී. මෙම පාඨමාලාව මඟින් ෆේස්බුක් ප්‍රචාරණය, ගූගල් ප්‍රචාරණය, යූ ටියුබ් නාලිකාවක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, අනුබද්ධ අලෙවිකරණය, ව්‍යාපාර සඳහා WhatsApp සහ කණ්ඩායම් ඉදිරිපත් කිරීම් යන අන්තර්ගතයන් ආවරණය කෙරිණි.

## 4.7.1 වගුව : ප්‍රගති සාරාංශ වාර්තාව - 2021

| අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිදානය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.) | |
|---|---|---|---|---|---|
| | | | | පිරිවැය | ඉපැයීම් |
| **ක්ෂුද්‍ර කර්මාන්ත පිහිටුවීම** | | | | | |
| 1 | රැකියා විරහිත තරුණ තරුණියන්ට අපේක්ෂිත රැකියා සඳහා අවශ්‍ය කුසලතා (NVQ) ලබා ගැනීමට සහ තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට හැකි වන පරිදි රැකියා උත්පාදනය සහ ව්‍යාපාර නිර්මාණය කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම. | පවත්වන ලද වැඩමුළු ගණන | 15 | 1,122,583 | 1,517,000 |
| | | ආරම්භයට සහය දුන් නව කර්මාන්ත සංඛ්‍යාව | 10 | N/A | N/A |
| | | වෙනත් කර්මාන්තවල නව රැකියා සඳහා යොමු වූ තරුණයින් සංඛ්‍යාව | 30 | N/A | N/A |
| **පවතින කර්මාන්ත දියුණු කිරීම** | | | | | |
| 2 | ඩිජිටල් අලෙවිකරණය / නිපුණතා වැඩිදියුණු කිරීමේ වැඩමුළු / ජංගම දුරකථන පිළිබඳ තාක්ෂණික වැඩමුළු / ජංගම යෙදුම් සංවර්ධනය සහ මාර්ගගතව මුදල් ඉපයීම් පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීම. | පවත්වන ලද වැඩමුළු ගණන | 02 | 196,980 | 295,500 |
| | | වැඩිදියුණුවට පත්කළ කර්මාන්ත ගණන | 03 | N/A | N/A |
| 3 | කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්/ වැඩමුළු/ ආදර්ශන පැවැත්වීම (ව්‍යවසායකත්ව සංවර්ධනය, අලෙවිකරණය සහ මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර ආරම්භය ආදිය). | පවත්වන ලද වැඩමුළු ගණන | 01 | 59,800 | 96,000 |
| | | වැඩිදියුණුවට පත්කළ කර්මාන්ත ගණන | 10 | N/A | N/A |
| **විශේෂිත සේවාවන් (අභ්‍යන්තර)** | | | | | |
| 4 | යන්ත්‍රෝපකරණ පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම, මාර්ගගත, අමුද්‍රව්‍ය, සැපයුම්කරුගේ නාමාවලීන් පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම. | නව ඇතුළත් කිරීම් සංඛ්‍යාව | 541 | N/A | N/A |
| **විශේෂ සේවා (බාහිර)** | | | | | |
| 5 | තොරතුරු, උපදෙස් සහ උපදේශන සේවා සැපයීම / බෙදා හැරීම. | පුද්ගලයන් සංඛ්‍යාව | 338 | 71,645 | 143,330 |
| 6 | "කර්මාන්ත" සඟරාව ප්‍රකාශයට පත්කිරීම. | ප්‍රකාශිත ප්‍රවෘත්ති සඟරා ගණන | 01 | N/A | N/A |
| **එකතුව (රු.)** | | | | **1,451,008.00** | **2,051,830.00** |

4.7.2 වගුව : ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

| වර්ෂය | ආදායම (රු.) |
|---|---|
| 2019 | 3,426,093.00 |
| 2020 | 2,605,850.00 |
| 2021 | 2,051,830.00 |




කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SMEs) දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම මඟින් විරැකියාව සහ දරිද්‍රතාවය අඩු කිරීමෙන් ආර්ථිකයේ වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට දායකත්වය සපයයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වර්ධනයට අභ්‍යන්තර හා බාහිර පරිසරයේ වෙනස්වීම් බලපානු ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට වඩාත් විවෘත පරිසරයකට අනුවර්තනය වීමට සහ සමෘද්ධිමත් වීමට, ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට සහ ගෝලීයකරණය සඳහා වැඩි අවස්ථා ලබා දීම උදෙසා ඩිජිටල් පරිවර්තනය හඳුන්වාදෙමින් වඩාත් ක්‍රියාකාරීව සහභාගී වීමට CEDACs අංශය පියවර ගෙන ඇත. 2020 වසර සලකා බලන විට කොවිඩ් වසංගතය සෑම අංශයකටම විශාල බලපෑමක් එල්ල කළ අතර 2021 මැද භාගයේදී එහි උච්චතම ස්ථානයට පැමිණියේය. මුළු රටම දැඩි ලෙස පීඩාවට පත් කළ එම වසර දෙක තුළ අගුලු දැමීම් සහ වෙනත් සීමාවන් පැවතීම නිසා ආයතනයේ නියමිත වැඩසටහන් බොහොමයක් අවලංගු කරන ලදී. සෞඛ්‍ය ගැටලු හේතුවෙන් ජනතාව වැඩි වශයෙන් රැස්ව සිටින වැඩමුළු වෙත සම්බන්ධ වීමට ව්‍යවසායකයින් දක්වන ලද ප්‍රතිරෝධය හේතුවෙන් තොරතුරු තාක්ෂණ ඒකකය විසින් සැලසුම් කොට තිබූ ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන් බොහෝමයක් අවලංගු කිරීමට ද සිදුවිය. කෙසේ නමුත් CEDACS අංශය එක්ව කටයුතු කර මෙවන් ගෝලීය අර්බුදයක් මධ්‍යයේ වුවද සාමාන්‍ය ප්‍රගතියක් වාර්තා කිරීමට සමත් විය.

## 4.8 අලෙවි අංශය

දේශීය කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත වාණිජමය වශයෙන් පුළුල් කර ගැනීම සඳහා අවශ්‍ය සේවා සහ සහාය සැපයීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ අලෙවි අංශයට පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. එමෙන්ම මෙම අංශය අලෙවිකරණ ක්‍රමෝපාය ස්ථාපිත කිරීම මඟින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශක සේවා ද සපයා දෙනු ලබන අතර දිවයින පුරා සිටින කර්මාන්තකරුවන් සහ ස්වයං රැකියා නියුක්තිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන හාණ්ඩ අලෙවි කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ ක්‍රියාකාරකම් ද සිදුකරනු ලබයි. කර්මාන්ත ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම, 'ලක්කම්' අලෙවි මධ්‍යස්ථානයෙහි අලෙවි පහසුකම් සපයා දීම සහ උපකොන්ත්‍රාත් හුවමාරු සඳහා පහසුකම් සැලසීම ද මෙම අංශය මඟින් ඉටුකරනු ලබන සේවාවන් වේ.

### 4.8.1 *අංශයට පැවරී ඇති ක්‍රියාකාරකම්*

- කර්මාන්ත ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ පැවැත්වීම / ජාතික ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.
- දිවයින පුරා සිටින තෝරාගත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයින් / කාර්මිකයින් මෙන්ම ස්වයං රැකියාලාභීන් සඳහා ජාතික සම්මාන උළෙල සංවිධානය කිරීම.
- "ලක්කම්" අලෙවි මධ්‍යස්ථානයේ විකුණුම් පහසුකම් සැපයීම.
- උප කොන්ත්‍රාත් හුවමාරුව සඳහා පහසුකම් සැලසීම.
- වාත්තු, ලුහු ඉංජිනේරු, කම්මල්කරුවන් සහ අනෙකුත් ලෝහ වාත්තු සහ අත්කම් කර්මාන්තවල නියැලී සිටින කර්මාන්තකරුවන්ට සහනදායී මිල ගණන් යටතේ අමුද්‍රව්‍ය / අඛලි ද්‍රව්‍ය ලබා දීම.
- කර්මාන්ත / MSMEs ප්‍රවර්ධනය සහ සංවර්ධනය සඳහා අලෙවිකරණ සහාය සහ උපදේශන සේවා සැපයීම.

### 4.8.2 2021 වර්ෂයේදී කාර්ය සාධනය



### (1) අලෙවිකරණ සහාය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඒක් ඒක් අංශයන්හි ක්‍රියාකාරකම්වලින් ආයතනයේ අපේක්ෂිත අරමුණු සපුරා ගන්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා සෑම ක්‍රියාකාරකමක් ම ඇගයීමට ලක් කිරීම වැදගත් වේ. අලෙවි අංශය මඟින් කර්මාන්තකරුවන් වෙත පහත ක්ෂේත්‍ර හරහා අලෙවිකරණ සහාය ලබාදීමට බැඳී සිටී.

* **ලක්කම් අලෙවි මධ්‍යස්ථානය**



*4.8.1 රූප සටහන : කාර්මික සංවර්ධන මණ්ඩලීය මාධ්‍ය ඒකකය*

මෙම මධ්‍යස්ථානය සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික නිෂ්පාදනවල ඵලදායීත්වය නගාසිටුවීමේ අරමුණ ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට ප්‍රදර්ශන සහ අලෙවි පහසුකම් සපයා දෙන අතර ම නැගී එන ව්‍යවසායකයින්ට දේශීය සහ අන්තර්ජාතික වෙළඳ පොළ වෙත ළඟා වීම සඳහා ද පහසුකම් සලසා දෙයි. මෙම මධ්‍යස්ථානය ව්‍යවසායකයින්ට ඔවුන්ගේ අලෙවි කළ හැකි නිෂ්පාදන තරඟකාරී මිල ගණන් යටතේ අලෙවි කිරීම සඳහා විකුණුම් වේදිකාවක් සපයන අතරම ඒ සඳහා අවශ්‍ය සේවාවන් සපයයි. මෙමඟින් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ දීප ව්‍යාප්තව විකුණුම් සඳහා අවශ්‍ය වෙළඳපොළ ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරන අතර නිෂ්පාදකයින්ගේ දේශීය නිෂ්පාදන "ලක්කම් ලාංඡනය" යටතේ ප්‍රදර්ශනය කිරීමට අයකාශය උදා වේ. එම නිෂ්පාදන කාණ්ඩ පහක් යටතේ දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොලේ අලෙවි කිරීමට පහසුකම් සලසා ඇත. ඒවා නම්, සාම්ප්‍රදායික වට්ටෝරු යටතේ නිෂ්පාදිත ආහාර නිෂ්පාදන, ඔසු නිෂ්පාදන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා යන්ත්‍රෝපකරණ, අත්යන්ත්‍ර / සම්ප්‍රදායික ඇඟලුම් සහ හස්ත කර්මාන්ත සහ විසිතුරු භාණ්ඩ වන අතර ලක්කම් අලෙවි මධ්‍යස්ථානයේ 2021 වසරේ සමස්ත ආදායම රු.17,574,790.60 කි. විවිධ කාණ්ඩවලට අයත් වන සාම්ප්‍රදායික සහ වෙනත් නිෂ්පාදන සඳහා ප්‍රධාන පෙළේ අලෙවිකරුවෙකු වශයෙන් ලක්කම් අලෙවි මධ්‍යස්ථානය පසුගිය දශක තුනක කාලය පුරා සිය සේවා සපයා දී ඇත.

* **උප කොන්ත්‍රාත් හුවමාරුව (SCX)**

1982 සිට ලෝක බැංකුව විසින් රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල සම්බන්ධීකරණයෙන්, අලෙවි අංශයේ උප-කොන්ත්‍රාත් හුවමාරුව (SCX) වෙත අරමුදල් සපයනු ලැබේ. උප කොන්ත්‍රාත් හුවමාරුව යටතේ අලෙවි අංශය කාර්යාලීය ලී බඩු, කාර්යාලීය පුටු සහ සෝෆා, සම් සපත්තු, සෙරෙප්පු සහ බෑග්, රබර් ආශ්‍රිත අමතර කොටස්, ටී-ෂර්ට්, ලිපිද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර සහ ෆයිබර් වැනි තෝරාගත් අයිතම සඳහා කර්මාන්තකරුවන් / සේවා සපයන්නන් වෙනුවෙන් ඇණවුම් ලබා ගැනීම පිණිස මිල ගණන් ඉදිරිපත් කරනු ලැබේ.

### (2) උපදේශන සේවා

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මඟින් දිගු කාලීනව වඩාත්ම ලාභදායී උපාය මාර්ගික සැලසුම් සකස් කර ඇති අතර, එක් එක් අංශයන් විසින් සකස් කරන ලද සැලසුම් මණ්ඩලයේ සමස්ත උපායමාර්ගික සැලසුම් සමඟ සමපාත විය යුතුය. එෙලස මණ්ඩලෙය් ප්‍රගතිය අෙනකුත් අායතන සමඟ සැසඳීම මඟින් වෙළඳපල සහ තරඟකාරිත්වය හමුවේ ආයතනයේ ස්ථාවරය දැනගැනීමට හැකියාව පවතී. අලෙවි අංශය කර්මාන්තකරුවන්ගේ ඉල්ලීම පරිදි වෙළඳ පොළ වාර්තා සැකසීම, නිෂ්පාදනවල ගුණාත්මකභාවය, සන්නාම සහ ඇසුරුම්කරණය වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් සපයා දීම, සහ වෙළඳ පොළ තොරතුරු සපයා දීම වැනි කාර්යයන් ඉටු කරන අතර නව වෙළඳ පොළ ප්‍රවණතා පිළිබඳ කාලීනව වැඩමුළු පැවැත්වීම, කර්මාන්ත සමීක්ෂණ පැවැත්වීම සහ හඳුනාගත් නිෂ්පාදන පිළිබඳ වෙළඳ පොළ ශක්‍යතා වාර්තා සකස් කිරීම ද සිදු කරනු ලබයි.

### (3) අලෙවි ප්‍රවර්ධනය

කාර්මික සංවර්ධන මණ්ඩලය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට අනාගත ගනුදෙනුකරුවන් වෙත ළඟාවීමට, ඔවුන් ආකර්ෂණය කර ගැනීමට සහ ඔවුන් සමඟ එක්ව කටයුතු කිරීමට අවස්ථාව සපයා දීම පිණිස දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමෙන් ප්‍රදර්ශන සංවිධානය කරනු ලබයි. තවද අලෙවි අංශය,කර්මාන්ත ප්‍රදර්ශන සඳහා සහභාගී වන කර්මාන්තකරුවන් සමඟ ආයතනික සබඳතා ගොඩනඟා ගැනීමේ අරමුණින් බාහිර සංවිධාන විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශන සඳහා ද සහභාගී වේ. අංශයේ අනෙකුත් අලෙවිකරණ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් නම්, ජාතික මෙන්ම ජාත්‍යන්තර සහභාගිවන්නන් සමඟ ගැණුම්කරුවන් සහ විකුණුම්කරුවන් සම්බන්ධ වන රැස්වීම් මෙහෙයවීම, කර්මාන්තකරුවන් දිරිමත් කිරීම සඳහා ජාතික, පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් ක්ෂේත්‍ර අනුව තරඟ සහ ප්‍රචාරණ පැවැත්වීම වැනි කටයුතු ෙව්.

### (4) ආයතනිකපහසුකම් සැලසීම

* **අබලි ව්‍යාපෘතිය**



*4.8.1 රූප සටහන : කාර්මික සංවර්ධන මණ්ඩලීය මාධ්‍ය ඒකකය*

අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රාජ්‍ය ආයතනවලින් ජනනය කරන ලද ෙෆරස්, ෙෆරස් නොවන සහ ඒ ආශ්‍රිත අනෙකුත් අබලි ද්‍රව්‍ය, තම නිෂ්පාදන ක්‍රියාවලියේ අමුද්‍රව්‍ය ලෙස යොදා ගැනීමට ලියාපදිංචි වී සිටින ලුහු ඉංජිනේරුකරුවන් සහ වාත්තු කර්මාන්තකරුවන්ට, කැබිනට් තීරණය යටතේ පත් කරන ලද මිල කමිටුවක් මඟින් පාලනය කරන ලද සහන මිල ගණන් යටතේ විකිණීමට ලංකා කාර්මික සංවර්ධන


මණ්ඩලයවෙත බලය පවරා ඇත. මෙම ක්‍රියාවලියට සම්බන්ධ නිෂ්පාදන සඳහා උදාහරණ කිහිපයක් නම්, ඇලුමිනියම් සහ පියුටර් පදනම් කරගත් නිෂ්පාදන, තඹ සහ පිත්තල ආශ්‍රිත නිෂ්පාදන, රිංගම් ආශ්‍රිත නිෂ්පාදන, වාත්තු-යකඩ ආශ්‍රිත නිෂ්පාදන, යකඩ ආශ්‍රිත නිෂ්පාදන, ට්‍රාන්ස්ෆෝමර්, බැටරි ආරෝපණ නිෂ්පාදනය සහ මෝටර් අලුත්වැඩියා කිරීම් ය. කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පවතින සියලු දුෂ්කරතා මධ්‍යයේ වුවද අලෙවි අංශය මෙම ව්‍යාපෘතිය යටතේ කර්මාන්තකරුවන් 352 දෙනෙකුට ප්‍රතිලාභ හිමිකරදී ඇති අතර රු.මි. 254.7ක ආදායමක් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයවෙත ලබා ගැනීමට ද හැකි විය.

4.8.1 වගුව : ප්‍රගති සාරාංශ වාර්තාව – 2021

| අංකය | ක්‍රියාකාරකම් | කාර්ය සාධන දර්ශකය | මූල්‍ය ප්‍රගතිය/ සමුච්චිත ඉපැයීම් (රු.) | | |
|---|---|---|---|---|---|
| | | | 2019 | 2020 | 2021 |
| 1 | පවතින කර්මාන්ත දියුණු කිරීම | | | | |
| 1.1 | කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය සැපයීම | ලබා දී ඇති අමුද්‍රව්‍ය වටිනාකම | 266,646,049 | 247,314,423 | 254,700,986 |
| 1.2 | LAKKAM හරහා වෙළඳපල අවස්ථා සැලසීම | නව කර්මාන්තකරුවන්ගෙන් ලද ආදායම | 12,645,436 | 12,231,320 | 17,574,791 |
| 1.3 | උප කොන්ත්‍රාත් හුවමාරුව | උප කොන්ත්‍රාත් මඟින් ලද ආදායම | 1,835,095 | 61,933 | - |
| එකතුව | | | **281,126,580** | **259,607,676** | **272,275,776** |

4.8.2 වගුව : ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම

| වර්ෂය | ආදායම (රු. /මි.) |
|---|---|
| 2019 | 281.1 |
| 2020 | 259.6 |
| 2021 | 272.3 |




දේශීය කර්මාන්තකරුවන්ට, තම ව්‍යාපාර වාණිජමය වශයෙන් වඩාත් ඵලදායී ලෙස වර්ධනය කරගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහ අනාගත ව්‍යවසායකයින්ට සහය ලබාදීම සහ

කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සපයා දෙනු ලබන සේවාවන් ප්‍රවර්ධනය කිරීමෙහි වගකීම අලෙවි අංශයට පැවරී තිබේ. තවද, දීර්ඝ කාලීන ව්‍යාපාර සම්බන්ධතා හරහා අදාළ නිෂ්පාදන වල සන්නාම ප්‍රතිරූපය ගොඩනඟමින් අනාගත වෙළෙඳපොල සමඟ සම්බන්ධතා ගොඩනැගීම සඳහා සහය වීමේ වගකීම ද මෙම අංශයට පැවරී ඇත. **2020** වසර සලකා බලන විට කොවිඩ් වසංගත තත්වය සෑම අංශයකටම විශාල බලපෑමක් එල්ල කළ අතර එය සෑම අංශයකම ප්‍රගතියේ පසුබෑමට හේතු විය. අලෙවි අංශයේ 2019 සහ 2020 වර්ෂයන් හි සමස්ත ආදායම සලකා බැලීමේදී උප කොන්ත්‍රාත් හුවමාරුව, අබලි ලෝහ ව්‍යාපෘතිය සහ ලක්කම් අලෙවි මධ්‍යස්ථානයෙන් හිමිවන ආදායමෙහි සැලකිය යුතු පසුබෑමක් ඇති වී ඇත. අප්‍රේල් මැද භාගයේ පැවති සිංහල හා හින්දු අලුත් අවුරුද්දත් මැයි මාසයේ වෙසක් සහ රාමසාන් උත්සවයත් දේශීය වෙළඳපොලේ අත්යන්ත්‍ර, හස්ත කර්මාන්ත නිෂ්පාදන සඳහා වැඩිම ඉල්ලුමක් පවතින කාලපරිච්ඡේදය ලෙස මාර්තු සිට මැයි දක්වා කාලය හඳුනාගෙන ඇත. මෙම ප්‍රධාන උත්සව සමයේ ඉල්ලුම සපුරාලීම සඳහා ව්‍යවසායකයින් තම නිමැවුම් තොග වශයෙන් නිෂ්පාදනය කරන අතර බොහෝ විට ඔවුන් ලාභ උපයා ගනු ලැබේ. නමුත් පසුගිය වසර තුළ **COVID 19** තර්ජනය හමුවේ ඔවුන් මුහුණදුන් අවිනිශ්චිතතා හේතුවෙන් රටතුළ අගුලු දැමීම්, ඇඳිරි නීතිය සහ අනෙකුත් සීමා කිරීම් නිසා මුළු රටම දැඩි ලෙස පීඩාවට පත් වූ අතර ආයතනයේ සංවිධානය කර තිබූ වැඩසටහන් බොහෝමයක් අවලංගු කිරීමට ද සිදුවිය.ක්ෂුද්‍ර හා කුඩාපරිමාණ ව්‍යවසායන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ රජයේ ආරක්ෂණ පිළිවෙත් හේතුවෙන් ඔවුන්ගේ සැපයුම් දාමය බිඳ වැටීමයි. මීට අමතරව, සපයනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් නොලැබීම සහ අනෙකුත් ආදායම් මාර්ග ද පහත වැටී ඇති බැවින් ඔවුන්ගෙන් බහුතරයකට කාරක ප්‍රාග්ධනය රැස්කරගැනීමේ දුෂ්කරතාවන් සඳහා ද මුහුණ දීමට සිදුවිය. ලොව බොහෝ රටවල් වසර කිහිපයක් පුරා මෙහි අහිතකර බලපෑම් අත්විඳිමින් සිටින නමුත් වර්තමානය වන විට සියලුම ව්‍යාපාර අංශ මීට අනුවර්තනය වීමක් පෙන්නුම් කෙරෙන අතර නව ව්‍යාපාරික අවස්ථා කෙරෙහි අවධානය යොමු කරමින් පවතී. නිදසුනක් වශයෙන්, සාමාන්‍ය ජීවන රටාවේ වෙනස්කම් සමඟ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිසූ ආහාර ද්‍රව්‍ය හා කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි වශයෙන් සුපිරි වෙළඳසැල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී. පසුගිය කාලපරිච්ඡේදයේ නව්‍ය අදහස් ඇති ව්‍යවසායකයින් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම උප අංශයට පා තැබූ අතර ඔවුන්ට අවශ්‍ය මගපෙන්වීම් ලබා දීමට **IDB** ඇතුළු අනෙකුත් ආයතන රැසක් බැඳී සිටීමින් කටයුතු කරනු ලැබේ. තවද එම ව්‍යවසායකයින්ට රජය, අමාත්‍යාංශය සහ අනෙකුත් රාජ්‍ය නොවන සංවිධානවල විවිධ ව්‍යාපෘති හරහා සහය ලැබීම මගින් ඵලදායී ප්‍රතිඵල පෙන්නුම් කර දී තිබේ. කොවිඩ් වයිරසය පැතිරීම නව ව්‍යාපාර වල සංවර්ධන අවධියේදී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ විශාල අභියෝගයක් වූ නමුත් අවසාන වශයෙන් මෙම සියල්ලෙහි ප්‍රතිඵල වශයෙන් අලෙවිකරණ අංශයේ වාර්ෂික කාර්ය සාධනය පෙර වසර වලට සාපේක්ෂව ධනාත්මක දිශානතියක් කරා නංවාලීමට හේතු වී ඇත.

## 4.9 සම්භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ සම්භාණ්ඩ සහ පාවහන් නිෂ්පාදන අංශයේ දියුණුව සඳහා 1998 වර්ෂයේ දී සම් භාණ්ඩ නිෂ්පාදන සහ පාවහන් සංවර්ධන මධ්‍යස්ථානය (CDLP&F) ස්ථාපිත කරන ලදී. මෙම අංශය කෙටිකාලීන හා දිගුකාලීන පාඨමාලා පැවැත්වීම මඟින් මෙරට පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනයට සම්බන්ධ දේශීය කර්මාන්ත නහාසිටුවීම පිණිස පාවහන් නිර්මාණය සහ මෝස්තර සෑදීම පිළිබඳ නැගී එන නව ව්‍යවසායකයින්ට අවශ්‍ය මඟපෙන්වීම මෙම මධ්‍යස්ථානය විසින් සපයා දෙනු ලැබේ. තවද ඉහළ අගය එකතු කිරීමක් සහිත අපනයන තත්ත්වයේ නිමි භාණ්ඩ නිෂ්පාදනය කරන සම්භාණ්ඩ අංශය නිෂ්පාදන නිපුණතා සංවර්ධනය කිරීම පිණිස වෙළඳ පොළෙහි වඩාත් සුදුසුකම් සහිත සහ පුහුණු සේවකයින් සම්බන්ධ කර ගැනීම සඳහා කර්මාන්තකරුවන්ට සහාය වීම පිණිස සම්භාණ්ඩ සහ පාවහන් යන අංශ දෙකෙහිම තාක්ෂණය ලබා දීමේ වැඩමුළු පැවැත්වීමට මෙම මධ්‍යස්ථානය පහසුකම් සලසයි. මෙහි ප්‍රධාන මධ්‍යස්ථානය කටුබැද්දෙහි පිහිටා ඇති අතර ප්‍රාදේශීය ඒකකය වාරියපොළ පිහිටා තිබේ.

### 4.9.1 මෙම අංශය මඟින් සපයනු ලබන සේවාවන්

- තාක්ෂණ හුවමාරු වැඩමුළු
  - පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය පිළිබඳ තාක්ෂණය
  - පාවහන් නිපදවීමේ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම
  - සම් භාණ්ඩ නිෂ්පාදනය
  - පාවහන්වල ඉහළ වැස්ම
  - පාවහන් නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ තත්ත්ව වැඩිදියුණු කිරීම
  - බෑග් නිෂ්පාදනය
- සැලසුම් සහ මෝස්තර සකස් කිරීමේ පුහුණුව
- නව්‍ය අදහස් සහ තොරතුරු

තවද මෙම මධ්‍යස්ථානය මඟින් පාවහන් සහ සම්භාණ්ඩ ක්ෂේත්‍රයේ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය සහ පුහුණුව යන දෙඅංශයෙන්ම මාර්ගෝපදේශ සපයන අතර පවතින කර්මාන්ත සඳහා නව්‍ය සහ නිර්මාණාත්මක අදහස් ලබා ගැනීමට අවශ්‍ය දැනුම සහ තොරතුරු ලබා දෙනු ලැබේ.

- නවීන වෙළඳ සහ යන්ත්‍රෝපකරණ තොරතුරු

පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තවල භාවිතා වන නවීන තාක්ෂණය පිළිබඳ දැනුම ලබා දීම සහ සුදුසු කර්මාන්ත වෙත එම දැනුම හුවමාරු කිරීම.

- කර්මාන්ත සඳහා පුහුණු ශ්‍රමය

සාර්ථක ලෙස පුහුණු වූ පිරිස් සැපයීම මගින් සමාගම්/SMIs හි මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.

- ඉන්කියුබේටර් පහසුකම් සැපයීම
- රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සබඳතා ඇති කිරීමට සහාය වීම
- විකුණුම් සහ ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම

### 4.9.2 මධ්‍යස්ථානය මගින් සපයන යන්ත්‍රෝපකරණ සේවා සහ සැකසුම් පහසුකම්

- යන්ත්‍රෝපකරණ

පහත සඳහන් යන්ත්‍රසූත්‍ර සහනදායී මිල ගණන් යටතේ භාවිතා කිරීමට සමාගම්/SMI සඳහා පහසුකම් සපයා ඇත.



*හැඩකැපීමේ යන්ත්‍රය*



***Flat bed& Post bed** මහන යන්ත්‍රය*



*පැලුම් යන්ත්‍රය*



*ඔපකිරීමේ සහ නිමාව ගැනීමේ යන්ත්‍රය*




***Cylinder Bed** මහන යන්ත්‍රය*




*සම් කැපීමේ යන්ත්‍රය*



*සම් පටි කැපීමේ යන්ත්‍රය*

- ඉන්කියුබේටර් පහසුකම්

පුහුණු ශ්‍රමිකයින්ට පාවහන් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය ආශ්‍රිත කර්මාන්තයට සාර්ථකව ප්‍රවිශ්ට වීමට හැකිවන පරිදි සහනදායී මිලකට අවශ්‍ය ඉන්කියුබේටර් පහසුකම් සැපයීම.

- සාම්පල් සෑදීම

පුද්ගල අවශ්‍යතාවය මත නිශ්චිත නිෂ්පාදන සඳහා නියැදි සෑදීම සහ උපදෙස් ලබා දීම.

- විවිධ ආබාධ සහිත පුද්ගලයින් පුහුණු කිරීම

ආබාධිත, විශ්‍රාමික සේවකයින්, පුනරුත්ථාපනය වූ තරුණයින්, රැඳවියන් සහ විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට ජීවනෝපාය ආරම්භ කිරීමට හැකිවන පරිදි පුහුණු වැඩසටහන් පැවැත්වීම.

### 4.9.3 අංශයේ විශේෂ කටයුතු

(1) අමාත්‍යාංශ සහ පළාත් සභාවල මූල්‍ය දායකත්වයෙන් දිවයින පුරා ව්‍යවසායකයින් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.

- පාවහන් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 08ක් පවත්වන ලද අතර මෙම අංශය සඳහා ව්‍යවසායකයින් 135 දෙනෙකු සහභාගී වන ලදී.
- බෑග් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 05 ක් පවත්වන ලද අතර පාවහන් නිෂ්පාදන අංශය සඳහා ව්‍යවසායකයින් 111 දෙනෙකු පුහුණු කරන ලදී.
- ඉහත වැඩසටහන් හරහා ක්ෂේත්‍රයට නවකයින්ගේ කුසලතා වර්ධනය කර ඇති අතර එමඟින් රු. 2,413,368 ක ආදායමක් උපයා ඇත.
- පාවහන් නිර්මාණ ශිල්පීන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ක්ෂේත්‍රයේ පුද්ගලයින් 128 දෙනෙකු පුහුණු කර රු. 1,424,557ක් උපයා ඇත.
- දැනට පවතින කර්මාන්තවල නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා පුද්ගලයින් 47 දෙනෙකු පුහුණු කර රු. 401,772ක් උපයා ඇත.

(2) ආනයන ප්‍රතිපත්ති සම්පාදනය, සෙස් බදු සංශෝධනය සහ අයවැය යෝජනා සකස් කිරීම වැනි කටයුතු සඳහා පාවහන් සහ සම්භාණ්ඩ කර්මාන්ත අංශයේ හා රජයේ සම්බන්ධීකරණයෙන් මැදිහත් වීම.

(3) විවිධ රාජ්‍ය ආයතන වල පාවහන් සහ සම්භාණ්ඩ අවශ්‍යතා මිලදී ගැනීම සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු වලට සහභාගි විය.

(4) සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ සහ මොරටුව විශ්වවිද්‍යාලයේ මෝස්තර නිර්මාණ විෂය මාලාව හදාරන අවසන් වසර සිසුන්ගේ ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම.

(5) කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ධාරිතාව වර්ධනය කිරීම සඳහා නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ යන්ත්‍රෝපකරණ සේවා පහසුකම් සැපයීම. එමඟින් අදාළ කාලසීමාව තුළ මාසිකව කර්මාන්තකරුවන් 100 දෙනෙකුට සේවා සපයා ඇති අතර මෙම ක්‍රියාවලිය මඟින් ලබාගත් සමස්ත ආදායම රු.122,726.

(6) රබර් අංශයට අනුගත පුද්ගලයන් සහ ආයතන සම්බන්ධ තොරතුරු රැස් කිරීම සහ පවත්වාගෙන යාම තුළින් එම අංශය පිළිබඳව උනන්දුවන පාර්ෂවයන් වෙත අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකියාව පවතී. එලෙස කර්මාන්තකරුවන් සහ ආයතන 540ක විස්තර සහිත තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කරමින් පවතී.

(7) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන්ගේ විභාගවලට අදාළ වාර්ෂික හා අර්ධ වාර්ෂික ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර සකස් කිරීම.

(8) නිෂ්පාදකයන්ට සාධාරණ මිලකට අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා අමුද්‍රව්‍ය අලෙවි මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

(9) තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරිය සමඟ එක්ව NVQ සහතික කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් සාර්ථකව පවත්වන ලදී.

(10) රට තුළ උද්ගතව ඇති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් දේශීය පාවහන් නිෂ්පාදකයින් සඳහා වන මාසික අමුද්‍රව්‍ය අවශ්‍යතා පිළිබඳ විස්තර නිෂ්පාදකයින්, වෙළඳුන් සහ ආනයනකරුවන්ගේ සහය ඇතිව සකස් කර අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.


(11) "සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන" යටතේ රත්නොට, පානදුර, ලග්ගල සහ කාත්තන්කුඩි යන ප්‍රාදේශීය ලේකම් කාර්යයාල වලට ඔවුන්ගේ ව්‍යාපෘති ඉටුකරගැනීම සඳහා අවශ්‍ය මහපෙන්වීම් ලබාදුන් අතර මෙම වැඩසටහන යටතේ තවදුරටත් උසස් තාක්ෂණික පුහුණු වීම් සහ යන්ත්‍රෝපකරණ ප්‍රසම්පාදන කටයුතු සඳහා ද අවශ්‍ය සහය ලබාදෙන ලදී.

(12) ප්‍රාදේශීය සංවර්ධන අංශයේ ඉල්ලීම පරිදි මහන මැෂින් 170ක් අලුත්වැඩියා කරන ලදී.

(13)2021 වර්ෂයේ මධ්‍යස්ථානයේ මුළු ආදායම රු. 4,892,789.00 කි.

***4.9.1** වගුව : ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම*

| වර්ෂය | *ආදායම* (රු.) |
|---|---|
| 2019 | 6,476,884.00 |
| 2020 | 5,200,839.00 |
| 2021 | 4,892,789.00 |




ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබන අංශයකි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ප්‍රමුඛතම රාජ්‍ය සංවිධානයක් ලෙස, නැඟී එන ව්‍යවසායකයින් හට මූල්‍ය ආධාර සැපයීම, තාක්ෂණික හා පරිපාලන සහාය ලබා දීම සඳහා කටයුතු කරනු ලැබේ. මෙරට සම්භාණ්ඩ සහ පාවහන් නිෂ්පාදන කර්මාන්තය සංවර්ධනය සඳහා කර්මාන්තකරුවන්ගේ නිපුණතා නංවාලීමට, ඔවුන්ගේ නිෂ්පාදන සඳහා පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම, කෙටිකාලීන හා දිගුකාලීන උපාය මාර්ග සැකසීම මෙම මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලැබේ. පාවහන් කර්මාන්තය ඉහළ ශ්‍රම බලකායක් අවශ්‍ය වන ක්ෂේත්‍රයක් වන අතර රටේ සමස්ත ආර්ථිකයට ප්‍රධාන වශයෙන් ඉහළ දායකත්වයක් සපයනු ලබන ක්ෂේත්‍රයකි. වර්තමානය වන විට මෙම කර්මාන්තයට අදාළව සෘජුව සහ වක්‍රව පුද්ගලයන් 40,000 ක් පමණ සේවය කරන අතර, ඊට මහා පරිමාණ සමාගම් 10 ක්, මධ්‍ය පරිමාණ සමාගම් 30 ක් සහ කුඩා පරිමාණ නිෂ්පාදකයින් 3000 ක් පමණ ඇතුළත් වේ. නොයෙක් අමුද්‍රව්‍ය යොදා ගනිමින් කැන්වස්, රබර් බූට්, ක්‍රීඩා සපත්තු සහසම් සපත්තු වැනි විවිධ මාදිලියේ නවීන නිෂ්පාදන නිපදවනු ලැබේ. පසුගිය වසර තුළ මෙම අංශයේ අපනයන ආදායම ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 120 ක් පමණ වූ අතර COVID-19 තත්වය හමුවේ, කාරක ප්‍රාග්ධනය, සැපයුම් දාම බිඳවැටීම් සහ අලෙවිකරණ ගැටලු වැනි දුෂ්කරතා සඳහා මෙම අංශයට මුහුණ දීමට සිදුවිය. සම් භාණ්ඩ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන අතර මෙම ක්ෂේත්‍රය විශාල පිරිසකට ජීවනෝපාය අවස්ථා සලසා දෙන නමුත් ඒ සඳහා ප්‍රමාණවත් අනුග්‍රහයක් හෝ අවධානයක් සමාජය තුළ හිමි වී නොමැත. COVID-19 වසංගත තත්වයෙන් මුළු මහත් සමාජයම පීඩා විඳි වර්ෂයන් තුළ රෝගය පැතිරීම වැලැක්වීමට ගත් ආරක්ෂක පිළිවෙත් හේතුවෙන් එකල පැවති උත්සව අවස්ථාවන් සියල්ලෙහි අලෙවි අවස්ථා මහහැරීම නිසා සම් භාණ්ඩ නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියුතු කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ විකුණුම් ඉලක්ක අපේක්ෂිත පරිදි ළඟා කර ගැනීමට නොහැකි වූ අතර නොවිකිණූ තොග විශාල වශයෙන් පැවතීම නිසා ද්‍රවශීලතා ගැටලුවලට මුහුණ දීමටද සිදු වූයේය. තවද ඔවුන්ගේ සැපයුම් මාර්ග ද අඩාල වී ඇති අතර මේ අවස්ථාවේදී ව්‍යවසායකයින්හට ඔවුන්ට මෙම කර්මාන්තය තුළ යළි නැඟී සිටීමට අවශ්‍ය අත්වැල් සැපයිය යුතු වේ. මෙම පශ්චාත්-COVID-19 කාලපරිච්ඡේදයේ දී තම වෙළෙඳපොළ පිළිබඳ අවිනිශ්චිතතා රැසකට මුහුණ දුන් ව්‍යවසායකයින්ගේසමස්ත සැපයුම් හා නිෂ්පාදන ජාලයන් යළි යථාතත්වයට පරිවර්තනය කරගැනීමට ප්‍රමාණවත් ආයතනික සහ මෙහෙයුම් ප්‍රතිපත්ති සකස් කිරීම අවශ්‍ය වන අතර, නිෂ්පාදන පාඩු මහහරවා ගනිමින්, ආර්ථිකය තවදුරටත් ඉහළ නංවන පරිදි පරිභෝජන රටාව වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.

## 4.10 රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය

ලෝක බැංකුවේ උපදෙස් හා මූල්‍ය ආධාර යටතේ 1980 වර්ෂයේ දී පිහිටුවන ලද පැලියගොඩ රබර් නිෂ්පාදන සංවර්ධන හා සේවා මධ්‍යස්ථානය, කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සංවර්ධනය, පරීක්ෂණ පහසුකම්සැපයීම, ව්‍යාපෘති සහ උපදේශක සේවා, ස්වාභාවික සහ කෘත්‍රිම රබර් සංයෝග සැකසීම ආදී සේවාවන් රැසක් සැපයීම පිණිස පිහිටුවා ඇත. රසායනික ද්‍රව්‍ය සහ අනෙකුත් පිරිසැකසුම්කාරක ද්‍රව්‍ය අලෙවි කිරීම සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගුණාත්මක භාවයෙන් යුතු අමු රබර් පිරිසැකසුම් කිරීම මඟින් අගය එකතු කළ රබර් නිෂ්පාදනය කිරීම සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය මූලිකත්වයෙන් කටයුතු කරනු ලැබේ.

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය විසින් තාක්ෂණ සේවා සහ තොරතුරු, විශේෂඥ උපදේශක සේවා සහ රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධ උපදෙස් සේවා ආදිය සපයා දෙනු ලබයි. මෙම අංශයට ඝන ටයර්, රබර් අත්වැසුම්, රබර් පටි, නිස්සාරණ, පාපිසි සහ වෙනත් විවිධ භාණ්ඩ ආදියෙන් සමන්විත පුළුල් පරාසයකට අයත් නිෂ්පාදන පෙළක් පවතී.මෙම අංශයෙහි සිටින විවිධ දක්ෂතාවයන් සහ පළපුරුද්ද සහිත තාක්ෂණවේදීන් සහ මෝස්තර නිර්මාණ ශිල්පීන් නිසා රබර් භාණ්ඩ නිෂ්පාදකයින්ට වෙළඳ පොළෙහි පවතින දැඩි සහ තරහකාරී අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි නිෂ්පාදන සිදු කිරීමට අවස්ථාව උදා වී ඇත.

එම අංශය මඟින් සපයනු ලබන අනෙකුත් සේවාවන් කිහිපයක් පහත දැක්වේ.

- නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය.
- පරීක්ෂණ පහසුකම් සහ තත්ත්ව සහතික ලබා දීම.
- තාක්ෂණික උපදේශන සහ ව්‍යාපෘති සේවා සැපයීම.
- අර්ධ වාණිජ සේවා සැපයීම.
- අධ්‍යාපනික ආයතන, පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයන් හා කර්මාන්ත අතර සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

**4**.10.1 වගුව: **2021 වර්ෂයේ මධ්‍යස්ථානයේ කාර්ය සාධන විශේෂතා - 2021**

| # | සේවාවන් | මිනුම් දර්ශකය | සංඛ්‍යාව |
|---|---|---|---|
| අ) | තාක්ෂණය හුවමාරු කිරීම<br>1. ප්‍රායෝගික ආදර්ශ<br>2. වැඩමුළු :<br>රබර් කළ කොහු නිෂ්පාදන නිපදවීම දැනුවත් කිරීමේ වැඩසටහන්<br>3. දැනුවත් කිරීමේ වැඩසටහන් (MPI සමග අවබෝධතා ගිවිසුම් යටතේ)<br>- නව සහ පවතින රබර් ක්ෂේත්‍රයේ නියුතු කර්මාන්තකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් | වැඩසටහන් / සේවාලාභීන් සංඛ්‍යාව | 10<br>01<br>03 |
| ආ) | පරීක්ෂණ පහසුකම්<br>මීට අපනයන වෙළෙඳපොළ සඳහා රබර් නිෂ්පාදනය කරන කර්මාන්තකරුවන් සඳහා පරීක්ෂණ පහසුකම් ලබා දීම ඇතුළත් වේ. | රැකියා සංඛ්‍යාව<br>පරීක්ෂණ සංඛ්‍යාව | 75<br>275 |
| ඇ) | නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය | රැකියා සංඛ්‍යාව | 26 |

රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය, රබර් සහ රබර් නිෂ්පාදන කර්මාන්තය පිළිබඳ තාක්ෂණික සේවා සහ තොරතුරු සපයයි. මීට අමතරවරබර් නිපැයුම් සම්බන්ධ විශේෂඥ උපදේශක සේවා, ව්‍යාපෘති ගොඩනැගීම, ඇගයීම, ශක්‍යතා අධ්‍යයනය, කර්මාන්ත සමීක්ෂණ, කම්හල් සහ යන්ත්‍රෝපකරණ පිරිසැලසුම්, ක්‍රියාවලි තාක්ෂණය, තාක්ෂණික ගැටළු සඳහා විසඳුම්, යන්ත්‍රෝපකරණ සහ අමුද්‍රව්‍ය තෝරාගැනීම, සම්මන්ත්‍රණ පැවැත්වීම, ප්‍රදර්ශන, පුහුණු ක්‍රියාකරුවන් මඟින් ආදර්ශන, තත්ත්ව පාලනය සහ නිෂ්පාදන පරීක්ෂා කිරීම ආදී සේවා සපයයි. එමෙන්ම මෙම මධ්‍යස්ථානයේ රසායනාගාර රබර් සංයෝග සහ නිමි භාණ්ඩවල තත්ත්ව පරීක්ෂණ සඳහා යොදා ගන්නා පුළුල් පරාසයක භෞතික හා යාන්ත්‍රික පරීක්ෂණ උපකරණ යොදා ගනු ලැබේ.

### 4.10.1 මධ්‍යස්ථානයේ පවතින ප්‍රධාන උපකරණ / යන්ත්‍රෝපකරණ

- **රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩින් - Fuo Yuan Yi FU120A යන්ත්‍රය**



- **විද්‍යුත් යාන්ත්‍රික පරීක්ෂණ යන්ත්‍රය (Electromechanical Universal Testing Machine)**



### 4.10.2 RMP ව්‍යාපෘති අංක 22 යටතේ: රබර් නිෂ්පාදන සංවර්ධන සහ සේවා මධ්‍යස්ථානය/IDB හි ධාරිතාව වැඩි දියුණු කිරීම:

මෙම මධ්‍යස්ථානය රබර් නිෂ්පාදන අලෙවිකරණ හැකියාවන් ඉහළ නැංවීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කරන ලදී. මෙම වැඩසටහනෙහි 2 වැනි සැසිවාරය ලෙස ඇගයීම් ව්‍යාපෘතිය පවත්වන ලද අතර කෑගල්ල සහ බස්නාහිර පළාතේවැඩමුළුවලින් තෝරාගත් පුද්ගලයින්ට රබර් සංයෝග සපයා නව කර්මාන්ත ආරම්භ කිරීමට පහසුකම් සලසන ලදී.

### 4.10.3 සංවර්ධන ක්‍රියාකාරකම්:

2021 වර්ෂය තුළ දී පහත සඳහන් සංයෝග නිර්මාණය, තත්වය වැඩිදියුණු කිරීම සහ නිෂ්පාදන සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීමේ කාර්යයන් සිදු කරන ලදී.

| (1) | සංයෝග සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම |
|---|---|
| | *විශේෂ වැඩසැලසුම් සකස් කිරීම* |
| i | බෝල කපාටය |
| ii | කෙසෙල් කෙඳි කොහු බඳුන |
| iii | ඇඹරුම් රබර් මුදුන |
| iv | රබර් ගෑස්කට් යන්ත්‍ර යෙදුම |
| v | මඩ් රෝදය |
| vi | පිරවුම් යන්ත්‍ර ආරක්ෂකයා |
| vii | තෙල් මුද්‍රාව |
| viii | ජැක් සීල් |
| ix | මිල් ටැංකි රබර් ඇසුරුම් |
| x | ගෑස්කට් මුද්‍රාව |
| (2) | තත්ත්ව වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම් -සහතික75 |
| | *විශේෂ නිෂ්පාදන* |
| i | ටයර් ත්‍රෙඩ් -CTB |
| ii | ඝන ටයර් |
| iii | රබර් පෑඩ් |
| iv | තෙල් ප්‍රතිරෝධී මුද්‍රාව |
| v | රබර් පටිය |
| vi | රබර් සවි කිරීම් |
| vii | රබර් බීඩිං ෙෆන්ඩර් |
| viii | ජල මුද්‍රාව |
| ix | ටයර් ටියුබ් |
| (3) | ප්‍රධාන නිෂ්පාදන සංයෝග සකස් කිරීමේ රැකියා |
| | *නිෂ්පාදනය* |
| i | CTB සඳහා ටයර් ට්‍රෙඩ් ලයිනර් |
| ii | පීඩනය මනින රබර් ජල බැලූනය |
| iii | ත්‍රිරෝද මඩ්ගාඩ් |
| iv | ත්‍රිරෝද ඇක්සල් සඳහා රබර් නොබ් |
| v | රබර් මවුන්ට් |
| vi | ෆුඩ් ග්‍රේඩ් කේක් ස්පූන් |
| vii | විශාල රබර් වළල්ල |
| viii | ජීප් රථය සඳහා රබර් තෙල් හෝස් |

නව ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීමට සහ දැනට සිටින ව්‍යවසායකයින් විසින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වියළි රබර් සහ රබර් කිරි ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ තාක්ෂණික ආදර්ශන 10 ක් සහ වැඩමුළු 03 ක් මධ්‍යස්ථානය විසින් පවත්වා ඇත.

### 4.10.4 වාර්ෂික ආදායම


පහත දැක්වෙන පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් යටතේ පවත්වන ලද ක්‍රියාකාරකම් මධ්‍යස්ථානයේ වාර්ෂික ආදායම උත්පාදනය කිරීමට දායක විය. මෙම මධ්‍යස්ථානය 2021 වර්ෂය තුළ දී ස්වයං මූල්‍ය සපයාගනු ලබන ඒකකයක් බවට පත්වීමේ අරමුණ ඉටුකර ගැනීම උදෙසා සතුටුදායක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. ඒ අනුව මෙම ගිණුම් වර්ෂය තුළදී තාක්ෂණික හා වාණිජ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයාගත් වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිත ආදායම රු.මි. 23.4ක් විය.

**4.10.2 වගුව : මධ්‍යස්ථානයේ භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවි කිරීම් පිළිබඳ ප්‍රගති සාරාංශය**

| | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | විකුණුම් වටිනාකම (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|
| **විකුණුම්** | | | |
| අර්ධ වාණිජ කටයුතු | 37,168 | 22,928,649 | |
| | | | 22,928,649 |
| **සේවාවන්** | | | |
| i. උපදේශන (302) | | **169,722** | |
| (ආදර්ශනය/ වැඩමුළුව/උප කොන්ත්‍රාත්තුව) | | | |
| ii. තත්ත්ව පාලනය සහ රසායනාගාර පරීක්ෂණ | | 194,328 | |
| iii. නිෂ්පාදන සංවර්ධනය | | 176,817 | **540,907** |
| **එකතුව** | | | **23,469,556** |
| **වැට් 8%** | | | **17,877,564** |
| **බදු සමඟ එකතුව** | | | **25,347,121** |

***4.10.3 වගුව: ආදායම වාර්ෂිකව සංසන්දනය කිරීම***

| වර්ෂය | වැට් සහ ජාතිය ගොඩනැගීමේ බදු රහිත ආදායම (රු.) |
|---|---|
| 2019 | 21,508,695.91 |
| 2020 | 18,275,053.00 |
| 2021 | 23,469,556.00 |




දේශීය රබර් නිෂ්පාදකයින්ට අවශ්‍ය සේවා සැපයීම මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණ වන අතර මෙමඟින් ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය සඳහා ද පහසුකම් සලසා දෙනු ලැබේ. එලෙස සපයන සේවාවන් වන්නේ, රබර් කිරි සහ වියළි රබර් සංයෝග සැපයීම, නිෂ්පාදන සැලසුම් කිරීම සහ සංවර්ධනය, සාම්පල සඳහා නිමැවුම් සැකසීම, ඩයි සහ අච්චු නිර්මාණය පිළිබඳ උපදෙස් සැපයීම, සම්පීඩන අච්චු සැකසීම, සංයෝග සකස් කිරීම, නිස්සාරණය සහඋදුන ස්වයංක්‍රීය වල්කනයිස් කිරීම ආදිය වේ. මෙම අංශයේ පසුගිය වසර කිහිපයේ ප්‍රගතිය සලකා බැලීමේදී, ඔවුන්ගේ ආංශික ක්‍රියාකාරකම්වල කාර්ය සාධනයේ අනුක්‍රමික ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර, ව්‍යාපෘති සහ උපදේශන (ආදර්ශන/වැඩමුළු/උප කොන්ත්‍රාත්), තත්ත්ව පාලනය, රසායනාගාර පරීක්ෂණ සහ නිෂ්පාදන සංවර්ධනය යන කාණ්ඩ එම ක්ෂේත්‍රයන්හි අන්තර්ගත වේ.COVID 19 වසංගත තත්වය ඇති වීමත් සමඟ මෙරට සියලු ආර්ථික ක්‍රියාකාරකම්හි පසුබෑමක් දක්නට ලැබුණු අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකයින් ද මෙමඟින් බලපෑමට ලක්වූ නමුත් වසර 2020 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුල මණ්ඩලය මඟින් ක්‍රියාවට නංවන ලද කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රමෝපාය මඟින් එම අවදානම් තත්වය යථාතත්වයට පත්කරගැනීමට මෙම අංශයට හැකි විය. ව්‍යවසායකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ අගුලු දැමීම් සහ ඇඳිරි නීතිය හේතුවෙන් ඔවුන්ගේ සැපයුම් දාමය බිඳ වැටීමයි. නමුත් රබර් සහ ප්ලාස්ටික්, දැව ආශ්‍රිත කර්මාන්ත සහ සෙරමික් ආශ්‍රිත නිෂ්පාදන ක්ෂේත්‍රයන් හි නියුතු කර්මාන්තකරුවන් බොහෝ දුරට දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන බැවින් රසායනික ද්‍රව්‍ය සහ මෙවලම් වැනි විශේෂ ද්‍රව්‍ය හැර ඔවුන්ට සැපයුම් දාමය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටළුවක් ඇති නොවේ. මීට අමතරව, සපයනු ලබන භාණ්ඩ සඳහා නියමිත ගෙවීම් නොලැබීම සහ අනෙකුත් ආදායම් මාර්ග ද පහත වැටී ඇති බැවින් ඔවුන්ගෙන් බහුතරයකට කාරක ප්‍රග්ධන ගැටලු වලට මුහුණ දීමට සිදුවී තිබේ. මෙරට ආර්ථිකයේ පවතින අස්ථාවරත්වය හේතුවෙන් අමුද්‍රව්‍යවල මිල ඉහළ යාමත් නිපැයුම් සීමිත ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීමත් නිසා කර්මාන්තකරුවන්ගේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියට මෙය දැඩිව බලපා ඇත. මෙම රබර් ආශ්‍රිත නිෂ්පාදන අංශය විශාල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකයින්ජාලයකින් සමන්විත වන අතර මෙරට නිමි රබර් නිෂ්පාදන අපනයනය මඟින් ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 768 ක ආදායමක් පසුගිය වසර තුළ උපයනු ලැබීය. වසංගත තත්වය හේතුවෙන් අපනයනවලට පැවති සීමා කිරීම් නිසා මාර්තු සිට අප්‍රේල් දක්වා ඉහළ ඉල්ලුමක් පවතින කාලපරිච්ඡේදය තුළ අලෙවිකරණ අවස්ථා අහිමිවීම 2020 වර්ෂයේදී ආදායම අඩුවීමට දැඩි ලෙස බලපා ඇත. ලෝහ නිෂ්පාදන සහ යන්ත්‍ර සූත්‍ර, මෝටර් රථ සහ ප්‍රවාහන උපකරණ කර්මාන්තය, විදුලි හා ඉලෙක්ට්‍රොනික කර්මාන්තය, ඖෂධ සහ රූපලාවන්‍ය කර්මාන්තය ද එවැනිම බාධකවලට මුහුණදෙන කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා උදාහරණ වේ. වර්තමානයේ වසංගත තත්වයේ බලපෑම ක්‍රමයෙන් අඩුවෙමින් පවතින පශ්චාත් COVID-19 තත්වය හමුවේ වුවද කාර්මික සේවකයින් නැවත පෙර පරිදි විශාල වශයෙන් එක්වීම කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කරනු ලබන අතර සීමිත ශ්‍රම බලකායක් යොදා ගනිමින් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීම තුළින් නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නංවාලීම කෙරෙහි අවධානය යොමු වී තිබේ.

# (05) මූල්‍ය සමාලෝචනය



## ගිණුම්දීමේ නිලධාරියාගේ සහතිකය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (IDB) මූල්‍ය ප්‍රකාශන 1969 අංක 36 දරන කාර්මික සංවර්ධන පනතේ අංක 35 වගන්තියෙන් නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රය සහ ආකාරය අනුව 1971 අංක 38 මුදල් පනත, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) අනුව සකස් කර ඇති අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සහ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සඳහන් සටහන් සහ උපලේඛන සමඟින් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

රේඛීය අමාත්‍යාංශය වන කර්මාන්ත අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වැනි අනෙකුත් නියාමන ආයතන විසින් නියම කරන ලද මූල්‍ය නීති රීති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලව කටයුතු කර ඇති අතර, ගනුදෙනුවල යෝග්‍යතාවය සහ සියලු ව්‍යදම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පාලන පද්ධති හැකිතාක් ප්‍රායෝගිකව පවත්වා ගෙන ගොස් ඇත. මගේ දැනුම සහ විශ්වාසයන් අනුව, මූල්‍ය ප්‍රකාශන සතුටුදායක ලෙස සකස් කර ඇති අතර, ඒවා මණ්ඩලයේ (IDB) මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරයි.

**සුනිල් ගුණවර්ධන**
**සභාපති**
**කාර්මික සංවර්ධන මණ්ඩලය**

2022 අප්‍රේල් 29

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**විස්තීර්ණ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**
**2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| වත්කම් | සටහන | 2021 | 2020 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | **13** | 509,254,296 | 458,709,147 |
| ආයෝජන දේපළ | **14** | 1,115,390,943 | 1,112,160,161 |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ | **15** | 83,721,066 | 95,404,877 |
| ස්ථාවර තැන්පතු | **16** | 84,841,643 | 80,029,718 |
| | | **1,793,207,948** | **1,746,303,904** |
| **ජංගම වත්කම්** | | | |
| බඩු තොග | **17** | 25,947,972 | 18,947,263 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | **18** | 24,932,232 | 32,641,971 |
| වෙනත් ජංගම වත්කම් | **19** | 48,626,679 | 50,981,831 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් | **20** | 88,070,127 | 55,782,649 |
| ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති | **21** | 13,491,040 | 11,111,882 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | **22** | 135,203,479 | 138,223,834 |
| | | **336,271,529** | **307,689,431** |
| **මුළු වත්කම්** | | **2,129,479,477** | **2,053,993,335** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන | **23** | 304,455,733 | 341,681,267 |
| ප්‍රාග්ධන සංචිත | | 6,243,013 | 6,243,013 |
| පවරා දෙන ලද වත්කම් වල වටිනාකම | **24** | 13,447,061 | 13,447,061 |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | **25** | 960,696,321 | 960,696,321 |
| විලම්බිත රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති | **26** | 556,582,142 | 565,219,549 |
| | | **1,841,424,270** | **1,887,287,211** |
| සමුච්චිත පාඩු | **27** | (200,739,910) | (272,134,396) |
| **මුළු හිමිකම්** | | **1,640,684,359** | **1,615,152,815** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | **28** | 206,131,395 | 202,971,991 |
| | | **206,131,395** | **202,971,991** |
| **ජංගම වගකීම්** | | | |
| රජයට ගෙවිය යුතු හිඟ | **29** | 74,779 | 72,554 |
| සංස්ථාවට ගෙවිය යුතු හිඟ | **30** | 8,196,956 | 7,316,633 |
| බැංකු ණය ශේෂ | **22** | - | 2,725,171 |
| ප්‍රතිපාදන සහ උපචිත වියදම් | **31** | 274,391,987 | 225,754,172 |
| | | **282,663,722** | **235,868,530** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **2,129,479,477** | **2,053,993,335** |

පිටු අංක 06 සිට 31 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

ඒ.පී.යූ.කේ. අබේසූරිය
අධ්‍යක්ෂ (මුදල්)
දිනය: 2022/05/23

පී.එල්.යූ. රත්නමලල
අධ්‍යක්ෂ ජනරාල්
දිනය: 2022/05/23

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන්නේය.මෙම මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් 2022 මැයි 23 දින අත්සන් කරන ලදී.

| | | |
|---|---|---|
| සුනිල් ගුණවර්ධන | ආලෝක එන්. වාහලවත්ත | ඒ.ඒ.එන්. බුද්ධික විමලසිරි |
| සභාපති | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
### 2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| ආදායම | 05 | 394,960,415 | 398,396,560 |
| අලෙවි සහ සේවා පිරිවැය | 06 | (277,291,053) | (245,451,012) |
| **දළ ලාභය** | | **117,669,362** | **152,945,547** |
| වෙනත් ආදායම් | 07 | 111,931,641 | 104,046,642 |
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 08 | 465,750,000 | 381,250,000 |
| පරිපාලන වියදම් | 09 | (623,096,345) | (622,237,955) |
| විකිණීම සහ බෙදා හැරීමේ වියදම් | 10 | (8,902,791) | (1,490,672) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල** | | **63,351,867** | **14,513,562** |
| මූල්‍ය පිරිවැය | 11 | (588,050) | (490,815) |
| **බදු ගෙවීමට පෙර ශුද්ධ ආදායම / (පාඩුව)** | | **62,763,817** | **14,022,747** |
| වෙනත් විස්තීර්ණ ආදායම | 12 | 15,123,409 | (5,878,668) |
| **වර්ෂය සඳහා ශුද්ධ ආදායම / (පාඩුව)** | | **77,887,226** | **8,144,079** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**අරමුදල් සහ සංචිත වෙනස්වීම් ප්‍රකාශය**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධන සහ සංචිත | පවරා දෙන ලද වත්කම් වටිනාකම | ප්‍රත්‍යාගණන අතිරික්තය | විලම්බිත රජයේ ප්‍රදාන - ව්‍යාපෘති | සමුච්චිත අතිරික්තය / හිඟය | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 දිනට ශේෂය** | **350,265,754** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **563,268,272** | **(283,248,237)** | **1,610,672,185** |
| පෙර වර්ෂයේ ගැලපීම් | - | - | - | - | - | 2,969,761 | 2,969,761 |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 8,144,079 | 8,144,079 |
| රජයේ ප්‍රදාන | 52,550,000 | - | - | - | 30,981,682 | - | 83,531,682 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (61,134,488) | - | - | - | (29,030,405) | - | (90,164,893) |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **341,681,267** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **565,219,549** | **(272,134,396)** | **1,615,152,815** |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | **341,681,267** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **565,219,549** | **(272,134,396)** | **1,615,152,815** |
| පෙර වර්ෂයේ ගැලපීම් (සටහන 27.1) | - | - | - | - | - | (6,492,740) | (6,492,740) |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | - | 77,887,226 | 77,887,226 |
| රජයේ ප්‍රදාන | 32,230,000 | - | - | - | 42,097,219 | - | 74,327,219 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය | (69,455,534) | - | - | - | (50,734,626) | - | (120,190,160) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **304,455,732** | **6,243,013** | **13,447,061** | **960,696,321** | **556,582,142** | **(200,739,910)** | **1,640,684,359** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| | 2021 | 2020 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (පාඩුව) | 62,763,817 | 14,022,747 |
| **ගැලපීම්:** | | |
| ක්ෂයවීම් | 57,662,994 | 63,455,254 |
| ණය සහ අත්තිකාරම් සඳහා වෙන්කිරීම් | (426,929) | (30,241) |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 4,294,311 | 1,537,686 |
| කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා සඳහා වෙන්කිරීම් | 6,831,000 | 6,604,000 |
| කපා හරින ලද දිගුකාලීන ණයගැති ශේෂයන් | 1,490,585 | - |
| දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මත ලාභය | - | (567,695) |
| ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | (93,427,864) | (89,483,001) |
| විශේෂ ව්‍යාපෘති ක්‍රමක්ෂය | - | 5,676,324 |
| බොල් සහ අඩමාන ණය | 1,153,440 | 881,148 |
| පොළී ආදායම | (5,812,667) | (10,228,879) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 15,589,728 | 35,114,091 |
| | 50,118,414 | 26,981,433 |
| ගෙවන ලද විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | (12,430,323) | (15,657,320) |
| වෙනත් විස්තිර්ණ ආදායම | 15,123,409 | (5,878,668) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)** | **52,811,500** | **5,445,445** |
| තොග (වැඩිවීම)/අඩුවීම | (7,000,709) | 2,904,135 |
| ණයගැතියෝ සහ ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | 7,709,739 | (5,185,955) |
| අනෙකුත් ජංගම වත්කම් (වැඩිවීම)/අඩුවීම | 2,355,153 | 10,685,122 |
| පූර්ව ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | (32,287,478) | (33,411,854) |
| ලැබිය යුතු මුදල් - විශේෂ ව්‍යාපෘති (වැඩිවීම)/අඩුවීම | (2,379,158) | (3,750) |
| ණයහිමියෝ සහ උපචිත ගාස්තු වැඩිවීම/(අඩුවීම) | 48,637,815 | 33,073,378 |
| සංස්ථාවට ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම) | 880,322 | 353,564 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **70,727,185** | **13,860,085** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ස්ථාවර තැන්පතු වල ආයෝජන | (4,811,924) | (7,241,884) |
| කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මත ආයෝජනය කල මුදල | 11,683,811 | 3,403,911 |
| දේපළ, පිරියත සහ උපකරණ අලෙවිය මඟින් උපයා ගත් මුදල | - | 567,695 |
| පොළී ආදායම | 5,812,667 | 10,228,879 |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම/ඉදිකිරීම | (128,273,228) | (78,671,217) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **(115,588,675)** | **(71,712,615)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන/විශේෂ ව්‍යාපෘති | 44,894,869 | 30,981,682 |
| ලැබුණු ප්‍රදාන - ප්‍රාග්ධන | 32,230,000 | 52,550,000 |
| විශේෂ ව්‍යාපෘති වල ආයෝජනය | (32,558,563) | (9,920,820) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | **44,566,306** | **73,610,862** |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/අඩුවීම | (295,184) | 15,758,332 |
| 2021.01.01 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ | 135,498,663 | 119,740,330 |
| 2021.12.31 දිනට මුදල් සහ මුදල් හා සමාන දෑ (සටහන 22) | **135,203,479** | **135,498,663** |

# ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
# වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. සාමාන්‍ය තොරතුරු (නෛතික ආකෘතිය සහ ස්ථීර ලිපිනය)

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යනු 1969 අංක 36 දරන කර්මාන්ත සංවර්ධන පනත යටතේ සංස්ථාගත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අංක 615, ගාලු පාර, කටුබැද්ද, මොරටුව, ශ්‍රී ලංකාව යන ලිපිනයෙහි පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ කර්මාන්ත දිරිමත් කිරීම, ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම සඳහා සහාය වීම කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රමුඛතම කාර්යයන් වේ.

## 2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

### 2.1. සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKASs) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රවර්තන ව්‍යාපාර පදනමකින් සකස් කර ඇති අතර වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් හැර, මෙම කාල පරිච්ඡේදය පුරාවට අනුකූල වන ලෙස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති අදාළ කර ගෙන ඇත. අදාළ සටහන් යටතේ ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු හෙළිදරව් කිරීම් සිදු කරන අවස්ථා හැර, මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ සකස් කර ඇත.

මණ්ඩලයේ මූල්‍ය කාලසීමාව ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා මාස දොළහක (12) කාල සීමාවක් නියෝජනය කරයි.

### 2.2. දේපළ, පිරියත හා උපකරණ

#### 2.2.1. වත්කම්වල වටිනාකම

සියළුම දේපළ, පිරියත හා උපකරණ මුල් අවස්ථාවේදී පිරිවැයට වාර්තා කරන අතර තවදුරටත් ඓතිහාසික පිරිවැයෙන් ක්ෂයවීම් අඩුකර සඳහන් කරනු ලැබේ. අදාළ අයිතම අත්පත් කර ගැනීම සඳහා සෘජුවම දරන ලද පිරිවැය ඓතිහාසික පිරිවැයට ඇතුළත් වන අතර, අයිතමය අත්පත් කර ගන්නා අවස්ථාවේ හෝ කිසියම් කාල පරිච්ඡේදයක් ඇතුළත තොග උපදවීම හැර වෙනත් කාර්යයන් සඳහා එම කාල පරිච්ඡේදය තුළ එම අයිතමය භාවිතා කර තිබීමේ ප්‍රතිඵලයක් ලෙස ආයතනයක් දරනු ලබන බැඳීම් වන එම අයිතමය ගලවා ඉවත් කර එම අයිතමය තිබූ ස්ථානය යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා මූලිකව ඇස්තමේන්තු කරන පිරිවැය ද ඓතිහාසික පිරිවැයට ඇතුලත් වේ.

වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේදී, ධාරණ වටිනාකමෙහි යම් වැඩිවීමක් සිදු වුවහොත්, එය පූර්වයෙන් වියදමක් ලෙස හඳුනාගන්නා ලද එම වත්කමටම අදාළ පූර්ව ප්‍රත්‍යාගණන අඩු වීමකට ප්‍රතිවර්තනය නොවන්නේ නම්, එය සෘජුවම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලැබේ. මෙවැනි අවස්ථා වලදී, වැඩිවීම පූර්වයෙන් ලියාගෙන ඇති ප්‍රමාණයට ආදායමක් ලෙස හඳුනාගෙන තිබේ. ප්‍රත්‍යාගණනයෙහි ප්‍රතිඵලයක් ලෙස වත්කමක ධාරණ වටිනාකම අඩුවූ විට, එම අඩුවීම එම වත්කමට අදාළ පූර්ව වැඩිවීමක් ප්‍රතිවර්තනය නොකරන්නේ නම් එය වියදමක් ලෙස හඳුනාගනු ලබන අතර එවැනි අවස්ථාවකදී එම අඩුවීම එම වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි දරනු ලබන මුදල ඉක්මවා නොයන මට්ටමට අදාළ ප්‍රත්‍යාගණන අතිරික්තයක් තිබේ නම් එම අතිරික්තයෙන් එය අයකරනු ලැබේ. වත්කමට අදාළව ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි කිසියම් ශේෂයක් ඉතිරි වී තිබේ නම්, එය එම වත්කම ඉවත් කිරීමේදී හෝ බැහැර කිරීමේදී සෘජුවම සමුච්චිත ලාභයට / (අලාභයට) මාරු කරනු ලැබේ.

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත ප්‍රවාහය වීම සිදුවිය හැකි නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම් පමණක්, ඉන්පසුව දරනු ලබන පිරිවැය යෝග්‍ය පරිදි වත්කම් ධාරණ වටිනාකමට ඇතුලත් කිරීම හෝ වෙනම ම වත්කමක් ලෙස හඳුනා ගැනීම සිදුකරනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසේ ධාරණ වටිනාකම ඉවත් කරනු ලැබේ. සියලුම අලුත්වැඩියා සහ නඩත්තු වියදම්, එම වියදම් දරන ලද මූල්‍ය කාල පරිච්ඡේදය ඇතුළත ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

**2.2.2. ක්ෂයවීම්**

දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයක් භාවිතා කිරීම සඳහා සූදානම්ව තිබීම ආරම්භ වූ දිනයේ සිටම ක්ෂයවීම් අඩුකිරීම ආරම්භ වන අතර එම අයිතමය ඉවත් කරන තුරු එම කාල පරිච්ඡේදය තුළ එම උපකරණය ප්‍රයෝජනයට නොගෙන තිබුණ ද, අඛණ්ඩව ක්ෂයවීම් අඩුකරනු ලැබේ. ක්ෂයවීම සරල රේඛීය පදනමකින් දේපළ, පිරියත හෝ උපකරණ අයිතමයේ ඇස්තමේන්තු කර ඇති ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශනයට අය කරනු ලැබේ. ඉඩම් ක්ෂය කිරීම සිදු නොකෙරේ. ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයන් පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| 1. ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි | 2.5% (වසර 40) |
| 2. පරිගණක මෘදුකාංග | 7% (වසර 14) |
| 3. පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, කාර්යාලීය උපකරණ, විද්‍යාගාර උපකරණ, ලී බඩු සහ සවිකිරීම්, පාපැදි, විවිධ වත්කම්, උපයෝජ්‍ය සේවා, PABX පද්ධති සහ වෙනත් වත්කම් | 10% (වසර 10) |
| 4. පරිගණක සහ මෝටර් වාහන | 20% (වසර 05) |
| 5. මෙවලම්, පොත් සහ ගමන් මලු | 25% (වසර 04) |

වත්කම් වල අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් එක් එක් ගිණුම්කරණ කාලය අවසානයේදී සමාලෝචනය කර යෝග්‍ය වන්නේ නම් ගැලපීම් සිදු කරනු ලැබේ.

වත්කමක ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකමට වඩා වැඩි නම්, එකෙණෙහිම එම වත්කමෙහි ධාරණ වටිනාකම එහි නැවත අයකර ගත හැකි වටිනාකමට ලියා තබනු ලැබේ.

බැහැර කිරීමේදී සිදුවන ලාභය/පාඩුව බැහැර කිරීමෙන් ලබන මුදල ධාරණ වටිනාකම හා සංසන්දනය කිරීමෙන් තීරණය කරනු ලැබේ. එවැනි ලාභ/පාඩු ආදායම් ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබේ.

## 2.3. ප්‍රාග්ධනිත නොකරන ලද ඉඩම් පිළිබඳ විස්තර

පහත සඳහන් ඉඩම් කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන නමුත් මණ්ඩලයට එම ඉඩම් වල නීත්‍යානුකූල හිමිකමක් නොමැති බැවින් මණ්ඩලය ඒවා ප්‍රාග්ධනිත කර නොමැත:

| අංකය | ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කය | වර්ගඵලය | | | භාවිතා කරන කාර්යය | භුක්තිය ලබා ගත් දිනය | අත්පත් කර නොගැනීමට හේතුව | අත්පත් කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය |
|---|---|---|---|---|---|---|---|---|
| | | අක්කර | රූඩ | පර්චස් | | | | |
| 1 | අනුරාධපුරය | | 1 | 20 | ප්‍රාදේශීය කාර්යාලය | 1971 සිට | රජයේ ඉඩමකි | බදු ගිවිසුමක් මගින් අයිතිය පවරා දී ඇත. |
| | | | | | පොදු සේවා මධ්‍යස්ථානය | | රජයේ ඉඩමකි | බුක්තිය ලබා දී ඇත, නමුත් අයිතිය පවරා දී නොමැත. |
| 2 | පොළොන්නරුව | | 3 | 26.6 | ප්‍රාදේශීය කාර්යාලය සහ සංචාරක බංගලාව | 1992 සිට | රජයේ ඉඩමකි | දිස්ත්‍රික් ලේකම් වෙත භාර දී ඇත. |
| 3 | මාතර | 1 | 1 | 6.2 | ප්‍රාදේශීය කාර්යාලය සහ පොදු සේවා මධ්‍යස්ථානය | | | අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර් - මාතර විසින් ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත. |
| 4 | හම්බන්තොට | | | | ප්‍රාදේශීය කාර්යාලය | 2006 සිට | ඉඩම සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | |
| | | | | | සම් භාණ්ඩ මධ්‍යස්ථානය, විතාරන්දෙණිය | | | ඉඩම අත්පත් කර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. |
| 5 | මොණරාගල | | | 48 | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ඉඩම භාවිතා කිරීම සඳහා ලිපියක් මගින් මණ්ඩලයට බුක්තිය ලබා දී ඇත. |
| 6 | බදුල්ල | | | 50 | "ගම් උදා" මධ්‍යස්ථානය - මහියංගනය | 1997 සිට | නාගරික සංවර්ධන අධිකාරිය විසින් බුක්තිය පවරා ගෙන ඇත. | මහියංගණය සමෘද්ධි බැංකුව විසින් මණ්ඩලයට බුක්තිය පවරා දී ඇත. |
| 7 | කොළඹ | හෙක්ටයාර 1.2953 | | | ප්‍රධාන කාර්යාලය | | අයිතිය: කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | ඉඩම අත්පත් කර ගැනීම සඳහා අදාල ආයතන වලට ලිපියක් මගින් ඉල්ලීම් කර ඇත. |
| | | | | | නවබිම මධ්‍යස්ථානය | | | |
| 8 | කොළඹ | හෙක්ටයාර 0.4046 | | | රබර් සංවර්ධන මධ්‍යස්ථානය | 1980 සිට | 99 අවුරුදු බදු පදනම මත | |
| 9 | අම්පාර | | | | ප්‍රාදේශීය කාර්යාලය | | රජයේ ඉඩමකි | ලිපියක් මගින් පවරා දී ඇත. |
| 10 | කොළඹ | 13 | 2 | 6 | කාර්මික ජනපදය, පානළුව | 2006 සිට | | කැබිනට් පත්‍රිකාව අනුමත කර ඇත. අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. |
| 11 | බද්දේගම | 1 | 2 | 0.5 | කාර්මික ජනපදය | 1992 සිට | | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට ඉඩම් පැවරීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර සාකච්ඡා පවත්වා ඇත. |
| 12 | බෙලිඅත්ත | 10 | 0 | 29.2 | කාර්මික ජනපදය | 1995 සිට | | |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 2.4. ආයෝජන දේපළ

ආයෝජන දේපළ ආරම්භයේ දී පිරිවැයෙන් හඳුනාගනු ලබයි. ප්‍රධාන අලුත්වැඩියාවන් සහ වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය ප්‍රාග්ධනීත කර ඇත. නඩත්තු කිරීම්, අළුත්වැඩියා කිරීම් සහ සුළු වැඩිදියුණු කිරීම් සඳහා වන පිරිවැය, එය සිදු වූ අවස්ථාවේ දී, ලාභ හා අලාභ තුළ හඳුනා ගැනේ. ආයෝජන දේපළක් බැහැර කිරීමේදී, බැහැර කිරීමෙන් ලැබෙන මුදල සහ ධාරණ වටිනාකම අතර වෙනස ලාභ හා අලාභ තුළ හඳුනා ගනු ලැබේ.

ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සියලු දේපළවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනමක් භාවිතා කිරීමෙනි. වාර්ෂික ක්ෂයවීම් අනුපාතය පහත පරිදි වේ:

ඉඩම් වැඩිදියුණු කිරීම් සහ ගොඩනැගිලි - 2.5%

### 2.5. මූල්‍ය වත්කම්

#### 2.5.1. වර්ගීකරණය

කාර්මික සංවර්ධන මණ්ඩලය මූල්‍ය වත්කම් අත්පත් කර ගත් කාර්යය පදනම් කර ගෙන එහි මූල්‍ය වත්කම් ණය සහ ලැබිය යුතු මුදල් වශයෙන් වර්ග කර ඇත.

**ණය සහ ලැබිය යුතු මුදල්:**

ණය සහ ලැබිය යුතු මුදල් සක්‍රීය වෙළඳ පොළක මිල ගණන් ප්‍රකාශ නොකළ ස්ථාවර හෝ නිශ්චය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. ඒවා ශේෂ පත්‍ර දිනෙන් පසු, මාස 12 ට වැඩි කල්පිරීම් හැරෙන්නට වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ වශයෙන් ජංගම වත්කම් වල ඇතුළත් කර ඇත.

#### 2.5.2. මූල්‍ය වත්කම් හඳුනාගැනීම

ණය සහ ලැබිය යුතු මුදල් ආරම්භක අවස්ථාවේදී සාධාරණ වටිනාකමට ගණුදෙනු පිරිවැය එකතුකළ අගයට හඳුනාගනු ලබන අතර ඉන්පසුව සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙනයනු ලැබේ.

#### 2.5.3. මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළහැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ එකවර වත්කම උපලබ්ධි කර වගකීම් පියවීමේ චේතනාවක් ඇති විට මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කර ශුද්ධ වටිනාකම ශේෂ පත්‍රයේ වාර්තා කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

**2.5.4. මූල්‍ය වත්කම් හානිකරණය**

**ක්‍රමක්ෂය කල පිරිවැයට ගෙන යනු ලබන වත්කම් (ණය සහ ලැබිය යුතු මුදල්)**

සෑම වාර්තාකිරීමේ කාල පරිච්ඡේදයක් අවසානයේදී ම කාර්මික සංවර්ධන මණ්ඩලය එහි මූල්‍ය වත්කමකට හානි සිදුවී ඇති බවට වෛෂයික සාක්ෂි තිබේද යන්න තක්සේරු කරයි. කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් මූලික වශයෙන් හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවූ සිද්ධීන් (අලාභ සිද්ධි) එකක හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස එම වත්කම් හානිකරණය වී ඇති බවට වෛෂයික සාක්ෂි ඇත්නම් පමණක් සහ එම අලාභ සිද්ධිය (සිද්ධීන්) විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි පරිදි කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන්ට බලපෑමක් ඇතිකරන්නේ නම් කාර්මික සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හෝ වත්කම් හානි වී ඇති බවට සලකනු ලබන අතර මණ්ඩලය හානිකරණ පාඩු දරනු ලැබේ. හානිකරණට අදාළ වෛෂයික සාක්ෂි පවතින්නේ ද යන්න කාර්මික සංවර්ධන මණ්ඩලය මුලින්ම තක්සේරු කරයි.

ණය සහ ලැබිය යුතු මුදල් සඳහා අලාභයෙහි වටිනාකම වත්කමෙහි ධාරණ වටිනාකමෙහි සහ වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි (දැනට අලාභය දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස මනිනු ලැබේ. වත්කමෙහි ධාරණ අගය අඩු කරනු ලබන අතර අලාභයෙහි වටිනාකම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

පසුව එළඹෙන කාල පරිච්ඡේදයකදී හානිකරණ අලාභයෙහි වටිනාකම අඩු වන්නේ නම් සහ එම අඩුවීම වෛෂයිකව හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමකට (ණයගැතියාගේ ණය ශ්‍රේණිගත කිරීමෙහි වර්ධනයක් වැනි) අදාළව විය හැකි නම්, පූර්වයෙන් හඳුනා ගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්ත කිරීම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණ පරීක්ෂා කිරීම 2.8 වැනි සටහනෙහි විස්තර කර ඇත.

**2.6. මූල්‍ය වගකීම්**

මූල්‍ය වගකීම් වලට වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ සහ ණයට ගැනීම් ඇතුළත් වේ. ණය හැර අනෙකුත් සියලුම මූල්‍ය වගකීම් ආරම්භක අවස්ථාවේදී ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනා ගනු ලබන අතර ඉන්පසුව, වට්ටම් කිරීමෙහි ප්‍රතිඵලය නොසැලකිය හැකි මට්ටමේ නොමැති නම්, සඵල පොළී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය කල පිරිවැයට ඒවා මනිනු ලබන අතර එවිට ඒවා පිරිවැයට සඳහන් කරනු ලැබේ.

**2.7. තොග**

තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග තක්සේරු කරනු ලැබේ. සාමාන්‍ය පිරිවැය ක්‍රමය (AVCO Method) යොදා ගනිමින් පිරිවැය තීරණය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී තොග විකිණිය හැකි මිලෙන් නිම කිරීමේ ඇස්තමේන්තු කල පිරිවැය සහ විකිණීම සිදුකිරීම සඳහා ඇස්තමේන්තු කල පිරිවැය අඩු කළ විට ලැබෙන මිලයි. තොග ඒවායේ වර්තමාන පිහිටීමට සහ තත්ත්වයට ගෙන ඒමට දරන ලද පිරිවැය පහත සඳහන් පරිදි ගිණුම්ගත කරනු ලැබේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | - පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට |
| නිම් භාණ්ඩ | - පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට |
| ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩ | - සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය සහ සාමාන්‍ය මෙහෙයුම් ධාරිතාව පදනම් කර ගත් නිෂ්පාදන පොදු කාර්ය වලින් යෝග්‍ය කොටසක පිරිවැයට. |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 2.8. වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ යනු සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියේ දී විකුණන ලද භාණ්ඩ සඳහා හෝ ඉටුකරන ලද සේවා සඳහා ගණුදෙනුකරුවන් ගෙන් අය වීමට ඇති මුදල් වේ. එක් වර්ෂයක් හෝ එයට අඩු කාලයක් තුළ අය කර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් (හෝ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රයේ දී එයටත් වැඩි කාලයක් නම්), එම මුදල් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. නොඑසේ නම් ඒවා ජංගම නොවන වත්කම් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලයට ලැබිය යුතු දේ වලට අදාළ මුල් කොන්දේසි අනුව අයවීමට ඇති සියලුම වටිනාකම් අය කර ගැනීමට නොහැකි වනු ඇතැයි වෛෂයික සාක්ෂි ඇති විට, වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා ප්‍රතිපාදනයක් පිහිටුවනු ලැබේ. ණයගැතියාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට පත්වීමට ඉඩ තිබීම, ගෙවීම් පැහැර හැරීම හෝ කඩ කිරීම ආදිය වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය වී ඇති බව පෙන්නුම් කරන සාධක වේ. ප්‍රතිපාදනයෙහි වටිනාකම, වත්කමෙහි ධාරණ වටිනාකම සහ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කළ ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලනයන් හි වර්තමාන වටිනාකම අතර වෙනස වේ. 2018 වර්ෂයේ සිට පහත සඳහන් පරිදි ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ:

| වයස | | ප්‍රතිපාදන % |
|---|---|---|
| ප්‍රවර්තන වර්ෂය | - | 0% |
| වසර 01 - 02 | - | 10% |
| වසර 03 - 05 | - | 25% |
| වසර 05 ට වැඩි | - | 100% |

## 2.9. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ ට අත ඉතුරු මුදල්, බැංකු වල ඇති ඒක්ෂණ තැන්පතු, මාස 03ක හෝ ඊට අඩු මුල් කල්පිරීමේ කාලයක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහල ද්‍රවශීලතාවයක් සහිත ආයෝජන සහ බැංකු අයිරා ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ බැංකු අයිරා ඍණ ශේෂයන් ලෙස පෙන්වා ඇත.

## 2.10. ප්‍රතිපාදන

කාර්මික සංවර්ධන මණ්ඩලයට අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳියාවක් ඇති විට, එම බැඳියාව බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලායාමක් සිදුවීම අවශ්‍ය විය හැකි විට සහ බැඳියාවෙහි වටිනාකම විශ්වාසනීය ලෙස තක්සේරු කල හැකි විට ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

## 2.11. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ඉල්ලූ විට හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයක කාලයක් ඇතුළත ගෙවීමට නියමිතව ඇති ගෙවිය යුතු දෑ වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණ කර ඇති අයිතම වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වර්ෂයකට වැඩි කාල පරිච්ඡේදයක දී ගෙවීමට නියමිතව ඇති වගකීම් වේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 2.12. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යන්නෙන් අදහස් කරන්නේ සේවකයෙකු විශ්‍රාම ගැනීමේ දී එම සේවකයාට ලැබෙන ප්‍රතිලාභයෙහි වටිනාකම වන අතර එය සාමාන්‍යයෙන් සේවය කර ඇති වසර ගණන සහ වන්දි මුදල (වේතනය) වැනි සාධක එකක් හෝ වැඩි ගණනක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම 1983 අංක 12 දරන පනත යටතේ ලබාදෙන පාරිතෝෂිකයෙන් සමන්විත වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ දිගුකාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) භාවිතා කර වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ප්‍රතිලාභ ගෙවනු ලබන ව්‍යවහාර මුදලින් බලපවත්වන රජයේ බැඳුම්කර වල පොළී අනුපාත භාවිතා කරමින් ඇස්තමේන්තු කරන ලද සහ කල්පිරීම සඳහා අදාළ විශ්‍රාම බැඳියාවෙහි කොන්දේසි වලට ආසන්නවන කොන්දේසි සහිත අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කරමින් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවෙහි වර්තමාන වටිනාකම තීරණය කරනු ලැබේ.

අත්දැකීම් ගැලපීම් සහ ආයු ගණක උපකල්පනයන් හි වෙනස්කම් මඟින් හටගන්නා ආයු ගණක ලාභ සහ පාඩු එම ලාභ හෝ පාඩු හටගන්නා කාල පරිච්ඡේදය තුළ පරිපූර්ණ ආදායමෙහි ස්කන්ධයට අය කිරීම හෝ බැර කිරීම සිදු කරනු ලැබේ.

සැලැස්මෙහි සිදු කරන වෙනස්කම් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා (පැවරීමේ කාල පරිච්ඡේදය) සේවයේ රැඳී සිටින සේවකයින්ට කොන්දේසික නොවන්නේ නම් අතීත සේවා පිරිවැය එකෙණෙහි ම පරිපූර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. මෙසේ කිරීමේ දී, අතීත සේවා පිරිවැය පැවරීමේ කාල පරිච්ඡේදය පුරා සරල රේඛීය පදනමකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

### 2.13. නිශ්චිත දායක සැලැස්ම

කාර්මික සංවර්ධන මණ්ඩලයේ සියලුම ස්ථිර සහ කොන්ත්‍රාත් සේවකයින් සේවක අර්ථසාධක අරමුදලෙහි (EPF) සහ සේවක භාරකාර අරමුදලෙහි (ETF) සාමාජිකයින් වන අතර, ඒ සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් අනුපිළිවෙලින් එවැනි සේවකයින්ගේ මූලික වේතනය හෝ වැටුප සහ ජීවන වියදම් දීමනා වලින් 12% සහ 3% බැගින් දායක මුදල් ගෙවනු ලැබේ.

### 2.14. ආයෝජන

ආයෝජන, තනි ආයෝජන පදනමින් තීරණය කරන ලද පිරිවැයට ගෙනයනු ලැබේ.

### 2.15. රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට හඳුනාගනු ලබන අතර මෙහි දී ප්‍රදානය ලැබෙනු ඇති බවට සහ කණ්ඩායම ඒ සම්බන්ධිත සියලු කොන්දේසි වලට එකඟ වනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇත.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන මඟින් හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය සමඟ ගැලපීමට අවශ්‍ය කරන කාල පරිච්ඡේදය පුරා එම ප්‍රදාන ආදායම් ප්‍රකාශනයෙහි විලම්භනය කර හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ රජයේ ප්‍රදාන, විලම්භිත රජයේ ප්‍රදාන ලෙස ජංගම නොවන වත්කම් වල ඇතුළත් කර ඇති අතර, අදාළ වත්කම් වල අපේක්ෂිත ජීවිත කාලය පුරා සරල රේඛීය පදනමකට ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 2.16. පරිත්‍යාග

පරිත්‍යාග යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය නොවන මාරුකිරීම් වේ. කෙසේ වුවත්, කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දායකයා වෙත නාම මාත්‍ර ප්‍රතිෂ්ඨාව ලබා දෙන අවස්ථා තිබිය හැක. එවැනි පරිත්‍යාග සඳහා, දායකයින් වෙත ලබාදී ඇති ප්‍රතිෂ්ඨාව, අසාධාරණ හුවමාරු ගනුදෙණුවක් ප්‍රතිඵලය වන තරමට, ලැබුණු පරිත්‍යාගයෙහි ප්‍රතිෂ්ඨාවට වඩා සැලකිය යුතු තරමින් අඩු නම්, ඒවා ලැබුණු පරිත්‍යාග ලෙස හඳුනා ගත යුතුය.

### 2.17. ආදායම් හඳුනාගැනීම

#### 2.17.1. විකුණන ලද භාණ්ඩ සහ ඉටුකරන ලද සේවා

හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ ගැනුම්කරුට පවරා දී ඇති විට භාණ්ඩ අලෙවි කිරීමෙන් උපයාගත් ආදායම ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. අයවීමට ඇති ප්‍රතිෂ්ඨාව, ආශ්‍රිත පිරිවැය අයකර ගැනීම හෝ භාණ්ඩ ආපසු එවිය හැකි වීම පිළිබඳ සැළකිය යුතු අවිනිශ්චිතතාවයන් තිබේ නම් කිසිදු ආදායමක් හඳුනාගනු නොලැබේ.

#### 2.17.2. පොළී ආදායම

පොළී ආදායම කාල සමානුපාත පදනමකින් හඳුනාගනු ලබන අතර එවැනි ආදායම කාර්මික සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී විකුණනු ලබන භාණ්ඩ සඳහා හෝ ඉටු කරනු ලබන සේවා සඳහා ලැබෙන හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකමෙන් සමන්විත වේ. එකතු කළ අගය මත බද්ද (VAT), ප්‍රතිලාභය, ප්‍රතිදානය සහ වෙළඳ වට්ටම් තිබේ නම් ඒවායේ ශුද්ධ අගය මඟින් ආදායම පෙන්වනු ලැබේ.

### 2.18. වියදම් හඳුනාගැනීම

#### 2.18.1. මෙහෙයුම් වියදම්

වියදම් උපචිත පදනමකින් හඳුනාගනු ලැබේ. කාල පරිච්ඡේදය සඳහා ලාභය ගණනය කිරීමේදී සාමාන්‍ය ව්‍යාපාර පරිපාටියෙහි දී සහ කාර්යක්ෂම තත්ත්වයෙන් දේපොළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමෙහි දී දරන ලද සියලු වියදම් ආදායමට අය කරනු ලැබේ.

#### 2.18.2. ශුද්ධ මූල්‍ය පිරිවැය

ශුද්ධ මූල්‍ය පිරිවැය ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලබන ණයට ගැනීම් සඳහා ගෙවිය යුතු පොළිය, ආයෝජනය කරන ලද අරමුදල් වලින් ලැබිය යුතු පොළිය සහ විදේශ විනිමය ලාභ සහ පාඩු වලින් සමන්විත වේ.

ණයට ගැනීම් සම්බන්ධයෙන් දරන ලද සියලු පොළී සහ අනෙකුත් පිරිවැය ශුද්ධ මූල්‍ය පිරිවැයෙහි කොටසක් ලෙස වියදම් දරා ඇත.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

## 3. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 3.1. මූල්‍ය අවදානම් සාධක

කාර්මික සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය උපකරණ බැංකු ණය, කෙටි කාලීන තැන්පතු සහ මුදල් වලින් සමන්විත වේ. මෙම මූල්‍ය උපකරණ වල ප්‍රධාන අරමුණ වන්නේ කාර්මික සංවර්ධන මණ්ඩලයේ මෙහෙයුම් වල ද්‍රවශීලතාව ඉහළ නැංවීම සහ පවත්වා ගෙන යාම සහ කාර්මික සංවර්ධන මණ්ඩලයේ සංචිත මත ලැබෙන ප්‍රතිලාභය උපරිම කිරීමයි. කාර්මික සංවර්ධන මණ්ඩලයට එහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වලින් සෘජුව ම ඇතිවන ලැබිය යුතු වෙළඳ සහ ගෙවිය යුතු වෙළඳ ආදී වශයෙන් වූ වෙනත් විවිධ මූල්‍ය උපකරණ ද තිබේ.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ වූ මූල්‍ය අවදානම් රැසකට නිරාවරණය වී ඇත. අනෙකුත් ඒවා අතර, විදේශ විනිමය අවදානම්, ණය අවදානම්, පොළී අනුපාත අවදානම් සහ ද්‍රවශීලතා අවදානම් මෙයට අයත් වේ. කාර්මික සංවර්ධන මණ්ඩලයේ ආර්ථික දර්ශනය සහ මෙම අවදානම් වලට එහි ඇති නිරාවරණය පදනම් කර ගෙන කාර්මික සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂක මණ්ඩලය කලින් කලට විවිධ අවදානම් කළමනාකරණ ක්‍රමෝපායයන් අනුමත කරයි.

සාමාන්‍යයෙන් ණය අවදානමට භාජනය වන මූල්‍ය වත්කම් වල උපරිම අවදානම් තත්ත්වය ඒවායෙහි ධාරණ අගයට සමාන වේ. පහත වගුව මඟින් උපරිම අවදානම් තත්ත්වයන් පෙන්නුම් කර ඇත. (2021.12.31 දිනට)

| | වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | මුදල් සහ මුදල් හා සමාන දෑ | එකතුව |
|---|---|---|---|
| **අවදානම් නිරාවරණය** | | | |
| **වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ** | 24,932,232 | - | 24,932,232 |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ** | - | 135,203,479 | 135,203,479 |
| | **24,932,232** | **135,203,479** | **160,135,711** |

### 3.1.1. පොළී අනුපාත අවදානම

පොළී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොළී අනුපාතවල සිදුවන වෙනස්කම් නිසා මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම හෝ අනාගත මුදල් ගලනයන් උච්චාවචනය විය හැකි වීමේ අවදානමයි. කාර්මික සංවර්ධන මණ්ඩලය වෙළඳ පොළ පොළී අනුපාත වෙනස් වීමේ අවදානමට ඇති නිරාවරණය මූලික වශයෙන්ම කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි පවෙන අනුපාත සහිත ණය බැඳීම්වලට අදාළව වේ. කාර්මික සංවර්ධන මණ්ඩලය දෛනිකව මුදල් ගලනයන් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම, ණයට ගැනීම් අවම මට්ටමක තබා ගැනීම, සහ ණයට ගැනීම හා තැන්පතු සඳහා වාසිදායක අනුපාතයන් ගිවිස ගැනීම ආදී ක්‍රම මඟින් එහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කරයි.

කාර්මික සංවර්ධන මණ්ඩලය විවිධ්‍ය පොළී අනුපාත යටතේ ණය ලබා ගෙන නොමැති නිසා 2021 දෙසැම්බර් 31 වැනි දිනට කාර්මික සංවර්ධන මණ්ඩලය පොළී අනුපාත අවදානමකට නිරාවරණය වී නොමැත.

### 3.1.2. ණය අවදානම

මුදල් සහ මුදල් හා සමාන දෑ, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, සහ බැංකු හා මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම හිඟ ලැබිය යුතු දෑ සහ සිදුකල ගණුදෙනු ද ඇතුළත්ව විදේශ ගණුදෙනුකරුවන්ට ඇති ණය නිරාවරණයන් ආදියෙන් ණය අවදානම ඇතිවේ.

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 3.2. ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේ දී, කාර්මික සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ කොටස්කරුවන්ට ප්‍රතිලාභ ලබාදීම සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ප්‍රයෝජන සලසා දීම පිණිස ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට කාර්මික සංවර්ධන මණ්ඩලය සතු හැකියාව ආරක්ෂා කිරීමත්, ප්‍රාග්ධන පිරිවැය අඩුකිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීමත් ය.

කර්මාන්තයේ නියැලී සිටින අනෙකුත් කර්මාන්තකරුවන් හා අනුකූලව, කාර්මික සංවර්ධන මණ්ඩලය තෝලන අනුපාතය පදනම්න් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු හිමිකම් වලින් මුළු ණයට ගැනීම් ලෙස ගණනය කරනු ලැබේ. මුළු ණය ගැනුම් වලට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා ඇති පරිදි ජංගම නොවන සහ ජංගම ණයට ගැනීම් ඇතුළත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි මුළු හිමිකම් හි දක්වා ඇති පරිදි 'මුළු හිමිකම' ගණනය කරනු ලැබේ.

2021 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය පහත සඳහන් පරිදි විය.

| | 2021 | 2020 |
|---|---|---|
| මුළු ණයට ගැනීම් | 488,795,117 | 438,840,521 |
| මුළු හිමිකම් | 1,640,684,359 | 1,615,152,815 |
| **තෝලන අනුපාතය** | **29.79%** | **27.17%** |

දිගු කාලීන ණය කිසිවක් ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, රු.මි.50ක ස්ථාවර තැන්පතුව ඇපයට තබා 2.5%ක අමතර පොළී අනුපාතයකට රු.මි.45ක අයිරා පහසුකමක් ලබාගෙන තිබුණි. මේ මඟින් අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම හරහා පොළිය ලබාගැනීම මඟින් අමතර ආදායමක් උපයා ගැනීමට මෙයින් අපට පහසුකම් සැලසුණි.

## 4. අවිනිශ්චිතතාවයන් සහ විනිශ්චයන් තක්සේරු කිරීමේ ප්‍රධාන මූලාශ්‍ර පිළිබඳ තොරතුරු

තක්සේරු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීම් කරනු ලැබේ. ඒවා ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කළ හැකි, අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ද ඇතුළත් අනෙකුත් සාධක මත පදනම්ව ඇත.

### 4.1. ඉතා වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

කාර්මික සංවර්ධන මණ්ඩලය අනාගතය සම්බන්ධ ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ගිණුම්කරණ ඇස්තමේන්තු, ස්වභාවයෙන්ම අදාළ සත්‍ය ප්‍රතිඵල වලට සමාන වන්නේ කලාතුරකිනි. මීළඟ මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් වල ධාරණ වටිනාකමට ප්‍රමාණික ගැලපීමක් සිදු කිරීමට හේතු වන සැලකිය යුතු අවදානමක් සහිත ඇස්තමේන්තු සහ උපකල්පන පහත අනාවරණය කර ඇත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

### 4.1. ඉතිරි කොටස...

#### 4.1.1. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන වටිනාකම උපකල්පන කිහිපයක් භාවිතා කරමින් ආයු ගණන පදනමකින් තීරණය කරනු ලබන සාධක කිහිපයක් මත රඳා පවතී. නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) තීරණය කිරීමේදී යොදාගනු ලබන උපකල්පන වලට වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක අනුපාතය, මරණ අනුපාතිකය, කාර්යභාරයෙන් ඉවත් වීමේ සහ ආබාධිත වීමේ අනුපාතයන් සහ විශ්‍රාම ගැනීමේ වයස ඇතුළත් වේ. මෙම උපකල්පන වලට සිදුකරනු ලබන කිසියම් වෙනස්කමක් මඟින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල ධාරණ වටිනාකම මත බලපෑමක් ඇති කරනු ඇත.

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PCU) භාවිතා කරමින් ස්වායක්ත ආයු ගණකයින් අනුව ගණනය කරනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකම ආයු ගණක තක්සේරුකරු විසින් නිසි පොළී අනුපාත යොදා ගනිමින් ඇස්තමේන්තු කල අනාගත මුදල් ගලා යෑම් වට්ටම් කිරීමෙන් තීරණය කරනු ලැබේ.

විශ්‍රාම බැඳීම් සඳහා වන අනෙකුත් ප්‍රධාන උපකල්පන පවතින වෙළඳපොළ තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් රඳා පවතී. අමතර තොරතුරු 28 වැනි සටහනෙහි අනාවරණය කර ඇත.

#### 4.1.2. දේපළ, පිරියත සහ උපකරණ වල ප්‍රයෝජනවත් ජීවිත කාලයන්

කාර්මික සංවර්ධන මණ්ඩලය, ව්‍යාපාර සැලැස්ම සහ ක්‍රමෝපායයන්, අපේක්ෂිත භාවිත මට්ටම සහ අනාගත තාක්ෂණික වැඩිදියුණු කිරීම් වැනි සාධක පදනම් කරගෙන දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කරයි. ඉහත සඳහන් කල සාධක වල සිදුවන වෙනස්කම් හේතුවෙන් මෙම ඇස්තමේන්තු වල ඇති විය හැකි වෙනස්කම් මෙහෙයුම් වල අනාගත ප්‍රතිඵල වලට ප්‍රමාණික ලෙස බලපෑ හැකිය. දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කල ප්‍රයෝජනවත් ජීවිත කාලයෙහි අඩු වීමක් සිදුවීම මඟින් වාර්තාකර ඇති ක්ෂය කිරීම් වැඩිවිය හැකි අතර දේපළ, පිරියත සහ උපකරණ අඩුවිය හැක.

### 4.2. අවිනිශ්චිත වගකීම්

මුදල් වර්ෂය අවසාන වන විට නඩු 15ක් තිබුණි. කෙසේ වෙතත්, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ නීති අංශය විසින් සපයන ලද තොරතුරු වලට අනුව, මෙම නඩුවල ප්‍රතිඵලය ලෙස කිසිදු වන්දියක් ගෙවීමට සිදුවීමේ හැකියාවක් නොමැත. එබැවින්, ඒ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තුඩුදෙන වගකීමක් පැන නැඟී නොමැත.

### 4.3. නැවත වර්ගීකරණය කිරීම් සහ සංසන්දනාත්මක සංඛ්‍යා

අවශ්‍ය තැන්හි දී ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සංසන්දනාත්මක බව වැඩිකිරීම සඳහා පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට යම් යම් නැවත වර්ගීකරණය කිරීම් සිදු කර තිබේ. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල කිරීම පිණිස සංසන්දනාත්මක සංඛ්‍යා ගැලපීම් කර ඇත.

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**05 ආදායම**

**5.1 විකුණුම්**

| | 2021 | 2020 |
|---|---|---|
| භාණ්ඩ විකිණීම (යොමු සටහන 5.1.1) | 48,648,188 | 43,744,570 |
| අබලි ද්‍රව්‍ය විකිණීම | 251,707,088 | 247,576,340 |
| කැස්පර් විකිණීම | 2,975,464 | 2,070,100 |
| ප්‍රකාශන අලෙවිය | 185,770 | 338,037 |
| | **303,516,510** | **293,729,047** |

**5.1.1 භාණ්ඩ විකිණීම**

| | 2021 | 2020 |
|---|---|---|
| ඉංජිනේරු | 22,755,969 | 20,221,351 |
| සම් | 1,447,292 | 184,589 |
| රබර් | 24,264,348 | 17,748,630 |
| තාක්ෂණික සේවා | 180,579 | - |
| කලාපීය - විශේෂ ව්‍යාපෘතිය UNDP | - | 5,590,000 |
| | **48,648,188** | **43,744,570** |

**5.2 සේවා**

| | 2021 | 2020 |
|---|---|---|
| කුලී - කාර්මික ජනපද | 67,640,845 | 66,905,136 |
| ජල ගාස්තු | 6,552,184 | 5,934,177 |
| වැඩිපුර අයකිරීම් | 3,001,528 | 3,493,986 |
| ඉඩම් සහ ගොඩනැගිලි පැවරුම් ගාස්තු | 1,950,000 | 4,020,000 |
| පුහුණු වැඩසටහන් | 8,769,408 | 19,596,869 |
| ව්‍යාපෘති වාර්තා | 3,529,941 | 4,405,643 |
| සේවා ගාස්තු | - | 311,702 |
| | **91,443,905** | **104,667,513** |
| | **394,960,415** | **398,396,560** |

**06 විකුණුම් සහ සේවා පිරිවැය**

| | 2021 | 2020 |
|---|---|---|
| විකුණුම් පිරිවැය - සෘජු ද්‍රව්‍ය | 25,466,663 | 23,428,568 |
| විකුණුම් පිරිවැය - කාර්මික ජනපද | 5,297,216 | 4,258,908 |
| විකුණුම් පිරිවැය - අබලි ව්‍යාපෘතිය | 193,746,158 | 165,876,436 |
| විකුණුම් පිරිවැය - කැස්පර් | 2,203,700 | 1,683,400 |
| විකුණුම් පිරිවැය - සෘජු ශ්‍රමය | 5,393,247 | 4,178,580 |
| විකුණුම් පිරිවැය - සෘජු නොවන ද්‍රව්‍ය | 474,789 | 483,643 |
| පරිභෝජ්‍ය ද්‍රව්‍ය - වාත්තු අමුද්‍රව්‍ය | - | 808,537 |
| සාමාන්‍ය පොදුකාර්ය | 1,784,735 | 1,377,814 |
| යන්ත්‍රසූත්‍ර පොදුකාර්ය | 1,475,987 | 734,861 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම | 88,728 | 433,817 |
| විදුලිය | 4,158,788 | 3,393,208 |
| පිරියත සහ යන්ත්‍රසූත්‍ර ක්ෂය | 5,074,067 | 3,890,365 |
| ආයෝජන දේපළ මත ක්ෂය - ඉඩම් වැඩිදියුණු කිරීම් | 9,866,790 | 9,933,816 |
| ආයෝජන දේපළ මත ක්ෂය - ගොඩනැගිලි | 7,217,418 | 7,225,651 |
| උපයෝගිතා සේවා ක්ෂය | 3,201,740 | 3,249,654 |
| ඉංජිනේරු වැඩ ගාස්තු | 71,199 | 163,680 |
| උප කොන්ත්‍රාත් ගාස්තු | 124,791 | 704,900 |
| ජල සැපයුම් නඩත්තු කිරීම | 33,215 | 28,184 |
| කාර්මික ජනපද නඩත්තු කිරීම | 2,077,394 | 1,945,198 |
| රසායනාගාර උපකරණ නඩත්තු කිරීම | 79,745 | 50,853 |
| උපකරණ සහ අමතර කොටස් නඩත්තු කිරීම | 88,962 | - |
| ප්‍රවාහන ගාස්තු | 1,678,455 | 1,284,904 |
| පුහුණු වැඩසටහන් | 7,687,267 | 10,316,035 |
| | **277,291,053** | **245,451,012** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 07 | වෙනත් ආදායම් | 2021 | 2020 |
|---|---|---|---|
| | ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය | 93,427,864 | 89,483,001 |
| | ප්‍රදාන ක්‍රමක්ෂය - විශේෂ ව්‍යාපෘති | - | 5,233,985 |
| | විශේෂ ව්‍යාපෘති සඳහා වියදම් | - | (10,910,309) |
| | ස්ථාවර සහ කෙටිකාලීන තැන්පතු පොළිය | 4,468,620 | 9,020,715 |
| | විවිධ ආදායම් | 830,336 | 1,598,296 |
| | පරීක්ෂණ ආදායම, ලෝහ ආශ්‍රිත අපද්‍රව්‍ය (ඉංජිනේරු අංශය) | - | 1,058,298 |
| | කොමිස් (උප කොන්ත්‍රාත් හුවමාරු) | - | 20,452 |
| | කොමිස් - ලක්කම් මධ්‍යස්ථාන | 3,549,189 | 2,529,349 |
| | කොමිස් - සම් භාණ්ඩ මධ්‍යස්ථානය | 608,430 | - |
| | සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 1,559,300 | 340,500 |
| | ලක්කම් ශාලා ගාස්තු | - | 10,000 |
| | නොතාරිස් ගාස්තු | 510,762 | 276,294 |
| | දඩ | 123,666 | 131,164 |
| | වෙබ් අඩවි පළකිරීම් ආදායම | 2,500 | 40,140 |
| | ස්ථාවර වත්කම් අලෙවිකිරීමෙන් ලැබූ ලාභය | - | 567,695 |
| | ඉතිරිකිරීම් පොළිය | 1,344,047 | 1,208,164 |
| | රසායනාගාර පරීක්ෂණ සඳහා සේවා ගාස්තු | 656,593 | 609,823 |
| | කාර්ය මණ්ඩල ණය පොළිය | 1,438,162 | 1,758,148 |
| | IDB 50 වැනි සංවත්සරය, 2019 | - | 289,092 |
| | UNIDO ව්‍යාපෘති ආදායම | - | 1,268,706 |
| | UNIDO ව්‍යාපෘති වියදම | - | (868,558) |
| | ලක්කම් වෙළඳ ප්‍රදර්ශන ආදායම | 1,707,242 | - |
| | ලක්කම් වෙළඳ ප්‍රදර්ශන වියදම් | (1,518,891) | - |
| | විදුලි ගාස්තු වෙනස් කිරීම - ආදායම | 16,000 | - |
| | උපදේශන ගාස්තු - ඇඹිලිපිටියේ කුළුබඩු සැකසුම් මධ්‍යස්ථානය | 2,933,333 | - |
| | ධාරිතා අභිප්‍රේරණ දීමනාව | (1,079,467) | |
| | කාර්ය මණ්ඩල අභිප්‍රේරණ වැඩසටහන සඳහා අනුග්‍රහය | 255,000 | - |
| | සූර්ය බලශක්ති අපනයන ආදායම | 1,041,304 | 381,687 |
| | ව්‍යාපෘති පරිපාලන වියදම් ප්‍රතිසාධනය | 57,650 | - |
| | | **111,931,641** | **104,046,642** |

| 08 | ප්‍රදාන | 2021 | 2020 |
|---|---|---|---|
| | වැටුප් සඳහා රජයේ ප්‍රදාන | 420,000,000 | 381,250,000 |
| | වෙනත් පුනරාවර්තන සඳහා රජයේ ප්‍රදාන | 45,750,000 | - |
| | | **465,750,000** | **381,250,000** |

| 09 | පරිපාලන වියදම් | 2021 | 2020 |
|---|---|---|---|
| | මූලික වැටුප් | 280,873,355 | 282,923,497 |
| | සභාපතිවරයාගේ චේතනය | 900,000 | 900,000 |
| | විශේෂ දීමනාව 5% | 350,677 | 146,148 |
| | ජීවන වියදම් දීමනාව | 50,847,399 | 51,082,858 |
| | වෙනත් දීමනා | 31,087,438 | 31,511,770 |
| | සේ.අ.අ. 12% | 41,347,313 | 41,677,374 |
| | සේ.නි.හා.අ. 3% | 10,336,828 | 10,419,344 |
| | මණ්ඩලයේ සේවකයන් සඳහා ප්‍රසාද දීමනා | 6,831,000 | 6,604,000 |
| | පාරිතෝෂික (යොමු සටහන 28) | 30,713,136 | 29,235,423 |
| | පුහුණු දීමනා | 669,725 | 858,825 |
| | දෛනිකව ගෙවනු ලබන මුරකරු දීමනා | 2,100,568 | 609,272 |
| | භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම් | 24,236,233 | 24,306,629 |
| | අතිකාල | 21,498,545 | 19,469,247 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 09 ඉතිරි කොටස... | 2021 | 2020 |
|---|---|---|
| නිවාඩු දින ගෙවීම් | 1,132,528 | 1,006,870 |
| ගමන් වියදම් (දේශීය) | 2,413,994 | 2,750,856 |
| ගමන් වියදම් (විදේශීය) | 738,638 | 241,331 |
| නවාතැන් වියදම් | 8,985 | 56,398 |
| සේවක සුබසාධක | 1,555,279 | 1,847,310 |
| මණ්ඩලයේ සේවකයින් සඳහා දේශීය පුහුණු | 620,700 | 179,500 |
| ආයතනික සාමාජිකත්වය | 31,589 | - |
| වෘත්තියවේදී ආයතනවල සාමාජික ගාස්තු (දේශීය සහ විදේශීය) | 125,380 | 229,961 |
| කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 1,502,001 | 1,901,467 |
| වෛද්‍යාධාර යෝජනාක්‍රමය සඳහා දායකත්වය | 2,390,900 | 774,600 |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 7,172,610 | 4,437,229 |
| වෛද්‍ය පරීක්ෂණ ගාස්තු | 6,205 | 13,000 |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වියදම් | 666,017 | 441,249 |
| ඉන්ධන වියදම් | 6,325,900 | 5,061,516 |
| ඉඩම් නඩත්තු කිරීම | 173,194 | 1,086,316 |
| ගොඩනැගිලි නඩත්තු කිරීම | 2,301,870 | 728,526 |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම | 1,014,547 | 246,486 |
| මුද්‍රණ යන්ත්‍ර නඩත්තු කිරීම | - | 86,110 |
| පරිගණක සහ උපාංග නඩත්තු කිරීම | 789,670 | 538,570 |
| මෝටර් වාහන නඩත්තු කිරීම | 7,367,027 | 5,698,650 |
| කාර්යාල නඩත්තු කිරීම් වියදම් | 196,732 | 597,679 |
| කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 1,045,599 | 1,742,538 |
| ලී බඩු, උපාංග සහ කාර්යාල උපකරණ නඩත්තු කිරීම | 1,700 | 940,456 |
| බයිසිකල් නඩත්තු කිරීම | 4,410 | 18,160 |
| PABX පද්ධති නඩත්තු කිරීම | 23,555 | - |
| විවිධ වත්කම් නඩත්තු කිරීම | 24,750 | 57,985 |
| මෘදුකාංග, වෙබ් සහ ජාලකරණ නඩත්තු කිරීම | 1,118,278 | 360,682 |
| J I C A උපකරණ නඩත්තු කිරීම | - | 32,919 |
| විදුලි ගාස්තු | 8,501,911 | 8,301,435 |
| දුරකථන ගාස්තු | 5,177,620 | 5,757,853 |
| ආරක්ෂක ගාස්තු ගෙවීම් | 26,034,578 | 25,522,873 |
| තැපැල් සහ විදුලි පණිවුඩ | 684,997 | 671,041 |
| ජල ගාස්තු | 941,563 | 1,104,702 |
| කුලී, වරිපනම් සහ බදු | 5,296,060 | 5,348,738 |
| රක්ෂණ | 726,059 | 978,119 |
| පුවත්පත් සහ සඟරා | 531,127 | 771,692 |
| අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු | 508,000 | 458,000 |
| විගණන ගාස්තු | 865,000 | 750,000 |
| විශේෂ අවස්ථා සඳහා වියදම් | 984,660 | 1,316,245 |
| වෙළඳ දැන්වීම් | 1,565,788 | 1,447,842 |
| නීති ගාස්තු | 140,362 | 528,844 |
| වෙළඳ පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ ආදිය සඳහා ගාස්තු | 296,437 | 198,030 |
| බලපත්‍ර ගාස්තු | 241,465 | 216,560 |
| පර්යේෂණ සහ සංවර්ධන | - | 42,540 |
| උපදේශක ගාස්තු | - | 105,000 |
| ප්‍රකාශන | 192,843 | 231,809 |
| ණය සහ අත්තිකාරම් සඳහා වෙන් කිරීම් | (426,929) | (30,241) |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 09 ඉතිරි කොටස... | 2021 | 2020 |
|---|---|---|
| කම්කරු නඩු සඳහා ප්‍රතිපාදන | 4,294,311 | 1,537,686 |
| වාහන කුලියට ගැනීමේ ගාස්තු | 270,000 | - |
| විවිධ වියදම් | 343,374 | 65,874 |
| ලියාපදිංචි ගාස්තු | 1,500 | 14,066 |
| කාර්මික සංවර්ධන මණ්ඩලයේ 50 වැනි සංවත්සරය, 2019 | - | 128,046 |
| කර්මාන්තශාලා පොදු කාර්ය පිරිවැය නැවත වෙන් කිරීම් | - | (926,050) |
| සාමාන්‍ය පොදු කාර්ය පිරිවැය නැවත වෙන් කිරීම් | - | (1,488,954) |
| ශ්‍රම පිරිවැය නැවත වෙන් කිරීම් | - | (3,865,965) |
| වැටුප් නැවත වෙන් කිරීම් | (5,058,179) | - |
| පොදු කාර්ය පිරිවැය නැවත වෙන් කිරීම් | (1,693,068) | - |
| යන්ත්‍ර පිරිවැය නැවත වෙන් කිරීම් | (1,426,242) | - |
| වැටුප් අත්හිටුවීම කෙරීගෙන යන වැඩ | (1,537,280) | - |
| පොදු කාර්ය අත්හිටුවීම කෙරීගෙන යන වැඩ | (376,469) | - |
| යන්ත්‍ර පිරිවැය අත්හිටුවීම කෙරීගෙන යන වැඩ | (195,055) | - |
| විවෘත කිරීමේ උත්සවය - ආහාර රසායනාගාරය | - | 603,851 |
| කොවිඩ් 19 - වියදම් | 2,903,871 | 2,471,804 |
| පරිත්‍යාග කිරීම - කොවිඩ් (යුෂ නිස්සාරකය) | 450,000 | - |
| ඉඩම් වැඩිදියුණු කිරීම් ක්ෂයවීම් | 379,301 | 423,095 |
| ගොඩනැගිලි ක්ෂයවීම් | 5,157,674 | 4,780,462 |
| පිරියත හා උපකරණ ක්ෂයවීම් | 3,163,266 | 2,903,830 |
| පරිගණක උපාංග ක්ෂයවීම් | 7,223,081 | 9,008,258 |
| රසායනාගාර උපකරණ ක්ෂයවීම් | 7,734,831 | 7,065,387 |
| මුද්‍රණ යන්ත්‍ර ක්ෂයවීම් | 503,641 | 269,000 |
| මෝටර් වාහන ක්ෂයවීම් | 693,976 | 8,070,995 |
| කාර්යාල උපකරණ ක්ෂයවීම් | 3,661,504 | 3,048,880 |
| ගමන් මලු ක්ෂයවීම් | 11,599 | 12,010 |
| ලී බඩු සහ සවිකිරීම් ක්ෂයවීම් | 1,017,456 | 1,337,451 |
| බයිසිකල් ක්ෂයවීම් | 14,827 | 14,827 |
| උපකරණ සහ අමතර කොටස් ක්ෂයවීම් | 550,081 | 782,279 |
| පුස්තකාල පොත් ක්ෂයවීම් | 91,790 | 246,569 |
| PABX පද්ධති ක්ෂයවීම් | 29,930 | 124,621 |
| උපයෝගිතා සේවා ක්ෂයවීම් | 1,148,045 | 569,147 |
| විවිධ වත්කම් ක්ෂයවීම් | 286,143 | 3,872 |
| JICA උපකරණ ක්ෂයවීම් | 646,628 | 495,087 |
| පරිගණක මෘදුකාංග ක්ෂයවීම් | **623,096,345** | **622,237,955** |

| 10 අලෙවි සහ බෙදාහැරීම් පිරිවැය | 2021 | 2020 |
|---|---|---|
| බොල් සහ අඩමාන ණය සඳහා වෙන් කිරීම් | 1,153,440 | 881,148 |
| දිගු කාලීන හිඟ ණයගැති ශේෂයන් කපා හැරීම | 1,490,585 | - |
| අලෙවිකරණ වියදම් | 46,070 | 91,143 |
| ප්‍රවර්ධන වියදම් | - | 21,850 |
| ප්‍රදර්ශන වියදම් | 6,212,697 | 496,532 |
| | **8,902,791** | **1,490,672** |

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය**
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**11 මූල්‍ය පිරිවැය**

| | 2021 | 2020 |
|---|---|---|
| බැංකු ගාස්තු | 588,050 | 490,415 |
| බැංකු අයිරා පොලිය | - | 400 |
| | **588,050** | **490,815** |

**12 වෙනත් විස්තීර්ණ ආදායම්**

| | 2021 | 2020 |
|---|---|---|
| වර්ෂය සඳහා ආයුගණක ලාභය / (පාඩුව) - (යොමු සටහන 28)_ | 15,123,409 | (5,878,668) |
| | **15,123,409** | **(5,878,668)** |

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

## 13 2021/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් | ගොඩනැගිලි | පිරියත, යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම් | මුද්‍රණ යන්ත්‍ර | JICA ව්‍යාපෘති වත්කම් | කාර්යාලයීය උපකරණ |
|---|---|---|---|---|---|---|
| **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **99,353,115** | **145,309,449** | **42,779,015** | **1,086,427** | **(1)** | **20,355,466** |
| එකතු කිරීම් | 642,692 | 2,371,069 | 20,942,755 | - | - | 3,803,870 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| නිවැරදි කිරීම් | - | - | - | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (423,095) | (4,780,462) | (6,794,195) | (269,000) | - | (3,048,880) |
| ඉඩම් සඳහා සමුච්චිත ක්ෂය | 4,575,000 | - | - | - | - | - |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **104,147,711** | **142,900,056** | **56,927,575** | **817,427** | **(1)** | **21,110,456** |
| **2020** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 106,672,023 | 201,768,394 | 177,254,057 | 8,552,955 | 228,842,384 | 67,683,998 |
| සමුච්චිත ක්ෂය | (2,524,312) | (58,868,338) | (120,326,482) | (7,735,528) | (228,842,385) | (46,573,543) |
| **ශුද්ධ පොත් අගය** | **104,147,711** | **142,900,056** | **56,927,575** | **817,427** | **(1)** | **21,110,456** |
| **2021** දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **104,147,711** | **142,900,056** | **56,927,575** | **817,427** | **(1)** | **21,110,456** |
| එකතු කිරීම් | - | 31,068,790 | 36,347,841 | 3,660,000 | - | 1,735,565 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (379,301) | (5,157,674) | (8,237,333) | (503,641) | - | (3,661,504) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **103,768,411** | **168,811,172** | **85,038,082** | **3,973,786** | **(1)** | **19,184,517** |
| **2021** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 106,672,023 | 232,837,184 | 213,601,898 | 12,212,955 | 228,842,384 | 69,419,563 |
| සමුච්චිත ක්ෂය | (2,903,613) | (64,026,012) | (128,563,815) | (8,239,170) | (228,842,385) | (50,235,047) |
| **ශුද්ධ පොත් අගය** | **103,768,411** | **168,811,172** | **85,038,082** | **3,973,786** | **(1)** | **19,184,517** |

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

## 13 2021/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | රසායනාගාර උපකරණ | ගමන් මලු | ලී බඩු සහ සවිකිරීම් | බයිසිකල් | උපකරණ සහ අමතර කොටස් | පුස්තකාල පොත් | PABX පද්ධති |
|---|---|---|---|---|---|---|---|
| **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් අගය | **52,573,151** | **26,772** | **6,069,749** | **270,443** | **1,424,202** | **548,884** | **185,856** |
| එකතු කිරීම් | 12,687,028 | 3,900 | 771,202 | - | 478,498 | 8,980 | 75,578 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - |
| නිවැරදි කිරීම් | - | - | (68,657) | - | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (7,065,387) | (12,010) | (1,268,794) | (14,827) | (782,279) | (246,569) | (124,621) |
| ඉඩම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | - | - | - | - | - |
| අවසාන ශුද්ධ පොත් අගය | **58,194,792** | **18,662** | **5,503,499** | **255,617** | **1,120,421** | **311,296** | **136,813** |
| **2020** දෙසැම්බර් **31** දිනට | | | | | | | |
| පිරිවැය | 83,331,660 | 1,332,555 | 21,895,699 | 316,860 | 15,017,729 | 13,512,630 | 4,402,810 |
| සමුච්චිත ක්ෂය | (25,136,868) | (1,313,893) | (16,392,200) | (61,243) | (13,897,308) | (13,201,334) | (4,265,997) |
| ශුද්ධ පොත් අගය | **58,194,792** | **18,662** | **5,503,499** | **255,617** | **1,120,421** | **311,296** | **136,813** |
| **2021** දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය | | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් අගය | **58,194,792** | **18,662** | **5,503,499** | **255,617** | **1,120,421** | **311,296** | **136,813** |
| එකතු කිරීම් | 7,582,181 | 15,800 | 408,657 | - | 2,442,985 | 9,835 | 10,109 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (7,734,831) | (11,599) | (1,017,456) | (14,827) | (550,081) | (91,790) | (27,360) |
| අවසාන ශුද්ධ පොත් අගය | **58,042,142** | **22,863** | **4,894,701** | **240,790** | **3,013,325** | **229,341** | **119,562** |
| **2021** දෙසැම්බර් **31** දිනට | | | | | | | |
| පිරිවැය | 90,913,841 | 1,348,355 | 22,304,356 | 316,860 | 17,460,714 | 13,522,465 | 4,412,919 |
| සමුච්චිත ක්ෂය | (32,871,698) | (1,325,492) | (17,409,655) | (76,070) | (14,447,389) | (13,293,123) | (4,293,357) |
| ශුද්ධ පොත් අගය | **58,042,142** | **22,863** | **4,894,701** | **240,790** | **3,013,325** | **229,341** | **119,562** |

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

## 13 2021/12/31 දිනට දේපළ, පිරියත සහ උපකරණ

| | උපයෝගිතා සේවා | විවිධ වත්කම | පරිගණක සහ සන්නිවේදන උපකරණ | පරිගණක මෘදුකාංග | මෝටර් වාහන | එකතුව |
|---|---|---|---|---|---|---|
| **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය | | | | | | |
| ආරම්භක ශුද්ධ පොත් අගය | 29,442,398 | 692,438 | 24,165,030 | 5,089,413 | 10,340,529 | 439,712,334 |
| එකතු කිරීම් | 9,000,965 | 898,007 | 5,408,990 | 3,213,450 | 410,616 | 60,717,600 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| නිවැරදි කිරීම් | - | 259,948 | - | - | - | 191,291 |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (3,818,801) | (263,820) | (9,008,258) | (495,087) | (8,070,995) | (46,487,078) |
| ඉඩම් සඳහා සමුච්චිත ක්ෂය | - | - | - | - | - | 4,575,000 |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **34,624,561** | **1,586,573** | **20,565,762** | **7,807,775** | **2,680,151** | **458,709,146** |
| | - | - | - | - | - | |
| **2020** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 58,149,973 | 5,312,719 | 84,372,888 | 9,916,147 | 54,674,345 | 1,143,009,827 |
| සමුච්චිත ක්ෂය | (23,525,412) | (3,726,146) | (63,807,126) | (2,108,372) | (51,994,194) | (684,300,681) |
| **ශුද්ධ පොත් අගය** | **34,624,561** | **1,586,573** | **20,565,762** | **7,807,775** | **2,680,151** | **458,709,146** |
| **2021** දෙසැම්බර් **31** දිනට අවසන් වර්ෂය | | | | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | **34,624,561** | **1,586,573** | **20,565,762** | **7,807,775** | **2,680,151** | **458,709,146** |
| එකතු කිරීම් | 1,821,517 | 102,700 | 5,038,055 | 879,900 | - | 91,123,934 |
| බැහැර කිරීම් | - | - | - | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (4,349,785) | (277,922) | (7,223,081) | (646,628) | (693,976) | (40,578,786) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **32,096,293** | **1,411,352** | **18,380,736** | **8,041,048** | **1,986,174** | **509,254,294** |
| **2021** දෙසැම්බර් **31** දිනට | | | | | | |
| පිරිවැය | 59,971,490 | 5,415,419 | 89,410,943 | 10,796,047 | 54,674,345 | 1,234,133,761 |
| සමුච්චිත ක්ෂය | (27,875,197) | (4,004,068) | (71,030,207) | (2,754,999) | (52,688,170) | (724,879,467) |
| **ශුද්ධ පොත් අගය** | **32,096,293** | **1,411,352** | **18,380,736** | **8,041,048** | **1,986,174** | **509,254,294** |

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

**14** ආයෝජන දේපළ

| | ඉඩම් සහ ඉඩම් වැඩිදියුණු කිරීම් | ගොඩනැගිලි | එකතුව |
|---|---|---|---|
| **2020** දෙසැම්බර් **31** අවසන් වූ වර්ෂය | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | 862,117,240 | 249,248,771 | 1,111,366,011 |
| එකතු කිරීම් | 17,653,889 | 299,728 | 17,953,617 |
| බැහැර කිරීම් | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (9,933,816) | (7,225,651) | (17,159,466) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **869,837,313** | **242,322,848** | **1,112,160,161** |
| **2020** දෙසැම්බර් **31** දිනට | | | |
| පිරිවැය | 910,648,298 | 289,547,848 | 1,200,196,147 |
| සමුච්චිත ක්ෂය | (40,810,985) | (47,225,000) | (88,035,985) |
| **ශුද්ධ පොත් අගය** | **869,837,313** | **242,322,848** | **1,112,160,161** |
| **2021** දෙසැම්බර් **31** අවසන් වූ වර්ෂය | | | |
| **ආරම්භක ශුද්ධ පොත් අගය** | 869,837,313 | 242,322,848 | 1,112,160,161 |
| එකතු කිරීම් | 20,314,989 | - | 20,314,989 |
| බැහැර කිරීම් | - | - | - |
| ක්ෂයවීම් ගාස්තුව (යොමු සටහන 9) | (9,866,790) | (7,217,418) | (17,084,208) |
| **අවසාන ශුද්ධ පොත් අගය** | **880,285,512** | **235,105,430** | **1,115,390,943** |
| **2021** දෙසැම්බර් **31** දිනට | | | |
| පිරිවැය | 930,963,288 | 289,547,848 | 1,220,511,136 |
| සමුච්චිත ක්ෂය | (50,677,775) | (54,442,418) | (105,120,193) |
| **ශුද්ධ පොත් අගය** | **880,285,512** | **235,105,430** | **1,115,390,943** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 15 ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන වැඩ | 2021 | 2020 |
|---|---|---|
| පන්නල - ඉදිකිරීම - II අදියර | 49,712,293 | 49,712,293 |
| මායිම් තාප්පය - පානළුව | - | 8,420,582 |
| ආපනශාලාව, තැපැල් කාර්යාලය, ලිඳ - අව්වුවේලි | 1,911,259 | 1,911,259 |
| අභ්‍යන්තර මාර්ග වැඩිදියුණු කිරීම - අව්වුවේලි | 7,251,379 | 7,251,379 |
| පවත්නා ආහාර රසායනාගාරය පුළුල් කිරීම TSD - II අදියර | - | 23,311,417 |
| නව ගොඩනැගිල්ල ඉදිකිරීම - ගම්පහ | 4,797,946 | 4,797,946 |
| පාර්ටිෂන් කිරීම - T S D - ආහාර රසායනාගාරය | 3,491,531 | - |
| IDB ආපනශාලාව නවීකරණය කිරීම | 1,023,644 | - |
| නව බාහිර පඩිපෙළක් ඉදිකිරීම - ආහාර රසායනාගාරය | 5,366,957 | - |
| අභ්‍යන්තර මාර්ග සහ මායිම් තාප්පය ඉදිකිරීම - ඒකල | 7,634,539 | - |
| ආරක්ෂක කුටිය සහ නානකාමරය ඉදිකිරීම - නැගම්පහ | 451,158 | - |
| පාර්ටිෂන් වැඩ - A T R D C පන්නල | 545,018 | - |
| කාර්යාලය සහ තැපැල් කාර්යාලය අලුත්වැඩියා කිරීම - ඒකල | 873,867 | - |
| කානු ඉදිකිරීම - ඒකල | 661,475 | - |
| | **83,721,066** | **95,404,877** |

| 16 ස්ථාවර තැන්පතු | 2021 | 2020 |
|---|---|---|
| ලංකා බැංකුව - ඉඩම, මොරටුව ශාඛාව (යොමු සටහන 16.1) | 80,931,530 | 73,327,248 |
| ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය | 3,910,113 | 6,702,470 |
| | **84,841,643** | **80,029,718** |

**16.1** මෙම මුදල කර්මාන්තකරුවන් විසින් ආපසු ගෙවිය හැකි තැන්පතු වලින් තැන්පත් කරන ලද ස්ථාවර තැන්පතු නියෝජනය කරයි. එබැවින්, කාර්මික සංවර්ධන මණ්ඩලයට මෙම මුදල භාවිතා කිරීමට අයිතියක් නැත, නමුත් මේ සඳහා උපචිත පොලී මූදල් මණ්ඩලයේ දෛනික වියදම් සඳහා යොදවා ඇත.

| 17 නිම් භාණ්ඩ, තොග සහ ක්‍රියාත්මක කරමින් පවතින වැඩ | 2021 | 2020 |
|---|---|---|
| ඉංජිනේරු අමුද්‍රව්‍ය - (ප්‍රධාන කාර්යාලය) | 937,243 | 391,721 |
| මුද්‍රණ අමුද්‍රව්‍ය | 53,546 | 54,546 |
| ලිපිද්‍රව්‍ය | 2,233,704 | 1,984,732 |
| වෙනත් අමුද්‍රව්‍ය | 2,007,072 | 1,042,421 |
| ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ තොග | 3,114,081 | 2,433,419 |
| උප ගබඩාව - වාත්තු වැඩපොළ | 5,845,263 | 3,971,708 |
| උප ගබඩාව - රබර් | 4,553,670 | 4,623,208 |
| උප ගබඩාව - සම්භාණ්ඩ | 323,407 | 321,228 |
| උප ගබඩාව - C S C - මාතර | 270,054 | 262,091 |
| උප ගබඩාව - විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානය | 1,526,860 | 1,250,421 |
| උප ගබඩාව - A T R D C පන්නල | 1,369,808 | 1,208,203 |
| පිත්තල මධ්‍යස්ථානය - පිළිමතලාව | 292,732 | 190,429 |
| ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - ඍජු ද්‍රව්‍ය (ප්‍රධාන කාර්යාලය) | 1,761,593 | 886,191 |
| ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - ඍජු ශ්‍රමය | 1,875,885 | 634,980 |
| ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - සාමාන්‍ය පොදු කාර්ය | 494,981 | 222,243 |
| ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - කර්මාන්තශාලා පොදු කාර්ය | 160,167 | 160,167 |
| ක්‍රියාත්මක කරමින් පවතින වැඩ - යන්ත්‍ර පොදුකාර්ය - ඉංජිනේරු | 145,310 | - |
| යකඩ අඩංගු නොවන ලෝහ අබලි | 996,420 | 996,420 |
| තොග - විද්‍යාගාර රසායන සහ පාරිභෝගික භාණ්ඩ | - | 362,009 |
| චලනය නොවන තොග හානිකරණය සඳහා වෙන්කිරීම් | (1,052,453) | (1,052,453) |
| පිත්තල ලෝහ කුට්ටි නැතිවීම සඳහා වෙන්කිරීම් | (996,420) | (996,420) |
| ඍජු නිකුත්කිරීම් | 35,049 | - |
| | **25,947,972** | **18,947,263** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

### 18 වෙළඳ සහ වෙනත් අයවිය යුතු

| | 2021 | 2020 |
|---|---|---|
| විවිධ ණයගැතියෝ- ප්‍රධාන කාර්යාලය | 264,713 | 264,713 |
| විවිධ ණයගැතියෝ- සම්භාණ්ඩ | 26,119 | 18,270 |
| විවිධ ණයගැතියෝ- ඉංජිනේරු | 483,183 | 604,612 |
| විවිධ ණයගැතියෝ- ඉංජිනේරු - කම්හල | 2,371,801 | 4,833,667 |
| විවිධ ණයගැතියෝ- රබර් අංශය | 2,004,423 | 1,288,213 |
| විවිධ ණයගැතියෝ - A T R D C - පන්නල | 821,276 | 1,265,181 |
| විවිධ ණයගැතියෝ - E P C | 73,272 | 73,272 |
| විවිධ ණයගැතියෝ- මුද්‍රණ | 392,172 | 374,061 |
| විවිධ ණයගැතියෝ- විද්‍යුත් | 2,695,210 | 1,697,674 |
| විවිධ ණයගැතියෝ- වාත්තු වැඩපොළ | 832,651 | 2,020,687 |
| විවිධ ණයගැතියෝ- සිවිල් | 2,163,600 | 2,946,466 |
| විවිධ ණයගැතියෝ- ලක් නිපැයුම් | 42,120 | 42,120 |
| විවිධ ණයගැතියෝ - C S C -මාතර | 461,902 | 3,959,562 |
| විවිධ ණයගැතියෝ - C S C - අනුරාධපුර | 15,025 | 15,025 |
| විවිධ ණයගැතියෝ- අලෙවි | 199,933 | 147,965 |
| විවිධ ණයගැතියෝ- අබලි ව්‍යාපෘතිය | 3,413,414 | 897,059 |
| විවිධ ණයගැතියෝ - පොදු | 3,446,718 | - |
| විවිධ ණයගැතියෝ - TSD | 396,038 | |
| විවිධ ණයගැතියෝ - ප්‍රාදේශීය | 7,950.00 | |
| ණයගැතියෝ - ආපසු එවූ චෙක්පත් | - | 209,398 |
| බදුකාර ණයගැතියෝ (යොමු සටහන 18.1) | 20,042,644 | 25,645,815 |
| විවිධ ණයගැතියෝ | - | 406,707 |
| | 40,154,165 | 46,710,464 |
| අඩුකලා: බොල් සහ අඩමාන ණය හානිකරණය සඳහා වෙන් කිරීම් | (15,221,933) | (14,068,493) |
| | **24,932,232** | **32,641,971** |

### 18.1 බදුකාර ණයගැතියෝ

| | 2021 | 2020 |
|---|---|---|
| කාර්මික ජනපදය - ඒකල | 2,162,559 | 3,989,946 |
| කාර්මික ජනපදය - පල්ලෙකැලේ | 5,383,563 | 4,934,659 |
| කාර්මික ජනපදය - හොරණ | 1,210,244 | 1,753,819 |
| කාර්මික ජනපදය - පන්නල | 357,665 | 1,637,262 |
| කාර්මික ජනපදය - ලුණුවිල | 4,210,303 | 3,601,610 |
| කාර්මික ජනපදය - මිහින්තලේ | 86,142 | 40,686 |
| කාර්මික ජනපදය - මාතලේ | 1,810,794 | 2,313,496 |
| කාර්මික ජනපදය - පුස්සැල්ල | 256,337 | 120,685 |
| කාර්මික ජනපදය - ගලිගමුව | 255,818 | 197,506 |
| කාර්මික ජනපදය - පානළුව | 4,258,565 | 3,202,892 |
| කාර්මික ජනපදය - කොටගල | 969,887 | 967,718 |
| කාර්මික ජනපදය - අච්චුවේලි | 1,104,030 | 1,526,684 |
| කාර්මික ජනපදය - වවුළුගල | 1,304,316 | 793,927 |
| කාර්මික ජනපදය - වවුනියාව | 563,629 | 564,924 |
| කාර්මික ජනපදය - පොදු | (3,891,207) | - |
| | **20,042,644** | **25,645,815** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

### 19 වෙනත් ජංගම වත්කම්

| | 2021 | 2020 |
|---|---|---|
| උත්සව අත්තිකාරම් | 236,500 | 365,250 |
| උත්සව අත්තිකාරම් හානිකරණ පාඩුව සඳහා වෙන්කිරීම් | - | (112,750) |
| මෝටර් බයිසිකල් ණය | 209,470 | 386,230 |
| මෝටර් බයිසිකල් ණය හානිකරණ පාඩුව සඳහා වෙන්කිරීම් | - | (106,360) |
| බයිසිකල් අත්තිකාරම් | 23,504 | 52,154 |
| බයිසිකල් ණය හානිකරණ පාඩුව සඳහා වෙන්කිරීම් | - | (2,504) |
| ආපදා ණය | 40,030,126 | 43,779,121 |
| විලම්බිත කාර්ය මණ්ඩල පිරිවැය | (7,564,456) | (6,098,918) |
| ආපදා ණය හානිකරණ පාඩුව සඳහා වෙන්කිරීම් | - | (205,315) |
| පෙරගෙවූ කාර්ය මණ්ඩල පිරිවැය (IFRS ගැලපීම්) | 7,564,456 | 6,098,918 |
| විශේෂ අත්තිකාරම් - පොත් | 5,800 | 7,000 |
| අනෙකුත් දෙපාර්තමේන්තු වලින් ලැබිය යුතු | - | 421,933 |
| මැනිවරණ කොමසාරිස්ගෙන් ලැබිය යුතු | 80,919 | 404,487 |
| රඳවා ගැනීමේ බදු | 5,172,442 | 5,517,372 |
| කිතුල් - අලෙවිකරණය | - | 281,675 |
| ආර්ථික සේවා ගාස්තු | - | 170,872 |
| වෘත්තීය සමිති පාලනය | 600 | 1,000 |
| සේවක පරිත්‍යාග | - | 21,667 |
| කර්මාන්ත ප්‍රදර්ශනය සහ සම්මාන උළෙල | 405,554 | - |
| රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු, උණ සමීක්ෂණය | 877,500 | - |
| රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 833,450 | - |
| IDB සුබසාධන සමිතිය සඳහා තාවකාලික ණය | 600,000 | - |
| ඉල්ලා අස්වූ සේවකයින්ගෙන් ලැබිය යුතු | 150,814 | - |
| | **48,626,679** | **50,981,831** |

### 20 තැන්පතු සහ පූර්ව ගෙවීම්

| | 2021 | 2020 |
|---|---|---|
| ඇප තැන්පතු | 292,457 | 296,304 |
| පූර්ව ගෙවීම් (යොමු සටහන 20.1) | 97,700,276 | 64,219,945 |
| පූර්ව ගෙවීම් හානිකරණය සඳහා වෙන්කිරීම් | (11,787,162) | (11,787,162) |
| පූර්ව ගෙවීම් අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 192,206 | 192,206 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | 140,466 | 179,252 |
| කාර්ය මණ්ඩල ඉන්ධන අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය | - | 4,170 |
| වෙනත් තැන්පතු / ලැබිය යුතු | 1,363,958 | 2,137,048 |
| කලින් ගෙවූ කුලිය සහ වෙනත් වියදම් | 167,926 | 540,886 |
| | **88,070,127** | **55,782,649** |

### 20.1 පූර්ව ගෙවීම්

| | 2021 | 2020 |
|---|---|---|
| ඉදිකිරීම් | 5,188,230 | 10,055,466 |
| අබලි ව්‍යාපෘතිය | 67,180,596 | 28,192,543 |
| විවිධ | 25,331,450 | 25,971,936 |
| | **97,700,276** | **64,219,945** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

### 21 ලැබිය යුතු - විශේෂ ව්‍යාපෘති

| | 2021 | 2020 |
|---|---|---|
| දිවියට උදානය | 8,059,237 | 8,059,237 |
| අමාත්‍යාංශ අරමුදල් - Robot Arm (CERA ව්‍යාපෘතිය)* | 3,776,783 | 3,052,645 |
| One Stop වෙළඳ සල | 1,655,020 | - |
| | **13,491,040** | **11,111,882** |

* C E R A ව්‍යාපෘතිය යනු ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය IDB වන විශේෂ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේදී කර්මාන්ත අමාත්‍යාංශයට පවරා ඇත.

### 22 මුදල් සහ මුදල් හා සමාන දෑ

| ගිණුම් කේතය | | ගිණුම් අංකය | 2021 | 2020 |
|---|---|---|---|---|
| 72000 | ජ/ගිණුම - ලංකා බැ.(පුනරාවර්තන ප්‍රධාන) | 682974 | 41,757,701 | 2,631,838 |
| 72016 | ජ/ගිණුම - ලංකා බැ.(රබර්) | 4064199 | 174,103 | 165,259 |
| 72002 | ජ/ගිණුම - ලංකා බැ.(ප්‍රාග්ධන ප්‍රදාන) | 683231 | 7,135,114 | 34,174,962 |
| 72005 | ජ/ගිණුම - ලංකා බැ.(ඉංජිනේරු) | 683144 | 147,012 | 81,660 |
| 72020 | ජ/ගිණුම - ලංකා බැ.(ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය) | 4204245 | 6,661,724 | 677,302 |
| 72011 | ජ/ගිණුම - ලංකා බැ.(අඹලි) | 682519 | 46,483,286 | 44,285,198 |
| 72008 | ජ/ගිණුම - ලංකා බැ.(ප්‍රාදේශීය) | 683237 | 282,075 | 50,000 |
| 72014 | ජ/ගිණුම - මහජන බැ. (අමාත්‍යාංශ ව්‍යාපෘති) | 313100153657035 | 57,032 | (2,725,171) |
| 72015 | ජ/ගිණුම - මහජන බැ. | 313200223657035 | 21,303,134 | 16,477,774 |
| 72030 | ජ/ගිණුම - ලංකා බැ.(ලක්කම්) | 7153282 | 5,509,102 | 1,773,184 |
| 72001 | ජ/ගිණුම - ලංකා බැ.(ආදායම්) | 70034730 | 3,420,750 | 2,921,275 |
| 72017 | ජ/ගිණුම - ලංකා බැ.(දිස්ත්‍රික් කාර්යාලය) | 74791255 | 66,865 | 30,771 |
| 72028 | ඉ/ගිණුම - ලංකා බැ.(අඹලි) | 7271240 | 224,807 | 218,171 |
| 72029 | ඉ/ගිණුම - ලංකා බැ.(CESS අරමුදල) | 9123868 | 1,824,930 | 1,771,062 |
| | කෙටිකාලීන තැන්පතු | | - | 32,904,625 |
| | ලැබිය යුතු කෙටිකාලීන තැන්පතු පොලිය | | - | 3,831 |
| | අග්‍රිම ගිණුම | | 132,466 | 33,543 |
| | විශේෂ අග්‍රිම - අයකැම් | | 23,379 | 23,379 |
| | | | **135,203,479** | **135,498,663** |
| | හර ශේෂ | | 135,203,479 | 138,223,834 |
| | ණය ශේෂ | | - | (2,725,171) |
| | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | **135,203,479** | **135,498,663** |

### 23 විලම්බිත ප්‍රාග්ධන ප්‍රදාන

| | 2021 | 2020 |
|---|---|---|
| ජනවාරි 01 දිනට රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 341,681,267 | 350,265,754 |
| වර්ෂය තුලදී ලැබුණු ප්‍රදාන | 32,230,000 | 52,550,000 |
| මාරු කරන ලද ප්‍රාග්ධන ප්‍රදාන | (69,455,534) | (61,134,488) |
| | **304,455,733** | **341,681,267** |

### 24 මාරු කරන ලද වත්කම් වල වටිනාකම

| | 2021 | 2020 |
|---|---|---|
| 1969 ට පෙර කා.සං.ම. | 4,403,441 | 4,403,441 |
| කාර්මික ජනපද සංස්ථාව | 9,043,620 | 9,043,620 |
| | **13,447,061** | **13,447,061** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 25 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | 2021 | 2020 |
|---|---|---|
| ඉදිරියට ගෙනා ශේෂය | 960,696,321 | 960,696,321 |
| | **960,696,321** | **960,696,321** |

| 26 විලම්බිත රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන ව්‍යාපෘති | 2021 | 2020 |
|---|---|---|
| Cess අරමුදල | 10,500,000 | 10,500,000 |
| Sirap අරමුදල - ගොඩනැගිලි | 21,152,588 | 21,999,854 |
| ප්‍රදාන - පැලියගොඩ RD & SC සඳහා ඉන්ජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රය | 4,678,951 | 5,610,753 |
| අමාත්‍යාංශ අරමුදල් - අව්වුවේලි | 35,567,556 | 34,693,367 |
| අමාත්‍යාංශ අරමුදල් කාර්මික ජනපද | 375,713,923 | 360,193,500 |
| අමාත්‍යාංශ අරමුදල් - පූන්තෝට්ටම් කාර්මික ජනපදය වවුනියාව | 5,165,760 | 4,797,155 |
| යකඩ නොවන ලෝහ | - | 2,500,000 |
| අමාත්‍යාංශ අරමුදල් - TSD රසායනාගාරය | 2,156,201 | 2,605,185 |
| පානළුව කාර්මික ජනපදය | 3,859,515 | 28,816,474 |
| ප්‍රතිනතය ලත් ආහාර රසායනාගාරය - අදියර I | 21,697,287 | 24,894,743 |
| ප්‍රතිනතය ලත් ආහාර රසායනාගාරය - අදියර II | 62,560,869 | 53,742,207 |
| අව්වුවේලි මිලියන 100 ව්‍යාපෘතිය 2018 | 7,259,371 | 8,339,086 |
| ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය | 1,152,452 | 1,331,619 |
| අමාත්‍යාංශ අරමුදල් - "නංවමු ලංකා" | 5,117,669 | 5,195,607 |
| | **556,582,142** | **565,219,549** |

| 27 සමුච්චිත ලාභ / (පාඩු) | 2021 | 2020 |
|---|---|---|
| ඉදිරියට ගෙනා සමුච්චිත පාඩු | (272,134,396) | (283,248,237) |
| පෙර වසරේ ගැලපීම් (යොමු සටහන 27.1) | (6,492,740) | 2,969,761 |
| කාලසීමාව සඳහා අතිරික්තය | 77,887,226 | 8,144,079 |
| ඉදිරියට ගෙනා සමුච්චිත පාඩු | **(200,739,910)** | **(272,134,396)** |

| 27.1 පෙර වසරේ ගැලපීම් | 2021 | 2020 |
|---|---|---|
| ඉඩම් සඳහා සමුච්චිත ක්ෂයවීම් | - | 4,575,000 |
| නිහ ගෙවීම් සඳහා වෙන් කිරීම්, "පරාක්‍රමබාහු" නැව, ශ්‍රී ලංකා නාවික හමුදාව | - | (1,605,239) |
| සමුච්චිත පොළී - පානළුව ප්‍රදානය | (7,908,457) | - |
| නිහ වැටුප් | (365,276) | - |
| ටෙන්ඩර් මණ්ඩල ගාස්තුව | (2,000) | - |
| ලැබීම් - මොහොමඩ් අන්ෆාස් | 97,000 | - |
| අවලංගු කල චෙක්පත් | 25,750 | - |
| ප්‍රදාන ක්‍රමක්ෂය (විගණන පිළිතුරු) | 425,476 | - |
| යෙදවුම් බදු, අව්වුවේලි කාර්මික ජනපදයේ අභ්‍යන්තර මාර්ගය | 1,079,715 | - |
| ක්ෂයවීම් | 8,222 | - |
| අධි ප්‍රතිපාදන - ප්‍රසාද දීමනා | 132,000 | - |
| ඌන ප්‍රතිපාදන - දුරකථන ගාස්තු | (30,928) | - |
| තොග ගැලපීම් ආරම්භක ශේෂය | (38,416) | - |
| අධි ප්‍රතිපාදන - ජල ගාස්තු | 41,853 | - |
| කාර්මික ජනපද සහ වෙනත් ආදායම් | 55,820 | - |
| උණු බම්බු ව්‍යාපෘති වියදම්, ලක්සල සේවකයන්ට ගෙවන ලදී | (12,500) | - |
| වෙනත් නිවැරදි කිරීම් | (1,000) | - |
| | **(6,492,740)** | **2,969,761** |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

### 28 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති මුදල් පහත සඳහන් කර ඇති පරිදි තීරණය කරනු ලැබේ.

| | 2021 | 2020 |
|---|---|---|
| අරමුදල් සපයා නොමැති බැඳීම්වල වර්තමාන වටිනාකම | 206,131,395 | 202,971,991 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වගකීම් | **206,131,395** | **202,971,991** |

වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වලනය පහත සඳහන් පරිදි වේ.

| | 2021 | 2020 |
|---|---|---|
| ජනවාරි 01 දිනට | 202,971,991 | 183,515,220 |
| වර්තමාන සේවා පිරිවැය | 12,585,710 | 13,094,954 |
| පොලි පිරිවැය | 18,127,427 | 16,140,469 |
| පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණක පාඩුව/(ලාභය) | (15,123,409) | 5,878,668 |
| | 218,561,718 | 218,629,311 |
| ගෙවන ලද ප්‍රතිලාභ | (12,430,323) | (15,657,320) |
| දෙසැම්බර් 31 දිනට | **206,131,395** | **202,971,991** |

යොදා ගන්නා ලද ප්‍රධාන ආයුගණක උපකල්පන පහත සඳහන් පරිදි විය.

| | 2021 | 2020 |
|---|---|---|
| වට්ටම් අනුපාතය | 9.50% | 9.50% |
| අනාගත වැටුප් වැඩිවීම | 5.00% | 5.00% |
| විශ්‍රාම යෑමේ වයස | 60 | 60 |

### 29 රජයට ගෙවිය යුතු

| | 2021 | 2020 |
|---|---|---|
| දේශීය ආදායම් කොමසාරිස් | 28,879 | 28,879 |
| දේශීය ආදායම් කොමසාරිස් (මුද්දර ගාස්තු) | 45,900 | 43,675 |
| | **74,779** | **72,554** |

### 30 මණ්ඩල සහ සංස්ථා වලට ගෙවිය යුතු

| | 2021 | 2020 |
|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව (EPF) | 7,213,321 | 6,438,637 |
| සේවා නියුක්ති භාරකාර අරමුදල (ETF) | 983,635 | 877,996 |
| | **8,196,956** | **7,316,633** |

### 31 වෙළඳ සහ වෙනත් ණය හිමියෝ, වෙන් කිරීම් සහ උපචිත වියදම්

| | 2021 | 2020 |
|---|---|---|
| වෙළඳ ණය හිමියෝ (යොමු සටහන 31.1) | 86,431,770 | 39,826,975 |
| ගෙවිය යුතු "SGS ලංකා පුද්. සමාගම" | 3,631,954 | 1,825,566 |
| RPD & SC - MOU ක්‍රියාකාරී සැලැස්ම - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 3,498,000 | 1,998,000 |
| ජාතිය ගොඩ නැගීමේ බදු 2% | 3,706,617 | 3,706,617 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල අඩුකිරීම් | 12,387 | 12,387 |
| ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු | 11,479 | - |
| විවිධ ණය හිමියෝ | 399,453 | 399,453 |
| වෙනත් ණය හිමියෝ | 40,883 | 40,883 |
| විවිධ ණය හිමියෝ - ප්‍රධාන කාර්යාලය | 2,118,014 | 2,177,494 |
| ගෙවිය යුතු VAT | 5,229,263 | 5,258,968 |
| නිරාකරණය කිරීමට නියමිතව තිබෙන තැන්පතු | 635,915 | 309,383 |
| ලක් නිපැයුම් අලෙවි සහ ප්‍රදර්ශන මධ්‍යස්ථානය - ණය හිමියෝ | 89,753 | 89,753 |
| ගණුදෙනුකරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම් | 14,944,277 | 28,001,687 |
| පුහුණු වැඩසටහන් සඳහා අත්තිකාරම් | 1,352,720 | 1,925,270 |

## ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය
### මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

| 31 ඉතිරි කොටස... | 2021 | 2020 |
|---|---|---|
| ඇප තැන්පතු | 317,457 | 296,304 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු - ජනපද | 73,867,694 | 64,869,766 |
| ආපසු ගෙවිය හැකි තැන්පතු - ජනපද නොවන | 3,374,579 | 3,020,878 |
| ගෙවිය යුතු රඳවා ගැනීම් | 3,697,389 | 8,398,590 |
| කලින් ගෙවූ වසර 30ක බිම් කුලිය | 1,904,694 | - |
| වෛද්‍ය යෝජනා ක්‍රමය | 4,011,031 | 2,790,063 |
| සුබසාධන සංගමය | (2,500) | 5,000 |
| සකසුරුවම් සමාජය | 4,418 | 4,418 |
| කම්කරු නඩු සඳහා වෙන්කිරීම් | 5,373,294 | 5,944,075 |
| උප කොන්ත්‍රාත් ණය හිමියෝ | 95,046 | - |
| උපචිත වියදම් (යොමු සටහන 31.2) | 57,896,707 | 53,603,506 |
| ලක්කම් ණය හිමියෝ | 1,746,255 | 1,249,134 |
| ගෙවිය යුතු වැටුප් | 3,416 | - |
| ගෙවිය යුතු ශත පාලනය | 21 | - |
| | **274,391,987** | **225,754,172** |

| 31.1 වෙළඳ ණය හිමියෝ | 2021 | 2020 |
|---|---|---|
| ඉදිකිරීම් | 19,732,776 | 18,453,092 |
| අබලි ව්‍යාපෘතිය | 22,873,125 | 7,966,135 |
| වෙනත් සැපයුම් | 23,955,564 | 21,806,338 |
| උපචිත මිලදී ගැනීම | 19,870,305 | - |
| | **86,431,770** | **48,225,565** |

| 31.2 උපචිත වියදම් | 2021 | 2020 |
|---|---|---|
| උපචිත හිලව් නිවාඩු ගෙවීම් | 700,529 | 797,384 |
| වෙළඳ ප්‍රචාරණ වියදම් | 26,163 | 26,163 |
| ප්‍රසාද දීමනා ගෙවීම් | 6,831,000 | 6,912,000 |
| ගෙවිය යුතු අනියම් වැටුප් | 2,355,795 | 931,862 |
| විදුලි ගාස්තු | 2,565 | 806,538 |
| නිවාඩු දින ගෙවීම් | 155,312 | 223,452 |
| නවාකැන් වියදම් | 12,300 | 8,400 |
| විවිධ | - | 242,684 |
| පුවත්පත් සහ සඟරා | 35,050 | 29,240 |
| වෙනත් ද්‍රව්‍ය | (2,210) | 5,330 |
| අනිකාල | 3,452,280 | 2,928,496 |
| තැපැල් ගාස්තු සහ විදුලි පණිවුඩ ගාස්තු | - | 605 |
| වරිපනම් සහ බදු | 12,916,586 | 12,934,313 |
| ගොඩනැගිලි කුලිය | 55,972 | 899,972 |
| ලිපි ද්‍රව්‍ය | 111,648 | 120,288 |
| දුරකථන | - | 681,494 |
| අභ්‍යාසලාභීන්ගේ දීමනා සහ දින වැටුප් | 227,523 | 208,800 |
| පුහුණු වැඩසටහන් | 137,284 | 443,378 |
| ගමන් වියදම් සහ යැපීම් | 414,535 | 472,673 |
| පිරිවැටුම් බද්ද | 246,728 | 246,728 |
| භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා ගෙවිය යුතු | 24,217,646 | 24,280,646 |
| ජල ගාස්තු | - | 403,060 |
| කර්මාන්ත ප්‍රදර්ශනය 2022 | 6,000,000 | - |
| | **57,896,707** | **53,603,506** |

# 6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සමාලෝචනය



# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IMT/A/IDB/FA/2021/12

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ඔක්තෝබර් 17 දින

02 NOV 2022

Dir/Fin ph dim with chairman - FNA 2/11/3

සභාපති,

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය

**ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) දේපළ පිරියත හා උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වන ඡේදයට අනුව, වත්කම් වල ප්‍රයෝජනවත් ආයුකාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකදීම සමාලෝචනය කරනු ලැබිය යුතු අතර ඵලදායී ජීව කාලය කලින් ඇස්තමේන්තු වලට වඩා වෙනස්නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ගිණුම්ගත කළ යුතු නමුත් 2021දෙසැම්බර් 31 දින වන විටත්



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති දැනට භාවිතයේ පවතින පිරිවැය රු.315,482,609 ක් වූ දේපළ පිරියත හා උපකරණ වල ප්‍රයෝජනවත් ජීවන කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති 05ක සිදුකළ වටිනාකම රු.31,699,372ක් වූ ඉදිකිරීම් වෙනුවෙන් ඉංජිනේරු අංශය විසින් අතුරු ගෙවීම් සහතික ලබා දී තිබුණ ද එම වටිනාකම කෙරීගෙන යන වැඩ ගිණුමට හා ගෙවිය යුතු ණයහිමි ගිණුමට ඇතුලත් කර නොතිබුණි.

(ඇ) රු.588,906 ක හා රු. 539,436 ක ශුද්ධ අගයක් පෙන්නුම් කර තිබූ යන්ත්‍ර හා පරිගණක උපාංග වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ක්ෂය කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) වටිනාකම රු.47,299,221ක පෙර ගෙවුම් නිරවුල් වී තිබුණද එය එම ගිණුම්වල ඉවත් නොවී ඉදිරියට ඉදිරියට රැගෙන විත් තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයනයේ කාර්මික ජනපද ලැබිය යුතු ලෙස රු.20,042,645ක ශේෂයක් තිබූ අතර එම ශේෂයට අදාල උපලේඛනයේ හඳුනා නොගත් රු.3,891,207ක ඍණ ශේෂයක් විය. එසේම මෘදුකාංගයෙන් ලබා ගන්නා ලද කාර්මික ජනපද ලැබිය යුතු උපලේඛනයේ එය රු.3,134,734ක ඍණ ශේෂයක් විය. මෙම ඍණ ශේෂයන් සඳහා හේතු සොයා නිවැරදිකර ගිණුම්වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට මෘදුකාංග පද්ධතියෙන් ලබාගන්නා ලද ශේෂ පිරික්සුම අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනය අනුව ශේෂයන් සැසඳීමේදී විකුණුම් පිරිවැයෙහි, පරිපාලන වියදම්හි, ජංගම වත්කම් හා ජංගම වගකීම් වල පිලිවෙලින් රු.23,769,029ක, රු.4,502,409ක, රු.104,011,157ක හා රු.70,237,186 ක වෙනස්කම් පැවතිණි. ඒවා සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018හි 2(II) ඡේදය | අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන වයස අවු.60 ඉක්මවූ නිලධාරිනියක මණ්ඩලයේ මානව සම්පත් අධ්‍යක්ෂ ධූරයට බඳවාගෙන 2016 මැයි සිට 2019 පෙබරවාරි දක්වා රු.2,989,008ක් වැටුප් සහ දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| (ii) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරණ චක්‍රලේඛය | 2012 ජනවාරි මස 01 දින සිට ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා මාසිකව රු.15,000ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී තිබූ අතර මෙම චක්‍රලේඛයෙන් දීමනා ගෙවීමට අනුමත කර නොමැති ආයතන සඳහා දීමනා ගෙවන්නේ නම් අමාත්‍යාංශ ලේකම් හරහා මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්මික සංවර්ධන මණ්ඩලය එවන් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නිලධාරීන් 12ක් සඳහා 2018 වර්ෂයේ සිට ඉංජිනේරු දීමනාව ගෙවා තිබුණි. 2021 වර්ෂයට අදාලව එම ගෙවීම් එකතුව රු.1,965,000 ක් විය. |
| (ආ) 2013 වර්ෂයේ අනුමත කළ මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටිය | (i) අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියකු අලෙවි අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන 2015 ජුනි 26 දින සිට 2021 සැප්තැම්බර් 30 දක්වා රු.10,882,253 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. |
| | (ii) අනුමත බඳවාගැනීම් පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොතිබියදී නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යවසාය සංවර්ධන) ලෙස සිටි නිලධාරියකු අධ්‍යක්ෂ (කාර්මික |

| | |
|---|---|
| | ජනපද) තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබියදීත් 2013 ජනවාරි 01 දින සිට බඳවාගෙන තිබුණි. එදින සිට 2020 සැප්තැම්බර් දක්වා තනතුරු දෙකෙහි වැටුප් හා දීමනා අතර වෙනස දළ වශයෙන් රු.3,977,595ක් විය. |
| (ඇ) 2009-12-02 දිනැති රජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතය සඳහා ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි මැයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) විසින් නිකුත් කරන ලද ඉ - රාජ්‍ය ප්‍රතිපත්තියෙහි 020102 උප වගන්තිය | සියළුම රාජ්‍ය ආයතන රු.මිලියන 2කට වැඩි ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනයේ (ICTA) උපදෙස් ලබාගත යුතු බව සඳහන් වුවද මණ්ඩලය විසින් රු.මිලියන4.8ක් වැය කර මිලදී ගත් Sage මෘදුකාංග පද්ධතිය වෙනුවෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2020 ජනවාරි 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2020 හි උප වගන්ති 1.2 | රාජ්‍ය ආයතනයක සභාපතිවරයෙකු හට එක් වාහනයක් හා මසකට ඉන්ධන ලීටර් 150ක්(වසරකට ලීටර් 1800) ලබාගත හැකි බව සඳහන් කර තිබුණද 2021 වර්ෂයේ හිටපු සභාපතිවරයා විසින් කිසිදු අනුමැතියකින් තොරව හා චක්‍රලේඛයට පටහැනිව වාර්ෂිකව ඔහුට හිමි ඉන්ධන ප්‍රමාණයට අමතරව තවත් ඉන්ධන ලීටර 2600 ක් වැඩිපුර ලබාගෙන තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) මණ්ඩලය සතු කාර්මික ජනපද 16 හි බිම් කොටස් 733 ක් පවතින අතර ඉන් බිම් කොටස් 37ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට හිස්ව පැවතුණි. 2021 දෙසැම්බර් 31 දිනට ජනපදයන්හි කර්මාන්ත 41ක් ක්‍රියාක්මත නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන් සොයා බෙදා දීමට කටයුතු කර නොතිබුණි. කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23ක් පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ආහාර රසායනාගාර පරීක්ෂණ සේවාවන් ලබා දීම තුලින් ව්‍යාපාර ප්‍රවර්ධනය හා සංවර්ධනය මෙන්ම ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය දේශීය හා අන්තර්ජාතික වෙළඳපොළට උසස් කිරීම ආදී අරමුණු පෙරදැරිව ආහාර රසායනාගාරය ඉදිකර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ආහාර රසායනාගාර අංශයේ වාර්තාවට අනුව සත්‍ය ආදායම රු.6,056,249 ක් විය. එසේ වුවද ආහාර රසායනාගාරයේ කාර්යයන් සඳහා නිලධාරීන් 05දෙනෙකු මෙන්ම ඉදිකරන ලද රසායනාගාර ගොඩනැගිල්ල සහ උපකරණ මෙම පරීක්ෂණ කටයුතු සඳහා යොදවා ගෙන තිබුණද මෙම රසායනාගාරය ස්වාධීනව ක්‍රියාත්මක නොවී වෙනත් බාහිර ආයතනයක් සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක වීම සිදුවී තිබූ බැවින් ගිවිසුම් ප්‍රකාරව සිදුකළ පරීක්ෂණ ආදායමින් සියයට 80ක් බාහිර ආයතනයකට ගෙවීමට සිදුවී තිබුණි.

එසේම රසායනික විද්‍යාගාරය ආරම්භ කර වසර 2කට වැඩි කාලයක් ගත වුවද රසායනික පරීක්ෂණ වාර්තා නිකුත් කිරීමට අදාල ප්‍රතිතනය (accreditation) ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2021 ඔක්තෝබර් 18 දින Medium Frequency Induction Furnace නව උඳුනක් වැටි රහිතව රු.22,996,722ක මුදලකට මිලදී ගැනීමට වාත්තු අංශය කටයුතු කර තිබුණි. මෙම යන්ත්‍රය භාවිතා කර මසකට මෙට්‍රික් ටොන් 60ක් උණු කිරීමේ හැකියාව පැවතියද, අංශය සතු ප්‍රාථමික මට්ටමේ නිලධාරින්ගේ හිඟය හා ඉඩකඩ සීමා වීම මත මසකට ටොන් 10ක් පමණ උණු කරන අතර ලැබෙන ඇතැම් ඇණවුම් වෙනත් බාහිර ආයතන වලට උප කොන්ත්‍රාත් දී ඉටු කර ගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) ඉංජිනේරු අංශයේ වැඩහළෙහි, 2021 දෙසැම්බර් 31 දිනට වසර 10කට වඩා පැරණි පාවිච්චි කළ නොහැකි යන්ත්‍ර හා අනෙකුත් උපකරණ 34ක් පවතියද මෙම අයිතමයන් අංශයෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම විශාල සිදුරු කුඩා කිරීම, කුඩා සිදුරු විශාල කිරීම, ලෝහ කැබලි කැපීම යනාදී බාහිර කාර්යයන් සඳහා ඉල්ලුමක් පවතින Boring Machine, Electrical Discharging Machine, Die Sinking Machine සහ Power Hammer for Black Smithy Work යන යන්ත්‍ර 04 හි ක්‍රියාකරුවන් නොමැති වීම මත වසර 10කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතිණි.

(ඉ) පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂ 1 ත් වර්ෂ 37ත් අතර කාල පරාසයක සිට අක්‍රියව පවතින බවත්, එක් යන්ත්‍රයක් මිලදීගත් දින සිටම භාවිතයට ගෙන නොමැති බවත් අනාවරණය විය.

(ඊ) ආහාර රසායනාගාරයේ පළමු මහලේ පිහිටි ක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය ඉදිකිරීම් අවසන් වන විට ස්ථාපනයට සුදුසු උපකරණ මිලදී ගැනීමට කටයුතු සැලසුම් කළ යුතු වුවත් රු.6,203,670ක් වටිනා උපකරණ 2019 වර්ෂයේදී මිලදීගෙන තිබුණි. මේවායේ වගකීම් කාලය 2022 වර්ෂය අවසන් වන විට භාවිතයෙන් තොරවම අවසන් වන අතර මේවා 2022 ජූලි 31 දින වන විටත් පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි.

(උ) අමප/16/1424/723/039 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ටතා මධ්‍යස්ථානය ආරම්භ කිරීමට අවශ්‍ය යන්ත්‍ර මිලදී ගැනීමට හා ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල ගොඩනැගිල්ලක් නවීකරණය කිරීමට රු.මිලියන 40 ක් පමණ වැය කර රු.මිලියන 80ක් පමණ වටිනා රොබෝ යන්ත්‍ර 04ක්, සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 ක් ඇතුළුව ඒ ආශ්‍රිත උපකරණ මිලදී ගෙන සීඑන්සි ලේත් සහ මිල් යන්ත්‍ර 02 හැර අනෙක් උපකරණ 2018 මාර්තු වන විට එහි ස්ථාපනය කර තිබුණි. මෙය ක්‍රියාත්මක කිරීම සඳහා බදවා ගත් විධායක නිලධාරියාට 2017 සැප්තැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා මසකට රු.725,000 බැගින් වැටුප් හා දීමනා ලෙස එකතුව රු.මිලියන 11 ක් පමණ ගෙවා තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම කර නොතිබුණි. මෙහි අසාර්ථකත්වය මත කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය වෙත පවරා තිබූ අතර නැවත 2020 අගෝස්තු සිට කර්මාන්ත අමාත්‍යාංශය යටතට පවරා තිබුණි. කෙසේ වුවද ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද මෙතෙක් එය ඉටු නොවී තිබුණු අතර 2017 වර්ෂයේ සිට 2022 අගෝස්තු අවසන් වන විට එනම් වර්ෂ 05කට අධික කාලයක සිට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩල නව බිම ගොඩනැගිල්ලේ මෙම උපකරණ නිශ්කාර්යව හා සමහර භාණ්ඩ මළ බැඳෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ඌ) නව අධිප්‍රේරණ ධාරා උඳුනක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති වාර්තාවට අනුව දශක ගණනාවක් පුරා වාත්තු අංශය විසින් රටා සෑදීම (pattern Marking), අච්චු සෑදීම (Molding), උණු කිරීම (Melting) සහ පර්යේෂණ කිරීම (testing) යන ක්ෂේත්‍රයන් 4 ඔස්සේ ව්‍යවසායකයින්ට පුහුණු වැඩසටහන් පවත්වා ඇති බව සඳහන්ව තිබුණ ද පුහුණු වැඩසටහන් පැවැත්වීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම මත 2021 වර්ෂයේ දී වාත්තු අංශය විසින් එක් පුහුණු වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි.

(එ) 2021 දෙසැම්බර් 31 දිනට රු.97,700,276 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුළ රු.11,819,515ක් 2015 වර්ෂයට පෙර සිට සහ රු.8,036,313ක් 2017 - 2020 අතර වර්ෂ 04ක සිට ඉදිරියට එන ශේෂයන් වූ අතර මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) කාර්මික ජනපද අංශයේ ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කාර්මික ජනපද වලින් ලැබිය යුතු කුලී ආදායම රු.21,853,389ක් වූ අතර අයකර ගැනීමට නොහැකි වූ වසර දෙකකට වඩා පැරණි රු.12,498,476 ක ශේෂ ඒ තුල පැවතිණි.
එසේම මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ජනපද ණයගැති හැර වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය රු.20,111,521 ක් වූ අතර එම ශේෂයෙන් රු.4,111,208 ක් වර්ෂ දෙකකට පෙර සිට ඉදිරියට එන ශේෂයන් විය.

(ඔ) 2021 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයහිමි ශේෂය රු. 86,431,770ක් වූ අතර එම ශේෂයෙන් රු.23,380,208 ක් වර්ෂ දෙකකට පෙර සිට ඉදිරියට එන ශේෂයන් විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) ඇඹිලිපිටිය බහුකාර්ය ගම්මිරිස් සැකසුම් මධ්‍යස්ථානය සඳහා යන්ත්‍ර සහ උපකරණ සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම, සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීම වෙනුවෙන් ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 7ක් අදියර 07ක් යටතේ මණ්ඩලයට ගෙවීමට එකඟව අදාල අමාත්‍යාංශය හා කාර්මික සංවර්ධන මණ්ඩලය 2021 ඔක්තෝබර් 15 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙමඟින් මණ්ඩලයට ලැබෙන මුළු ආදායමෙන් සියයට 40ක් ඉංජිනේරු අංශයේ මෙම සේවාව ලබාදීමට දායක වූ නිලධාරීන් හට ධාරිතා අභිප්‍රේරණ දීමනාවක් (Capacity Motivation Allowance) ලෙස ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව නිලධාරීන් 21 දෙනෙකුට රු.2,933,333ක ආදායමෙන් රු.1,079,467ක දීමනාවක් අදාල අමාත්‍යාංශයේ හෝ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය රහිතව 2021 දෙසැම්බර් මස ගෙවා තිබුණි.

(ක) මණ්ඩලය ස්ථාපිත කර ඇති හෙක්ටයාර් 1.2953 ක පමණ ඉඩම හා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා ඇති අක්කර 13 රූඩ් 03 පර්චස් 34 ක ප්‍රමාණයක ඉඩම්වල අයිතිය මණ්ඩලය සතු කර ගැනීමට නොහැකි වී ඇත. මේ හේතුවෙන් මෙම දේපළ සඳහා විශාල වාණිජ වටිනාකමක් ඇතත් වටිනාකම් ගණනය කර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති භූමියෙහි නව බිම ගොඩනැගිල්ල පිහිටි ඉඩමෙන් 3/4 ක ප්‍රමාණයක පෞද්ගලික ව්‍යාපාර පවත්වාගෙන යෑම සිදුවන අතර ඔවුන්ගෙන් කිසිදු බිම් කුලියක් හෝ ගොඩනැගිලි කුලියක් අයකර ගැනීමට මණ්ඩලය අසමත් වී තිබුණි.

(ග) මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුව ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරි තනතුර කණිෂ්ඨ කළමණාකාර මට්ටමේ තනතුරක් වන නමුත් නඩු තීන්දුවක් පදනම් කරගෙන නිලධාරීන් 52 දෙනෙකු සඳහා ව්‍යාපාර ප්‍රවර්ධන කළමණාකාර වශයෙන් මධ්‍යම කළමණාකාර මට්ටම ලබාදී තිබූ අතර මෙම නිලධාරීන් මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කිරීමේ අනුමැතිය මේ වන විටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි.

(ච) ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 වගන්තිය අනුව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද විගණනයට ලද තොරතුරු අනුව මණ්ඩලය විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂකවරු 05 දෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂකවරු 21දෙනෙකු ඇතුළුව නිලධාරීන් 34 දෙනෙකු වැඩ බැලීමට පත්කර තිබුණි. මෙයින් නිලධාරීන් 10 දෙනෙකු අවුරුදු 2කට වැඩි කාලයක සිට වැඩ බැලීම් කර තිබුණි. මෙම නිලධාරීන් සඳහා 2021 ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු.2,264,189ක් ගෙවා තිබුණි.

(ජ) 2020/02/21 දිනැති මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 01/2020 අංක දරණ වක්‍රලේඛය ප්‍රකාරව සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඒ යටතේ වන සියළුම ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ (PL-1, PL -2 සහ PL -3) දැනට පවතින සියළුම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් නැවත දැනුම් දෙනතුරු අත්හිටුවීමට පියවර ගත යුතු බව සඳහන් වුවත් ආයතනය විසින් කොන්ත්‍රාත් පදනම මත ප්‍රාථමික සේවා ගණයේ 34 දෙනෙකු එනම් (PL-1) 29ක් ද (PL -3) 5 දෙනෙකු සමාලෝචිත වර්ෂය තුලදී බඳවාගෙන තිබුණි.

(ට) 2021 අගෝස්තු 28 දිනැති මුදල් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2 (ii) ඡේදය ප්‍රකාරව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණ ද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබිය යුතුය යනුවෙන් සඳහන් කර තිබුණි. එසේ වුවද ඊට පටහැනිව ආයතනයට නිලධාරීන් 19ක් 2021 සැප්තැම්බර් 01 දින සිට බඳවාගෙන තිබුණි.

(ඩ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව යාන්ත්‍රික ඉංජිනේරු තනතුරු එකක් පමණක් පැවති අතර එය සම්පූර්ණ වී තිබුණි. එසේ තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2021/BM 533/BP/3103 හා සභාපතිවරයාගේ අනුමැතිය මත කොන්ත්‍රාත් පදනමින් තවත් යාන්ත්‍රික ඉංජිනේරුවන් තිදෙනෙකු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් තොරව 2021 අගෝස්තු 25 හා සැප්තැම්බර් 01 හා 02 දිනයන්හි බඳවාගෙන තිබුණි. මෙසේ බඳවා ගත් මෙම නිලධාරීන් සඳහා සභාපතිවරයාගේ අනුමැතියෙන් අනුමත වැටුප් කාණ්ඩයට පරිබාහිරව මසකට රු. 75,000 බැගින් ගෙවීම් කර තිබුණි.

(ත) පැලියගොඩ පිහිටි විද්‍යුත් ලෝහාලේපන මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරි නැමති තනතුර අනුමත කර්ය මණ්ඩලයේ නොතිබුණද සභාපතිවරයාගේ අනුමැතියෙන් එම තනතුර සඳහා නිලධාරියකු 2021 ජූලි 19 දින සිට බඳවා ගෙන අනුමත වැටුප් ඛාණ්ඩයන්ට පරිබාහිරව මසකට රු.62,350 බැගින් ගෙවීම් කර තිබුණි.

(ද) අංක 2021/BM 533/BP/3110 හා 2021/01/27 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත සහකාර අධ්‍යක්ෂවරු 09 දෙනෙකු පළාත් අධ්‍යක්ෂකවරු ලෙස 2021 ඔක්තෝබර් සිට පත්කර තිබුණි. නමුත් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ බඳවා ගැනීමේ පරිපාටිය තුල එවැනි තනතුරක් නොවීය.

(න) 2021 මාර්තු 31 දිනැති අංක 2021/ BM/534/BP/3142 යන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව යටතේ අනුමත කාර්ය මණ්ඩලය තුල නොමැති තනතුරක් වන "මානව සම්පත් කළමනාකරණය සඳහා උපදේශකවරයකු මාස 06ක වැඩ පැවරුම මත 2021 අප්‍රේල් 07 දින බඳවාගෙන තිබුණි. ඒ සඳහා මසකට රු. 110,000 බැගින් වැටුප හා දීමනා ලෙස එකතුව රු.550,000 ක් ගෙවා තිබුණි.

(ප) අනුමත කාර්ය මණ්ඩලයට අනුව සම්භාණ්ඩ අංශයට පුහුණු උපදේශකවරුන් 08 දෙනෙකු සිටිය යුතු වුවද දැනට පුහුණු කටයුතු සිදුකරනු ලබන්නේ වැඩ බලන උපදේශකවරුන් දෙදෙනෙකු විසිනි. 2021 වර්ෂයේදී මෙම අංශයට නව පුහුණු උපදේශකවරුන් තිදෙනෙකු බඳවාගෙන තිබුණ ද ඔවුන් සම්භාණ්ඩ පිළිබඳ පුහුණුවක් නොලද නිලධාරීන් විය. එබැවින් ඔවුන් තිදෙනා වෙනත් අංශයන්හි රාජකාරී සඳහා යොදවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති